àø]×ù µû$÷ &{õæ ûõ (ã&& µû})

13 µÁ ó ×

# බෞද්ධ ශිෂ්ටාචාරය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

**(2010 වර්ෂයේ සිට ක්‍රියාත්මකයි)**


**ආගම් දෙපාර්තමේන්තුව**
**භාෂා ආගම්, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# හැඳින්වීම

වර්ෂ 2007 දී 6 සහ 10 යන ශ්‍රේණිවලට හඳුන්වා දෙන ලද නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්නුම් ප්‍රවේශය ක්‍රමයෙන් වසරින් වසර 7, 8 හා 11 යන ශ්‍රේණිවල විෂය මාලාව සම්බන්ධයෙන් ද යොදා ගන්නා ලද අතර 2009 වසරේදී එය අ.පො.ස (උ/පෙළ) පන්තිවලට අදාළ විෂයමාලාව සම්බන්ධයෙන් ද ව්‍යාප්ත කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකවරුන් සමත් වී තිබේ. එමනිසා 12 හා 13 වන ශ්‍රේණිවල විවිධ විෂය හා අදාළ විෂය නිර්දේශ ද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ද සිසුන් තුළ ප්‍රගුණ කළයුතු නිපුණතා ද නිපුණතා මට්ටම් ද පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කොට තිබේ. මෙම තොරතුරු තම විෂය හා අදාළ ඉගෙනුම් - ඉගැන්නුම් අවස්ථා සම්පාදනයේදී ගුරුවරුන්ට මහත්සේ ප්‍රයෝජනවත්වනු ඇත.

අ.පො.ස (උ.පෙළ) විෂය සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස් කිරීමේ දී විෂයමාලා සම්පාදකවරුන් විසින් කනිෂ්ඨ ද්විතියික විෂයමාලාව හා ජ්‍යෙෂ්ඨ ද්විතියික (10, 11 ශ්‍රේණි) විෂයමාලාව සකසන විට අනුගමනය කොට ඇති ප්‍රවේශයට වඩා වෙනස් වු ප්‍රවේශයක් අනුගමනය කොට ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි. 6, 7, 8, 9, 10 හා 11 යන ශ්‍රේණිවල දී විෂය කරුණු ඉගැන්වීමේ දී අනුගමනය කළයුතු ඉගෙනුම් හා ඉගැන්නුම් ප්‍රවේශ සම්බන්ධයෙන් ගුරුවරුන් අභිමත ආකෘතියකට යොමු කරන ලද මුත් අ.පො.ස (උ.පෙළ) විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සම්පාදනයේ දී ගුරුවරුන්ට තම අභිමතය පරිදි ක්‍රියාකිරීමටත් ප්‍රශස්ත නිදහසක් භුක්ති විදීමටත් ඉඩ ප්‍රස්ථාව සලසා තිබේ. මෙම තලයේ දී ගුරුවරුන්ගෙන් අපේක්ෂා කරනුයේ ඒ ඒ විෂය ඒකකයට හෝ පාඩමට නියමිත නිපුණතා සහ නිපුණතා මට්ටම් වර්ධනය කිරීම පිණිස යෝජිත ඉගැන්නුම් ක්‍රමවලින් තමන් අභිමත ඉගැන්නුම් ක්‍රමයක් යොදා ගැනීම ය. තමන් යොදා ගන්නා ඉගැන්නුම් ප්‍රවේශය සතුටුදායක හා කාර්යක්ෂම ලෙස යොදා ගනිමින් අපේක්ෂිත නිපුණතා හා නිපුණතා මට්ටම් ළගා කර ගැනීම ගුරුවරුන් විසින් නොපිරිහෙළා ඉටු කරනු ලැබිය යුතු ය. මෙම නිදහස ගුරුවරුන්ට ලබා දීමට තීරණය කරන ලද්දේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ඇති වැදගත්කම සහ එම විභාගය කෙරෙහි අධ්‍යාපන පද්ධතියේ සියලු ම අය දක්වන සංවේදී බව සැලකිල්ලට ගෙන බව සටහන් කරනු කැමැත්තෙමි.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන් හට මාහැගි අත්පොතක් වේවායි ප්‍රාර්ථනය කරමි. අපේ දරුවන්ගේ නැණැස පාදන්නට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු ක්‍රමවේද සහ උපදෙස් අපගේ ගුරුවරුන් හට නිසි මගපෙන්වීමක් කරනු ඇතැයි අපේක්ෂා කරමි.

මහාචාර්ය ලාල් පෙරේරා

අධ්‍යක්ෂ ජනරාල්

# සංඥාපනය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2010 වර්ෂයේ සිට 13 වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන්ට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කරගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකි ය. මෙහි දැක්වෙන නිපුණතාවක් එම ශ්‍රේණිය තුළදී ම සාක්ෂාත් කර ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. ඇතැම්විට ඒ සඳහා බොහෝ කලක් ගතවිය හැකි ය. එහෙත් නිපුණතා මට්ටම් හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදී ම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ඔබට ශ්‍රේණියට අදාළ පාඩම් සැළසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම්ඵල බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම්ඵල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන් ම පන්ති කාමරයේ දී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු අතිරේක පොත් පත් මෙන් ම වෙබ් අඩවි පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලී ගුරුවරයෙකු වශයෙන් ක්‍රියා කිරීමේ අපේක්ෂා සහිතව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් සිසුන් විවිධ පොත්පත් පරිශීලනයට අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිට ම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට අකර්ෂණීය ලෙස නව දැනුම මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදාගත් සන්නිවේදන උපක්‍රම භාවිත කිරීම නව පන්තිකාමරය තුළ දී උනන්දු විය යුතු වේ. ඒ සඳහා නව තාක්ෂණික උපකරණ හැකිතාක් දුරට භාවිත කිරීමට නිර්මාණශීලීවීම අවශ්‍ය වේ.

12 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගෙනීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශ මනාව පැහැදිලි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැළැස්ම හඳුන්වා දෙන්නේ නම් එය සිසුන් තුළ පෙළඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දේශය ආවරණය කර ගැනීමට පාසල වෙත සිසුන් ආකර්ෂණය වේ. මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා අදාළ විෂය නිර්දේශය මෙන් ම මෙහි යෝජිත ක්‍රියාවලි ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලී හැකියා පුබුදුවා ගන්නා මෙන් ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශ සැකසීමේ දී දායක වූ විද්වත් සැමට, ගුරුභවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන්ට මගේ ස්තුතිය හිමි වේ. මේ කාර්යය සඳහා මගපෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ලාල් පෙරේරා මැතිඳුන් මෙන් ම මුද්‍රණ කටයුතු සිදුකර පාසල්වලට ලබාදීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්යය මණ්ඩලයට මගේ විශේෂ ස්තුතිය පුද කරමි. මෙහි ඇතුලත් කරුණු පිළිබඳ ව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබාදෙන්නේනම් කෘතඥ වෙමි.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය.

# අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය

රජය මගින් සියලු ම පාසල් සිසු දරුවන් වෙත පාසල් පෙළ පොතේ නොමිලේ ලබා දෙන අතර ම ගුරු භවතුන් වෙත ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ලබා දීම මගින් ගුරු ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායීකර ගැනීම අරමුණ කර ගැනේ.

විෂය නිර්දේශයේ දැක්වෙන නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා සිසුන් මෙහෙයවන නියමුවා වන්නේ ගුරුවරයා ය. එබැවින් එම කාර්යය මැනවින් වටහාගෙන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ පරිශීලනයෙන් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ ව මනා පරිචයක් ලබාගෙන නිපුණතා පාදක කර ගනිමින් ඉගෙනුම් ක්‍රියාවලියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා ආකාරය පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීමේ වගකීම ඔබට පැවරේ.

වර්තමාන ලෝකයේ අභියෝග ජයගත හැකි සිසු පරපුරක් බිහි කිරීමේ භාරදූර කාර්ය භාරයේ නියැලී සිටින ඔබට මෙමගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීමට හැකි වනු ඇතැයි විශ්වාස කරමි.

**ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
2009.07.21

# උපදේශක හා ලේඛක මණ්ඩලය

**මෙහෙයවීම** - මහාචාර්ය ලාල් පෙරේරා මහතා
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

**උපදේශන හා**
**මඟ පෙන්වීම** - විමල් සියඹලාගොඩ මහතා
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** - ආචාර්ය පූජ්‍ය මාබුල්ගොඩ සුමනරතන හිමි
අධ්‍යක්ෂ (ආගම්)
ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය** - පූජ්‍ය ගන්තුනේ අස්සජි හිමි
(බී.ඒ. ගෞරව, එම්.ඒ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ හිටපු කථිකාචාර්ය)
මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි
(බී.ඒ. ගෞරව, එම්.ඒ., පී.එච්.ඩී., කැලණිය විශ්ව විද්‍යාලය )
පූජ්‍ය ආචාර්ය තැරැලේ ධම්මරතන හිමි
(බී.ඒ.ගෞරව, එම්.ඒ., පී.එච්.ඩී, කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය )
පූජ්‍ය උඩුගම සුදස්සි හිමි (ව්‍යාපෘති නිලධාරි)
(ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, අධ්‍යාපනවේදී)
පූජ්‍ය තෙරපැහැ මේධංකර හිමි (සහකාර ව්‍යාපෘති නිලධාරි)
(බී.ඒ ගෞරව, එම්.ඒ., රාජකීය පණ්ඩිත, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා)
ආචාර්ය උදිත ගරුසිංහ මහතා (බී.ඒ.ගෞරව, එම්.ඒ., පී.එච්.ඩී., ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැලණිය විශ්ව විද්‍යාලය)
ගුණසේන මහතන්ත්‍රිගේ මහතා (බී.ඒ.ගෞරව,එම්.ඒ., අධ්‍යාපන ඩිප්ලෝමා අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ)
එස්.පී. විතාන මහතා (ව්‍යාපෘති නිලධාරි)
(බී.ඒ. ,එම්.ඒ. , පශ්. උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා )

**සංස්කරණය** : ආචාර්ය පූජ්‍ය - මාබුල්ගොඩ සුමනරතන හිමි
(බී.ඒ.ගෞරව, පී.එච්.ඩී., අධ්‍යාපන ඩිප්ලෝමා, අධ්‍යක්ෂ ආගම්, ජාතික අධ්‍යාපන ආයතනය)

**පරිගණක වදන් සැකසුම** : පී. නිල්මිණි ප්‍රනාන්දු මිය

**විවිධ සහාය** : එස්. සී. ප්‍රියදර්ශනී මිය
අයි. ජී. බෝජිත මයා

# පටුන

| | පිටුව |
|---|---|
| හැඳින්වීම | iii |
| සංඥාපනය | iv |
| අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන කොමසාරිස්තුමාගේ පණිවුඩය | v |
| උපදේශක හා ලේඛක මණ්ඩලය | vi |
| නිපුණතාව 6.0 | 1 - 13 |
| නිපුණතාව 7.0 | 14 - 32 |
| නිපුණතාව 8.0 | 33 - 40 |
| නිපුණතාව 9.0 | 41 - 53 |
| නිපුණතාව 10.0 | 54 - 64 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය හැඳින්වීම සහ ඉගෙනුම් උපකරණ | 65 - 73 |

**නිපුණතාව 6.0** : බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට චරිත ලක්ෂණ හා උන්වහන්සේ විසින් ගොඩනගන ලද භික්ෂු සමාජයේ සැකැස්ම ගවේෂණය කරමින් එහි රක්ෂණයට හා පෝෂණයට දායක වෙයි.

**නිපුණතා මට්ටම 6.1** : මහා කරුණාව, මහා ප්‍රඥාව හා පෞරුෂය බුද්ධ චරිතයේ සුවිශේෂ ලක්ෂණ ලෙස ගැඹුරින් හදාරමින් බුදුරජාණන් වහන්සේගේ තාදී ගුණය හා පද්මාකාර ජීවිතය ප්‍රකට වන අවස්ථා ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 40

**ඉගෙනුම් ඵල** : අවබෝධයෙන් හා හැඟීමෙන් යුක්තව ප්‍රජා සේවයෙහි යෙදෙයි.
සියලු ප්‍රජාවට සම සිතින් සමකරුණාවෙන් සලකයි.
හැඟීම්වලට වහල් නොවී කටයුතු කරයි.
ප්‍රජානායකත්වය සඳහා අවශ්‍ය පසුබිම සකසා ගැනීමට පෙළඹෙයි.
මනා සිහියෙන් යුතුව කටයුතු කරයි.
වැරදි බැහැරකොට නිවැරදි චර්යාවෙහි හැසිරෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

6.1.1 : **මහා කරුණාව**

- දුක්ඛිතයන්ට පිහිටවීම පිණිස පෙළඹෙන තරමට සාධූන් තුළ ඇතිවන දයානුකම්පාව කරුණාව ලෙස හැඳින්වෙන අතර, එය සතර බ්‍රහ්ම විහරණයන්ගෙන් දෙවැන්න වේ. බුදුවරයෙකුට විශේෂවූ උතුම් ගුණ අතරින් එකකි මහා කරුණාව. එය සමාපත්තියක් ලෙසද වැඩිය හැකිය. එය බුද්ධ ඥාණයක් ද වේ.
- අධර්ම චර්යාව හේතුවෙන් සසර දුකට භාජනය වන්නන් එයින් මුදවා ගැනීම පිණිස පෙළඹෙන තරමට ඇතිවන දයානුකම්පාව මහා කරුණාව ලෙස දැක්වේ.
- කාරුණිකව දුක්ඛිතයන්ට පිහිටවන තැනැත්තා උතුම් බුද්ධ පූජාවක් කරන්නෙකු වේ.
- සුනීත, සෝපාක, රජ්ජුමාලා ආදීන්ට පිහිටවීම මගින් බුදුරජාණන් වහන්සේගේ මහා කාරුණිකත්වය ප්‍රකට වේ.
- බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ දින චර්යාව ආරම්භ කරන්නේ මහා කරුණාවට මුල් තැන ලබා දෙමිනි.

6.1.2 **මහා ප්‍රඥාව**

- විදර්ශනා ඥාණය නොහොත් ලෝකයේ යථාස්වභාවය ඇතිසැටියෙන්ම දක්නා නුවණ ප්‍රඥාව වේ.
- ලෝකය හා ජීවිතය පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ ගැඹුරු නුවණ මහා ප්‍රඥාව ලෙස හැඳින්වේ.
- කිසිදු ආවරණයකින් තොරව අතැඹුලක් සේ සියල්ල දක්නා නුවණ මහා ප්‍රඥාවයි.

- බුද්ධ ශරීරය කොතරම් දුර්වල වුවද උන්වහන්සේගේ ප්‍රඥා ශක්තියෙහි කිසිදු වෙනසක් නොවේයයි බුදුරදුන්ම දේශනා කර ඇත.

- ගැටලු විසදීම්, ප්‍රශ්න වලට පිළිතුර සැපයීම් ආදියෙන්ද බුදුරදුන්ගේ මහා ප්‍රාඥ ව බව පිළිබිඹු වෙයි.
- ත්‍රිවිද්‍යා , අෂ්ට විද්‍යා , උපාය කෞෂල්‍ය ඥාණය, සර්වඥතා ඥාණය, දස බල ඥාණ, අනාවරණ ඥාණ, ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව විවිධාකාරයෙන් දැක්වේ.

- බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව ආදර්ශ කොටගෙන බෞද්ධයෙකුට මෙලොව මෙන්ම පරලොව ද අර්ථවත් ජීවිතයක් ගත කිරීමට සසර දුකින් අත්මිදීමටත් හැකියාව ලැබේ.

6.1.3 ආදර්ශවත් නායකත්වය

- අරමුණ කරා නිසි ලෙස පමුණුවන්නා, හික්මවන්නා යන තේරුම් නායකත්වය යන්නෙහි ඇතුළත් වේ.
- ඉහත කී තේරුම් අනුව බුදුරදුන් උදාර නායකයකු ලෙස හැදින්වීම අතිශයින් යෝග්‍ය වේ.
- අන්තගාමී නොවීම, මැදිහත් පිළිවෙලක් අනුගමනය කිරීම, දේශනා කෞශල්‍යය හා උභය කෞශල්‍යය ඥානය, මහා කරුණාව, මහා ප්‍රඥාව ආගමික සහනශීලිත්වය, ආදිය බුද්ධ චරිතයෙහි උතුම් නායකත්වයට නිදසුන් ලෙස දැක්විය හැකිය.
- බුදුරදුන් වෙත පැවති අසම සම නායකත්ව ලක්ෂණ අතරින් සමහරක් මෙසේ දැක්විය හැකිය.

    - අනුගාමිකයන්ට ආදර්ශ සම්පන්න වීම
    - යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී වීම
    - සුපිරිසිදු චරිතයකින් යුක්ත වීම
    - විමසීමට ප්‍රශ්න කිරීමට ඉඩදීම
    - අනුගාමිකයන්ගේ සුව පහසුව ආදිය ගැන සොයා බැලීම
    - විවේචනවලට බිය නොවී ඕනෑම අභියෝගයකට නොසැලී මුහුණ දීම.
    - අගතිගාමී නොවී සමානාත්මතාවයෙන් යුක්ත වීම
    - සුදුස්සන්ට සුදුසු වගකීම් පැවරීම
    - අනුගාමිකයන්ගේ දක්ෂතා හා ප්‍රවීණතා නිසි ලෙස හැදිනගෙන ඒවා අගය කිරීම

- අනුගාමිකයන් ආරක්ෂා කර ගැනීම
- ගැරහිය යුතු තැන ගැරහීම හා අගය කළ යුතු තැන අගය කිරීම.
- නිවැරදි දැක්මක් හා නිශ්චිත ඉලක්කයක් ඇතිව ක්‍රියා කිරීම
- ආචාරශීලී බව හා නිහතමානි බව.

### 6.1.4 විශිෂ්ට ශාස්තෘත්වය

- ජාති, ජරා,ව්‍යාධි , මරණ ආදියෙන් එතෙර වීමට සත්වයන්ට මග පෙන්වන බැවින් බුදුරජාණන් වහන්සේ ශාස්තෘවරයෙකු ලෙස හැඳින්වේ.
- ගුරුවරයා යන අර්ථයද ශාස්තෘ යන්නෙහි ඇති අතර බුදුරජාණන් වහන්සේ තුන් ලෝකයේම ගුරුවරයා වේ. එබැවින් "තිලෝගුරු" නමින් ද හැඳින්වේ.
- ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ බුද්ධි මට්ටම, මානසික ස්වභාවය, දෘෂ්ටිමය පදනම, සාමාජික පරිසරය ආදිය සැලකිල්ලට ගනිමින් විවිධ පර්යාය අනුගමනය කරමින් උපාය කෞශල්‍යයෙන් යුතුව දහම් දෙසීමෙන් බුදුරජාණන් වහන්සේගේ ශාස්තෘත්වයේ විශිෂ්ටත්වය ප්‍රකට කෙරේ.
- සෘජු දේශනා (දම්සක් පැවතුම් සූත්‍රය) සාකච්ඡා (කන්දරක සූත්‍රය) උපමානුසාර දේශනා (රාහුලෝවාද සූත්‍රය) පැවරුම් (චුල්ලපන්තක, කිසාගෝතමී වැනි අයට) ආදී විවිධ ඉගැන්වීම් ක්‍රම බුදුරදුන් විසින් භාවිතා කොට තිබේ.
- අත්තජ්ඣාසය (තමන් වහන්සේගේ අදහසඅනුව)පරජ්ඣාසය (ශ්‍රාවකයාගේ අපේක්ෂාව)අට්ටුප්පත්තික (අර්ථය පැහැදිලි කිරීම)පුච්ඡාවසික (ප්‍රශ්නයකට පිළිතුරු දීම) යනු තවත් එබඳු දේශනාක්‍රම සතරකි.

- ඒකංස ව්‍යාකරණීය (සෘජු පිළිතුරු සැපයීම) විභජ්ජ ව්‍යාකරණීය (විග්‍රහකොට පිළිතුරු දීම) පටිපුච්ඡා ව්‍යාකරණීය ( ප්‍රති ප්‍රශ්න විමසා විසඳීම) ඨපනීය (පසෙකින් තැබීම) යන ක්‍රම සතරින් බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන්ගේ ප්‍රශ්න විසඳූහ.
- සදහම් අසා තුනුරුවන් සරණ ගිය ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ ප්‍රකාශන වලින් සහ බුදුරදුන් පිළිබඳ කීර්ති ශබ්දය පැන නැගුණු ආකාරය පැවසෙන වචන වලින් ද උන්වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය හෙළිවේ.
- බුදුරජාණන් වහන්සේ මිනිසුන්ගේ පමණක් නොව දෙවියන්ගේ ද ශාස්තෘවරයාය. (සත්ථා දේව මනුස්සානං)

- මග්ගඤ්ඤූ මග්ග විදූ (මාර්ගය දන්නා) මග්ග කෝවිදෝ (මාර්ගයෙහි දක්ෂ) උතුමෙකු ලෙස ද උන්වහන්සේ හැඳින්වේ.

- නිදහස් චින්තනයට හා විමංසනයට ඉඩදීම, යථාවාදි තථාකාර ලක්ෂණය , අන්‍ය ආගම් කෙරෙහි සුහද ආකල්පය, පුද්ගල ස්වාමිත්වය තම විමුක්තිය තමාටම පවරා දීම, දේශන කුසලතාව , කරුණාව, මෛත්‍රිය, ඉවසීම, තාදි ගුණය, ගුරු මුෂ්ටි තබා නොගෙන ශ්‍රාවකයන්ට කරුණු දැක්වීම ආදිය බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය ප්‍රකට කරන අවස්ථා වේ.

### 6.1.5 තාදී ගුණය

- තාදී ගුණය නම් අෂ්ට ලෝක ධර්මයට අකම්පිතව මුහුණදෙන ස්වභාවයයි.
- බමුණු පඩිවරයෙකු වූ සේල, ගෘහපතියෙකු වූ උපාලි, ඇතරුවකු වූ පෙස්ස වැන්නවුන් බුදුරදුන්ට ප්‍රශංසා කළ අවස්ථාවන්හිදී උදම් නොවීම බුදුරදුන්ගේ තාදී ගුණයට නිදසුන් වේ.
- තවද අග්ගිකභාරද්වාජ බ්‍රාහ්මණයා, මාගන්ධියා බැමිණිය, චිංචිමානවිකාව,සුන්දරී පරිබ්‍රාජිකාව, අක්කෝසක භාරද්වාජ බ්‍රාහ්මණයා වැන්නවුන්ගේ අක්‍රෝශ පරිභව, නින්දා අපහාස හමුවේ අකම්පිතව ක්‍රියා කිරීම ද බුදු සිරිතේ තාදි ගුණයට නිදසුන් ලෙස දැක්විය හැකිය.
- කොසොල් රජුගෙන් අසදෘස මහා දානය ලැබුණ විට උද්දාමයට පත් නොවීමෙන් ද වේරඤ්ජාවේ දී යව ආහාර දානයට ලැබුණ විට කම්පාවට පත් නොවීමෙන් ද බුදුරදුන්ගේ තාදී ගුණය ප්‍රකට වේ.
- උන්වහන්සේ දෙව්දත් තෙරුන් වැන්නවුන්ගේ සතුරුකම් හමුවේ කම්පාවටත් අනේපිඩු සිටු, විශාඛා උපාසිකා වැන්නවුන්ගේ සත්කාර හමුවේ උද්දාමයටත් පත් නොවූ සේක.
- අපගේ ජීවිත හැඩගස්වා ගැනීමේදී මෙන් ම සමාජ ගතවීමේදී ද අපට බලපාන යම් යම් කරුණු දැන ඒවා උපේක්ෂාවෙන් විඳ දරා ගැනීමට බුදුරජාණන් වහන්සේගේ තාදී ගුණය ආදර්ශ කොට ගත හැකි වේ.

6.1.6 **පද්මාකාර ජීවිතය**

- පද්මාකාර ජීවිතය නම් මඩ දියෙහි නොතැවරී පවිත්‍රව විකසිත වන නෙළුමක් මෙන් දුසිරිතෙන් පිරි සමාජයක පිරිසිදු ජීවිතයක් ගත කිරීමයි.
- ද්‍රෝණ බමුණා සහ බුදුරජාණන් වහන්සේ අතර ඇතිවූ සාකච්ඡාව තුළින් බුදුරජාණන් වහන්සේ පද්මාකාර ජීවිතය හෙළිවේ.
- මාර දුහිතෘන්, මාගන්දියා ආදීන්ගේ පෙළඹවීම් හමුවේ විරාගික වීම, ආලවක, අග්ගික භාරද්වාජ, අක්කෝසක භාරද්වාජ ආදී කෝප වන්නන් හමුවේ කෝප නොවීම ආදියෙන් බුදුරදුන්ගේ පද්මාකාර ජීවිතය ප්‍රකට වේ.
- බුදු සිරිතේ පද්මාකාර පැවැත්ම ආදර්ශයට ගෙන වැරදි බහුල සමාජයෙහි නිවැරදි ජීවිතයක් ගත කිරීමට අපට ද හැකි වෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

1. පියවර - විවිධ හේතූන් නිසා පීඩාවටත් පුද්ගලයන් පිළිබඳ ජායාරූප එකතුවක් සිසුන්ට ප්‍රදර්ශනය කර ඒවා දැකීම නිසා ඇතිවන සිතුවිලි කවරාකාරදැයි විමසන්න. ඒ තොරතුරු පාදක කරගෙන කරුණාව හඳුන්වා දෙන්න.

2 පියවර - බුදු සිරිතේ මහා කරුණාව ප්‍රකට වන අවස්ථා ලේඛනගත කරන්නට සහ වාචිකව ඉදිරිපත් කරන්නට සිසුන් යොමු කරන්න.

3 පියවර - 2 පියවරේදී සිසුන් ලේඛනගත කරන ලද හා සිසුන් වාචිකව ඉදිරිපත් කළ අදහස් සමාලෝචනය කරමින් විෂය දැනුම සංවර්ධනයට පියවර ගන්න.

පැවරුම : බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාව ප්‍රකට වන අවස්ථා උදාහරණ සහිතව ලේඛන ගත කොට පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

මූලාශ්‍රය : මහා සකුළුදායී සූත්‍රය - මජ්ඣිම නිකාය
මහා සීහනාද සූත්‍රය - මජ්ඣිම නිකාය
වීමංසක සූත්‍රය - මජ්ඣිම නිකාය
චූල ගෝසිංග සූත්‍රය - මජ්ඣිම නිකාය
උපාලි සූත්‍රය - මජ්ඣිම නිකාය
කන්දරක සූත්‍රය - මජ්ඣිම නිකාය
සම්පසාදනීය සූත්‍රය - (දීඝ නිකාය)
බුද්ධ වග්ගය - ධම්මපදය (ඛුද්දක නිකාය)
සේල සූත්‍රය - (සුත්ත නිපාතය)
වසල සූත්‍රය - (සූතත නිපාතය)
දෝණ සූත්‍රය - (අංගුත්තර නිකාය)
කුමාර කස්සප මාතා කථා වස්තුව - ධම්මපදට්ඨ කථා
ඒතදග්ග පාලිය - අංගුත්තර නිකාය
චිංචාමානවිකා හා සුන්දරී පරිබ්‍රාජිකා කථා වස්තුව - ධම්මපදට්ඨ කථා
මංගල සූත්‍රය - සුත්ත නිපාතය
බුදුහාමුදුරුවෝ - ගණේගම සරණංකර හිමි
බුදුන් දැකීම - සෙනෙවිරත්න මහලේකම

**නිපුණතා මට්ටම 6.2** : නිදහස් චින්තනය, ආගමික සහන ශීලී බව හා බුදුරජාණන් වහන්සේ පිළිබඳ තත්කාලීන ඇගයීම් විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 14

**ඉගෙනුම් ඵල** :

- සහජීවනයෙන් කටයුතු කරයි.
- අන්‍ය ආගම් කෙරෙහි සහනශීලි ප්‍රතිපත්තියක් අනුගමනය කරයි.
- බුද්ධ ගෞරවය සහ ධර්ම ගෞරවය ඇති කරගෙන ප්‍රතිපත්ති ගරුකව කටයුතු කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් 6.2.1** : නිදහස් චින්තනය සහ ආගමික සහනශීල බව

- යමක් පිළිගැනීමේදී හෝ ප්‍රතික්ෂේප කිරීමේදී එය කළ යුත්තේ නිදහස්ව සිතා විමසා බැලීමෙන් අනතුරුව බව බුදුරදුන් දේශනා කර ඇත.
- නිදහස් චින්තනය යනු වගකීමෙන් තොරවූවක් නොවන බැවින් සිතා විමසා ගන්නා නිගමන පිළිබඳවද සලකා බලන ලෙස අවධාරණය කරමින් බුද්ධ දේශනාව කරුණු දක්වයි. නුවණැතියන්ගේ අදහස්, එම නිගමන අනුව ක්‍රියා කිරීමෙන් අත්වන ප්‍රතිඵල ආදිය ගැනද සලකා බැලීමේ අවශ්‍යතාව අවධාරණය වී ඇත.
- බුදුරදුන් අන්‍යාගමික ආරාමවලට වැඩමකර එම ආගමිකයන් සමග සාකච්ඡා කිරීම උන්වහන්සේගේ ආගමික සහනශීලතාව ප්‍රකට කරන ප්‍රබල අවස්ථාවක් වේ.
- අන්‍යාගමිකයන් සමග වාද විවාද කිරීමේ අවශ්‍යතාවක් බුදුරදුන්ට නොවූ අතර වාද විවාද සඳහා පැමිණි අයට මෛත්‍රියෙන් යුතුව කරුණු පැහැදිලි කර දී ඇත.
- අන්‍යාගමිකයන්ට ලැබෙන දානමානාදිය වැළැක්වීමට බුදුරදුන් ක්‍රියා නොකළ අතර, පවත්වාගෙන ආපිළිවෙලටම ඒ ඒ වතාවත් ඉටුකරන ලෙස උපදෙස් දී ඇත.
- අන්‍යාගමිකයන්ට දහම් දෙසුයේ ඔවුන් තම අනුගාමිකයන් කර ගැනීමට නොව ඔවුන්ට සත්‍ය පැහැදිලි කර දීමට මිස කවර හේතුවක් නිසාවත් ඔවුන් අපහසුතාවයට පත්කරන අදහසින් නොවේ.
- අන්‍යාගමික ඉගැන්වීම්වල යම් වරදක් ඇතොත් ඒවා පෙන්වාදීම, විචාරයට ලක් කිරීම ආගමික සහනශීලතාවට බාධාවකැයි බුදුරදුන් නොසැලකූ බව ද පෙනේ.
- බහු ආගමික සමාජයක සුහදව හා විචාරශීලීව ජීවත්වීමට බුදු සිරිත ආදර්ශ කොට ගත හැකි අතර සමාජ ප්‍රගතිය උදෙසා වරද නිවරද කිරීම තුළින් අනුගාමිකයන් දැනුවත් භාවයට පත් කිරීම අපේක්ෂා කෙරේ.

- පුද්ගලයාගේ අයිතිවාසිකම් තහවුරු වන පරිදි හා සුරැකෙන පරිදි කටයුතු සිදු කිරීමේ වැදගත්කම බුදුරදුන් පෙන්වා දී ඇති අතර, එමගින් මානව චින්තනය ප්‍රභාමත්වන බව ද දක්වා ඇත.

- බුද්ධ දේශනා සියල්ලක්ම සිතීමට හා විමසීමට පුද්ගලයා යොමු කරන ඉගැන්වීම් වේ. දහම් ගුණ පාඨයේ සඳහන් “ඒහි පස්සිකෝ ” යන “ එව බලව ” යන්නෙන් දහමෙහි විවෘත බව තහවුරු කර ඇත.

6.2.2 බුදුරජාණන් වහන්සේ පිළිබඳ තත්කාලීන ඇගයීම්

- බුදුරජාණන් වහන්සේගේ චරිතය පුරාම උන්වහන්සේගේ සුවිශේෂ ගුණාංගයන් විවිධ අවස්ථාවල විවිධ පුද්ගලයන් අතින් අගය කිරීමට ලක්වී ඇත. විශේෂයෙන්ම දේශනා අවසානයේ එම දේශනය ශ්‍රවණය කළ ශ්‍රාවකයාගේ හෝ උපාසක භාවයට පත් අයගේ ප්‍රශංසා බොහෝ සූත්‍රවල අවසානයට එකතු වී ඇත.
- සෝණ දණ්ඩ වැනි බ්‍රාහ්මණයන් විසින් බුදුරදුන් ඇගයීමට ලක් කරන ලදී.
- පොට්ඨපාද, සකුළුදායි , පිලෝතික වැනි පිරිවැජියන්ගේ ඇගයීමට ද බුදුරදුන් ලක්වී ඇත.

- සැරියුත් මහ රහතන් වහන්සේ , මහා ප්‍රජාපතී ගෝතමී තෙරණින් වහන්සේ වැනි ශ්‍රාවක ශ්‍රාවිකාවන් බුදුරදුන්ගේ ගුණ වර්ණනා කළ අවස්ථා බොහෝය.
- කොසොල් රජු , උපාලි ගෘහපති වැනි අයද බුදුගුණ අගය කළවුන් අතර ප්‍රධාන වේ.

| | | |
|---|---|---|
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය | : | 1 පියවර - ආගම් පිළිබඳව විමසීමක් කර වර්තමාන ලෝකයේ පවතින ආගම් පිළිබඳව හා ඒවායේ ශාස්තෘවරුන් හඳුන්වා දෙන්න.<br><br>2 පියවර - එම ආගම්වල අන්තර්ගතය පිළිබඳව සාමාන්‍ය දැනුම විමසන්න. පැහැදිලි කළ යුතු තැන් වෙතොත් පැහැදිලි කර දෙන්න.<br>3 පියවර - බුදුරජාණන් වහන්සේ හා අන්‍ය ආගමික ශාස්තෘවරුන් පිළිබඳව සංසන්දනාත්මකව කරුණු පැහැදිලි කර බුදුරදුන්ගේ ශ්‍රේෂ්ඨත්වය මතුකොට දක්වන්න.<br><br>පැවරුම: බුද්ධ චරිතයේ විශිෂ්ට ලක්ෂණ ප්‍රකට කෙරෙන මූලාශ්‍රය භාවිත කරමින්, එම ලක්ෂණ ඇතුළත් වූ පොත් පිංචක් නිර්මාණය කරන්න. |
| මූලාශ්‍රය | : | කාලාම සූත්‍රය ( අංගුත්තර නිකාය)<br>උපාලි සූත්‍රය ( මජ්ඣිම නිකාය)<br>පොට්ඨපාද සූත්‍රය ( දීඝ නිකාය)<br>චූල සකුළුදායී සූත්‍රය ( මජ්ඣිම නිකාය)<br>උදුම්බරික සීහනාද සූත්‍රය ( දීඝ නිකාය)<br>සෝණ දණ්ඩ සූත්‍රය ( දීඝ නිකාය)<br>චූල්ලහත්ථි පදෝපම සූත්‍රය ( මජ්ඣිම නිකාය)<br>සම්පසාදනීය සූත්‍රය ( දීඝ නිකාය)<br>අභයරාජ කුමාර සූත්‍රය (මජ්ඣිම නිකාය)<br>ධම්ම චේතිය සූත්‍රය (මජ්ඣිම නිකාය) |

**නිපුණතා මට්ටම 6.3** : බෞද්ධ භික්ෂු සමාජයේ ආරම්භය , සංවර්ධනය හා පාලන සංවිධානය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 28

**ඉගෙනුම් ඵල** :

- භික්ෂු සමාජයේ උත්තරීතර බව තේරුම්ගෙන කටයුතු කරයි.
- ශාසනික සම්ප්‍රදාය උල්ලංඝනය නොකරයි.
- ශාසනික සම්ප්‍රදායන්හි වටිනාකම අවබෝධ කරගෙන ක්‍රියා කරයි.
- භික්ෂූන් වහන්සේලාගේ ශාසනික අවශ්‍යතාවයන් ඉටුකර දෙමින් ශාසන උන්නතියට කැපවීමෙන් ක්‍රියා කරයි.
- භික්ෂූන් වහන්සේ ආදර්ශයට ගෙන ධාර්මික ජීවිතයක් ගත කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

6.3.1 : භික්ෂු සමාජයේ ආරම්භය

- බුද්ධ කාලීන භාරතයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණ යැයි ප්‍රධාන පැවිදි සම්ප්‍රදාය දෙකක් පැවතිණ.
- වේද, බ්‍රාහ්මණ , ආරණ්‍යක, උපනිෂද් යුගයන්ගෙන් ආරණ්‍යයක යුගය අවසානයේ මෙන්ම, උපනිෂද් යුගය තුළ මෙම ශ්‍රමණ සම්ප්‍රදාය ක්‍රියාත්මක විය. වේද බ්‍රාහ්මණ යුගවල බ්‍රාහ්මණ සම්ප්‍රදායද, ආරණ්‍යක උපනිෂද් යුගවල ශ්‍රමණ සම්ප්‍රදාය ද ඉදිරියට පැමිණ තිබුණි.
- ජටිල, ආජීවක, අචේලක, නිගණ්ඨ, පරිබ්‍රාජක ආදී ශ්‍රමණ ගුරුකුල බාහිරක ශ්‍රමණ සංස්ථාව වශයෙනුත්, බුදුරජාණන් වහන්සේ ඇතිකළ ශ්‍රමණ සම්ප්‍රදාය ශාක්‍ය පුත්‍ර ශ්‍රමණ සංස්ථාව වශයෙනුත් හැඳින්විය හැකිය.
- බාහිරක ශ්‍රමණ සම්ප්‍රදායයේ බිහිවීම, බ්‍රාහ්මණ ක්‍රියාකාරකම් වලට ප්‍රතිචාර වශයෙන් සිදුවී ඇත.
- බාහිරක ශ්‍රමණ සම්ප්‍රදායේ යම් යම් ආභාසයන් ද ඇතිව බෞද්ධ පැවිද්ද සංවිධානාත්මකව සුවිශේෂී මුහුණුවරකින් සකස් විය.
- බෞද්ධ පැවිද්දේ සුවිශේෂී අපේක්ෂාව වන්නේ නිර්වාණය සාක්ෂාත් කර ගැනීමයි. ඒ බව "සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාණ සච්ඡි කරණත්ථාය ..........." යන පැවිද්ද ඉල්ලීමේ පාඨයෙන් පැහැදිලි වේ.
- කාමසුඛල්ලිකානුයෝගයත්, අත්තකිලමතානුයෝගයත්, බැහැර කොට මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීම බෞද්ධ පැවිද්දේ විශේෂ ලක්ෂණය විය.

- චාම්, සරල, අල්පේච්ඡ පැවැත්ම හා ඊට අදාළ වූ හිස මුඩු කිරීම, කාෂාය වස්ත්‍ර දැරීම, චාරිකා චරණය, පිණ්ඩපාතී වීම, ආදී බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායේ විශේෂ ලක්ෂණ විය.
- එසේ සුවිශේෂ පරමාර්ථ, ප්‍රතිපත්ති හා ලක්ෂණ ද සහිතව බෞද්ධ පැවිද්ද විකාශය වූයේය.

## 6.3.2 **භික්ෂු සමාජයේ ව්‍යාප්තිය**

- පස්වග තවුසන් "ඒහි භික්ඛු පබ්බජ්ජාවෙන් " පැවිදි කිරීමෙන් පළමුවන භික්ෂු පිරිස ඇතිවිය. යස කුල පුත්‍ර විමල, සුබාහු, පුණ්ණජි, ගවම්පති යන ඔහුගේ ප්‍රධාන මිතුරන් සිව් දෙනාත් , අවශේෂ පනහක් වූ පිරිසක් දෙවනුව ශාසන උරුමය ලබා ගැනීම තුළින් භික්ෂු පිරිස (රහතන් වහන්සේලා) හැට නමක් තෙක් වර්ධනය විය.
- බුදුරදුන් විසින් පළමුව මේ රහත් සැටනම ධර්මදූත මෙහෙවරෙහි යොදවන ලදී.
- දෙවනුව භද්ද වග්ගීය කුමාරවරුන් තිස් දෙනා පැවිදි වීමෙන් අනතුරුව ඔවුන් ද ධර්ම දූත මෙහෙවරට යොදවා ගනු ලැබිණ.
- මුල් යුගයේ උරුවෙල් දනව් වැසිවූ උරුවෙල කාශ්‍යප, ගයා කාශ්‍යප, නදී කාශ්‍යප නම් වූ තුන් බෑ ජටිලයන් හා ඔවුන්ගේ පිරිස එක් දහසක් පැවිදිවීම මත විශාල ශ්‍රාවක පිරිසක් බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය තුළ ඇති විය.
- තවද ප්‍රථම ධර්ම දූත පිරිසටම අයත් වූ අස්සජි මහ රහතන් වහන්සේගෙන් දහම් ඇසූ උපතිස්ස පරිබ්‍රාජකයාත් , අනතුරුව ඔහුගේ මිත්‍ර කෝලිත පරිබ්‍රාජකයාත් සමග අතවැසි දෙසිය පනස් දෙනෙකු බුදුරදුන් සමීපයේ පැවිද්දට පත්වූහ.
- කිඹුල්වත් නුවරින් රජගහනුවරට ගිය සුදොවුන් රජුගේ ඇමැතිවරු දස දෙනාට එක් අයෙකුගේ පිරිස එක් දහස බැගින් වූ අතර මේ දස දහස් දහ දෙනාද බුදු සසුනේ භික්ෂුභාවය ලබා ගැනීම නිසා සුළු කාලයක් තුළ බෞද්ධ භික්ෂු සංස්ථාව සීඝ්‍ර වර්ධනයකට ලක්විය.
- ආරම්භක යුගයේ විමුක්තියම ඉලක්ක කොටගත් සරල භික්ෂු ජීවිත ගත කොට ඇත.
- බුදුරදුන් ධරමාන අවධියේ ම දේශය කාලය අනුව, පැවිද්ද පිළිබඳ බුද්ධ නියමයන් විටින් විට වෙනස් වෙමින් විකාශයට ලක් වූ බව ද මූලාශ්‍රය තුළින් පෙනේ.

### 6.3.3 පැවිද්ද හා උපසම්පදාව

- බුදු දහම අනුව පැවිද්ද යනු ගිහි ජීවිතයට අදාළ සියල්ල අතහැරීමය. මහත් වූ හෝ කුඩා වූ හෝ භෝග සම්පත් ද ඥාති පිරිස ද හැරපියා ගිහි ගෙදරින් ඉවත් වීමෙන් පැවිද්ද ඇරඹේ.

- භික්ෂුව යනු "සිදුණු බිදුණු වස්ත්‍ර දරන්නාය. " "එනම් සිවුරු දරන්නාය. " "භික්ෂුව යනු ගමෙහි පිඩු පිනිස හැසිරෙන්නාය. " "භික්ෂුව යනු සසර බිය දකින්නාය."
- බෞද්ධ පැවිද්ද සාමණේර/ උපසම්පදා යයි දෙයාකාර වේ. වගකීම් සහිත උපසම්පදා පැවිද්ද සඳහා පුහුණුව ලබන පැවිද්දා සාමණේර නම් වේ. එබැවින් ශ්‍රමණයාගේ පුත්‍රයා යනුවෙන් ද හැඳින්වේ.

- "උපසම්පදාව යනු වගකීම් සහිත නියම භික්ෂුත්වයට එළඹීමයි. " "සාමණේර බවින් ඔසවා තැබීම " "මහණ මහළු පැවිද්ද " "අධිශීලයට පත්වීම " උපසම්පදාව නම් වේ.
- ආරම්භයේදී පැවිදි කරන ලද්දේද උපසම්පදා කරන ලද්දේ ද බුදුරදුන් විසින්මය. එය "ඒහි භික්ඛු පැවිදි උපසම්පදාව නම් වේ." පසුව ඇතිවූ ගැටලු නිසා භික්ෂූන්ටම ඒ ඒ දිසා වලදී, ඒ ඒ ජනපද වලදී පැවිදි උපසම්පදා කිරීමට අනු දන්නා ලදී.
- බුද්ධ නියමය අනුව මුලදී සරණාගමන පැවිද්ද සිදුවිය. පසුව පැවිද්දට දස සිඛ , දස පරිජ, දස නාසනා ආදිය එක්විය. එසේම "ඤත්තිචතුත්තකම්ම" ක්‍රමයද ඇතුලත්ව උපසම්පදා ක්‍රම අටක් භාවිතා වී ඇත.
- මුල් යුගයේදී පැවිද්ද ද මාපිය අවසරය අවශ්‍ය නොවීය. වයස් සීමා නොවීය. නියමිත ආචාර්ය උපාධ්‍යායවරුද නොවූහ. පසුව උපන් ගැටලු නිසා ඒ සියල්ල අනුදන්නා ලදී.
- ආරම්භයේදී ඕනෑම අයෙකුට පැවිද්ද ලැබිණ. පසුව සීමා පනවන ලදී. විවිධ ආබාධ ඇත්තවුන්, ශාරීරික ඌනතා ඇත්තවුන්, නොයෙක් අපචාර කළවුන් පැවිදි නොකළ යුතුය යයි නියම කෙරිණ. මේ සියල්ල සිදුවූයේ කලින් කල උපන් ගැටලු හේතුවෙනි.
- මුලදී උපසම්පදාවටද වයස් සීමාව හෝ පූර්ව අවශ්‍යතා නොවීය. පසුව උපතින් විසි වයස් නොවූ, අවශ්‍යතා සම්පූර්ණ නොකළ විවිධ ඌනතා සහිත පුද්ගලයන් උපසම්පදා නොකළ යුතුයයි පනවන ලදී.
- උපසම්පදා භික්ෂුවකට අදාළ කළයුතු දේ හෙවත් වගකීම් චුල්ලවග්ග මහාවග්ග ආදී විනය මූලාශ්‍රය වල දැක්වේ. නොකළ යුතුදේ පාරාජිකා පාලි, පාචිත්තිය පාලි, ආදියෙහි දැක්වේ.
- ප්‍රාතිමෝක්ෂ අනුව උපසපන් භික්ෂුවකට අදාළ විනය ශික්ෂා (සප්ත අධිකරණ සමථ හැර) දෙසිය විස්සකි (220) භික්ෂුණියකට අදාළ ශික්ෂා 304 කි.

### 6.3.4 **වස් විසීම, උපෝසථය සහ පවාරණය**

- වස්සාවාසයේ ආරම්භය, අන්‍ය සාමයික ආභාෂය හා බුද්ධ ශාසනය ආශ්‍රිත පසුකාලීන තත්ත්වයන් ද සාමාජික අවශ්‍යතාවන්ද අනුව සිදුවිය.
- වස්සාන, ගිම්හාන, හේමන්ත නමින් වූ ශාසනික ව්‍යවහාරයෙහි එන ඍතු තුන අතරින් වස්සාන සමය සංචාරක ජීවිත ගත කළ භික්ෂූන්ට ඉතා දුෂ්කර කාල වකවානුවක් විය. ඒ අනුව වස් විසීම අනුදක්නා ලදී.
- උග්‍ර තාපස චර්යා ප්‍රගුණ කල ශ්‍රමණ කණ්ඩායම් , විශේෂයෙන් ජෛන පැවිද්දන් වර්ෂා කාලය තුළ සංචාරක ජීවිත අතහැර ආරාමිකව වාසය කොට ඇත. බෞද්ධ භික්ෂූන් ද එම පිළිවෙත අනුව ක්‍රියා කළ යුතුයයි මහජනයා විසින් කරන ලද ඉල්ලීම බුදුරදුන් විසින් පිළිගන්නා ලදී.
- භික්ෂුවගේ සනීපාරක්ෂාව, ප්‍රත්‍ය පහසුව ආදී වූ ශික්ෂාකාමිත්වය ගැනද සලකා වස් විසීමට අදාළ නියමයන් පනවන ලදී.

- ඇසල අව පැලවිය දින වස් සමාදන්වන උපසම්පදා භික්ෂුව වප්පුර පසළොස්වක පෝදා වස් පවාරණය කරයි. මේ කාලය තුළ එකම ආරාමයක වැඩ සිටින උන්වහන්සේ දායක කාරකාදීන්ගේ ආගමික කාර්යයන්ට සහාය වන අතර, තමාගේ ශාසනික ජීවිතය වර්ධනය කරගන්නට ද අවශ්‍ය පසුබිම සකසා ගනිති.
- වස් සමාදන්වීම, වස් පවාරණය, දායක පක්ෂය මගින් සංවිධානය කරන කඨින චීවර පූජාව, පිළිබඳ බොහෝ ශාසනික නියමයන් පනවා තිබේ.
- අදාළ ශික්ෂාපදවලට යටත්ව වස්සාවාසයෙහි අරමුණු හා කාර්ය සංසිද්ධිය ක්‍රමානුකූලව විකාශය විය.
- බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනය පැවැත්වූ ඇසල පුර පසළොස්වක දින ඉක්ම ඇසල අවපැලවිය දා තමන් වහන්සේ පමණක් වස් සමාදන්වීම සිදු කර ඇත.
- එමෙන්ම උපෝසථය හා පවාරණයට අදාළ ශික්ෂා, කාර්ය සංසිද්ධිය පිළිබඳ සංවර්ධනය මැත අවදිය දක්වා ම සිදුවී තිබේ.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය** :

පියවර 1 : කුල දරුවකු පැවිදි කෙරෙන අවස්ථාවක් හා සාමණේර නමක් උපසම්පදා කෙරෙන අවස්ථාවක් ඇතුළත් වීඩියෝ දර්ශනයක් සිසුන් වෙත ප්‍රදර්ශනය කරන්න.

පියවර 2 : ඉදිරිපත් කළ අවස්ථා පිළිබඳව ශිෂ්‍යයන් විමසා සාමණේර පැවිද්දේ හා උපසම්පදාවේ වෙනස සාකච්ජා කරන්න.

පියවර 3 : උපසම්පදා භික්ෂුවක් වස් සමාදන්වීමේ අයිතිවාසිකම ලබන බවත්, සිසුන් පැවිදි කිරීමේ වගකීම ලැබෙන්නේ ඉන් අනතුරුව බවත් සිසුන්ට පැහැදිලි කරන්න.

පියවර 4 : අනතුරුව සිසුන් සමග පාඩම ගැන සාකච්ජා කරන්න.

පැවරුම : පැවිදි කිරීමේ පිංකමක් නිරීක්ෂණය කොට වාර්තාවක් ලියන්න.

**මූලාශ්‍රය** :

මහා බන්ධකය (මහාවග්ග පාලිය)
බන්ධක විනය ( හේන්පිටගෙදර ඤාණසීහ හිමි)
භික්ෂු සමාජය ( දේවාලේගම මේධානන්ද හිමි)
ශාසනාවතරණය ( රේරුකානේ චන්දවිමල හිමි)
උපසම්පදා ශීලය ( රේරුකානේ චන්දවිමල හිමි)
විනය කර්ම පොත( රේරුකානේ චන්දවිමල හිමි)
ප්‍රාතිමෝක්ෂ විවරණය ( බුජ්ජම්පොල ධම්මපරායන තිස්ස හිමි)

**නිපුණතාව 7.0** : බුදුරදුන් ධරමාන අවධියේ සිට කණිෂ්ක රාජ්‍ය සමය දක්වා බෞද්ධ ඉතිහාසය හා ක්‍රියාකාරකම් විමසමින් ශාසන සංරක්ෂණයට යොමුවෙයි.

**නිපුණතා මට්ටම 7.1** : බුද්ධ කාලීන ධර්මදූත සේවය විමර්ශනයට ලක් කරමින් ථෙරවාද ධර්ම සංගායනා තුන අධ්‍යයනය කොට ශාසන සංරක්ෂණය සඳහා සැලසුම් සකස් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 42

**ඉගෙනුම් ඵල** :

1. ශාසන චිරස්ථිතිය සඳහා ක්‍රියා කරයි.
2. සාමූහිකව , අවබෝධයෙන් යුතුව කටයුතු කරයි.
3. ගැටලු විසඳා ගැනීම සඳහා ගතයුතු නිවැරදි ක්‍රියාමාර්ග තේරුම් ගනියි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

7.1.1 : බුද්ධ කාලීන ධර්ම දූත සේවා

- ප්‍රථම රහත් හැටනම අමතා බුදුරදුන් වදාළ “චරථ භික්ඛවේ චාරිකං .... යනාදී” ප්‍රකාශයත් සමග බෞද්ධ ධර්ම දූත සේවාව ඇරඹේ.
- එම ප්‍රකාශයෙන් පැහැදිලි වන පරිදි බොහෝ ජනයාගේ හිතසුව සලසමින් දෙවියන්ට පවා යහපතක් වන පරිදි වඩාත් පුළුල්ව මුල,මැද, අග යහපත් වු අර්ථ ව්‍යංජන සහිත වූ ධර්මදූත සේවාවක් ඇති කිරීම බුදුරදුන්ගේ අපේක්ෂාව විය.
- ඒ අනුව වඩාත් සංවිධානාත්මකව, ප්‍රජානුකම්පාවෙන් යුතුව, දුෂ්කරතා විඳ දරා ගනිමින් කැපවීමෙන් ධර්මය ප්‍රචාරය කිරීමට ශ්‍රාවකයෝ ආරම්භයේ සිටම යොමු වූහ.
- සූත්‍ර පිටකය තුළ බුද්ධ භාෂිත මෙන්ම ශ්‍රාවක භාෂිත ද දක්නට ලැබේ. එයින් පැහැදිලි වන්නේ බුදුරදුන් මෙන්ම සැරියුත් මුගලන් , ආනන්ද මන්තානිපුත්ත ආදී ධර්ම විනයධර ජ්‍යෙෂ්ඨ ශ්‍රාවකයන්ද ධර්ම දූත සේවාවේ විශාල කාර්යභාරයක් ඉටුකළ බවය.
- භික්ෂුණීන් වහන්සේලාද බුදුරදුන්ගේ මඟ පෙන්වීම ඇතිව සිදුකළ ධර්ම දේශනා සූත්‍ර පිටකයෙහි හමුවේ. ඒ අතර සෙලා, වජිරා, සෝමා, වැනි භික්ෂුන්ගේ දේශනා වඩාත් ප්‍රකටයි.
- සමකාලීනව පැවති සාමයික පරිසරය තුළ බමුණු ඉගැන්වීම නිසා පීඩාවට පත්ව සිටියවුන් මෙන්ම ශ්‍රමණ ඉගැන්වීම් නිසා වියවුලට පත්ව සිටි ප්‍රජාවද නිසි මගට යොමු කොට සැනසිල්ල උදාකර දීමට මෙම ධර්ම දූත සේවා මගින් හැකියාව ලැබිණ.
- සිය ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ විශේෂ හැකියාවන් අගය කරමින් විවිධ අගතනතුරු ප්‍රදානය කිරීමද ධර්ම දූත මෙහෙය ඵලදායක වීමට හේතුවූ බව පැහැදිලිය.

7.1.2.1 ප්‍රථම ධර්ම සංගායනාව

- සාම්ප්‍රදායික පාලි මූලාශ්‍රය අනුව ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩු දුන් මූලික හේතුව සුභද්‍රගේ වගකීමෙන් තොර අභද්‍ර ප්‍රකාශයයි. එමගින් ප්‍රකට වූ ශාස්තෘ විරෝධී, ධර්ම විනය විරෝධී ආකල්පයයි. සුභද්‍ර තනි පුද්ගලයෙකු විය නොහැකි බවත්, මහළුකළ පැවිදි වූවකු වුවද ඔහු අනුව ගිය තවත් භික්ෂූන් සිටිය හැකි බවත් එවකට බුදු සසුනෙහි ජ්‍යෝෂ්ටත්වය දැරූ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පවා අදහස් කළ අතර බුද්ධ පරිනිර්වාණය වැනි වැදගත් අවස්ථාවක එම භික්ෂුව එසේ පැවසීම බරපතල කරුණක් වීමද මෙහිලා සැලකිය යුතුය.
- බුදුරදුන් ධරමාන අවදියේදී පවා යම් යම් අර්බුද ඇති කළ , විෂම අදහස් දැරූ භික්ෂූන් සිටි අතර (සාති, දේවදත්ත, ධර්මධර විනයධර භික්ෂූන්, බහුභාණ්ඩික භික්ෂුව, කෝකාලික භික්ෂුව වැනි අය) ඔවුන්ගේ ක්‍රියාකාරකම් හා ආකල්ප කෙමෙන් විකාශය වීමෙන් පරිනිර්වාණ අවස්ථාව වන විට මහා සංඝ සම්මේලනයක අවශ්‍යතාවය ඇතිවී තිබිනැයි සැලකිය හැකිය.
- ඇතැම් බුද්ධ දේශනා පිළිබඳ ශ්‍රාවක භාෂිත තුළින්ද මතුවට මෙබඳු සංගායනා පින් සිදුකිරීමට හා ශාසන සංශෝධනයකට ආදර්ශයක් ලැබී තිබීම. බුදුරදුන් ධරමාන අවදියේදීම මහ සඟ සමුළු පවත්වා තිබීම. ( උදා: අගසව් තනතුරු ප්‍රදානය කළ සංඝ සන්නිපාතය) එම ආදර්ශයන් අනුව ධර්ම සංගායනාවක් සිදු කිරීමට ජ්‍යෙෂ්ඨ ශ්‍රාවකයන් යොමුවීම.
- ජෛනමහාවීර තුමන් පාවා නුවරදී අභාවප්‍රාප්ත වූ පසු එම ශාසනය තුළ ඇතිවූ අර්බුද සැලවීමෙන් පසු තමන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුව බුදු සසුනෙහිද එවැනි තත්ත්වයක් ඇතිවිය හැකියයි බුදුරදුන් පළකළ අදහස හා එම තත්ත්වය වළක්වා ශාසන සාමග්‍රිය හා චිරස්ථිතිය ඇති කිරීමේ වැඩ පිළිවෙලක ආවශ්‍යකත්වය ජ්‍යෙෂ්ඨ ශ්‍රාවකයන්ට පෙනී යාම.
- තමන් වහන්සේගේ ඇවෑමෙන් ධර්ම විනය ශාස්තෘත්වයෙහිලා සැලකිය යුතුයැයි පිරිනිවීමට ආසන්න සමයෙහි බුදුරදුන් ප්‍රකාශකොට තිබීම හා ඒ අනුව විසිරී තිබූ ධර්ම විනය ගොනු කොට එහි සුරක්ෂිත බව සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම ජ්‍යෙෂ්ඨ ශ්‍රාවක භික්ෂූන් විසින් අවධානයට යොමු කිරීම.
- පරිනිර්වාණයට ආසන්න සමයේ ඇතිවූ තත්ත්වය. එනම් ජන්න තෙරුන් පිළිබඳ ගැටලුව, ආනන්ද හිමියන්ට චෝදනා පහක් එල්ලවීම ආදී වශයෙන් ශාසනය තුළ අර්බුද හා මතභේද උද්ගතවීම නිසා ඒවා මග හරවා ගැන්මට ජ්‍යෙෂ්ඨ ශ්‍රාවක භික්ෂූන් පෙළඹීම.
- සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසුව රජගහනුවර වේභාර පර්වත ප්‍රාන්තයේ සප්තපර්ණී ගුහා ද්වාරයෙහි ප්‍රථම සංගීතිය සිදුකළ බව සඳහන් වෙයි. එය ආරක්ෂිත ස්ථානයක් වූයේය. විරුද්ධවාදීන්ගෙන් සිදුවිය හැකි බාධා වැළැක්වීමට එබඳු තැනක් තෝරාගත් බව පෙනේ.

- මහා කාශ්‍යප උපාලි ආනන්දාදි මහ තෙරුන්වහන්සේලාගේ මූලිකත්වයෙන් පන්සියයක් මහ රහතුන්ගේ සහභාගීත්වයෙන් මෙම සංගායනාව සිදු විය. එබැවින් එය "පඤ්චසතිකා" නමින් හැඳින්වේ.
- අජාසත් රජතුමා මෙම සංගීතියට අනුග්‍රහ දැක්වීය. එම රාජ්‍යාරක්ෂාවද ඇතිවිය හැකිව තිබූ අර්බුද, බාධා වළක්වා ගැන්මට උපකාර විය.
- සංගීතියේදී පළමුව විනයත් දෙවනුව ධර්මයත් විමසීමට භාජනය විය. විනය සසුනෙහි ආයුෂය බවත් එය පවත්නාකල්හි සසුන චිරස්ථායි වන බවත් සලකා එය පළමුව සංගායනා කරන ලදී. විනයධර උපාලි මහ රහතන් වහන්සේ එයට මුල් වූහ.
- එහිදී විනය විමසීමෙන් පසු පාරාජික පාලි, පාචිත්තිය පාලි, චුල්ලවග්ග පාලි, පරිවාර පාලි වශයෙන් ගොණුකර ගන්නා ලදී.
- දෙවනුව ධර්ම භාණ්ඩාගාරික ආනන්ද මාහිමියන්ගේ මූලිකත්වයෙන් ධර්මයද විමසන ලද අතර දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය හා ඛුද්දක නිකාය වශයෙන් ගොණුකරන ලදී.

- විනය මෙන්ම ධර්මයද පිරිසිදු ව මුඛ පරපුරින් පවත්වාගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ ධර්ම විනයධර මහ තෙරවරුන් ප්‍රධාන උන්වහන්සේලාගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා වලට පැවරිණ. මෙය භාණක භික්ෂූන් පත් කිරීමේ මුල්ම අවස්ථාව විය.
- තමන් වහන්සේගේ ඇවෑමෙන් කුඩා අනුකුඩා ශික්ෂාපද භික්ෂූන්ට අවශ්‍ය නම් වෙනස්කර ගත හැකි යැයි බුදුරදුන් විසින් අනුදැන වදාරා තිබූ නමුදු එම ශික්ෂාපද නම් කොට නොතිබිණ. මෙම සංගායනාවේදී එම ශික්ෂාපද පිළිබඳ ගැටලුව මතුවූ නමුදු ඒවා නිශ්චය කිරීමෙන් ඇතිවිය හැකි තත්ත්වය සැලකිල්ලට ගත් මහා කාශ්‍යප මාහිමියන් විසින් එය සාකච්ඡා නොකිරීමට පියවර ගත් බව පෙනේ.

- ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩය පැනවීමට ද පූර්ව බුද්ධාවවාදය අනුව මෙම සංගීතියේදී පියවර ගන්නා ලදී.

7.1.2.2 දෙවන ධර්ම සංගායනාව

- සාම්ප්‍රදායික මූලාශ්‍රය අනුව විශාලා මහනුවර වජ්ජිපුත්තක භික්ෂූන් විසින් බුදුරදුන් අකැපයැයි වදාළ කරුණු 10 ක් කැපයැයි සලකාගෙන විනය විරෝධීව කටයුතු කිරීම හෙවත් අකැප දසවස්තුවක් පිළිගැනීම දෙවන ධර්ම සංගායනාවේ ප්‍රධාන හේතුවයි. එයින් ප්‍රකට වන්නේ කලක් තිස්සේ වර්ධනය වූ භික්ෂූන් අතර මත භේදයක් බව සැලකිය හැකිය.
- ජ්‍යෙෂ්ඨ සාසන භාර ධාරී භික්ෂූන් විනය සසුනෙහි ආයුෂය ලෙස සලකා විනයවාදීව කටයුතු කරද්දී කාලය, දේශය අනුව කුඩා ශික්ෂාපද වෙනස්කර ගනිමින් කටයුතු කිරීමට සමහර භික්ෂු පිරිස් පෙලඹුණු බව දස වස්තුවෙන් පෙනේ.
- එවකට වෘද්ධතම ජ්‍යෙෂ්ඨ භික්ෂුව වූ සබ්බකාමී මාහිමියන්ට දස වස්තුව ගැන සැලවීමෙන් පසු ඒ ගැන විමසීමට යස හිමියන් විශාලා මහනුවරට යැවූ අතර, එවිට වජ්ජි පුත්තක භික්ෂූන් දවස වස්තුවේ දසවැන්න අනුව මුදල් සම්මාදමේ යෙදී සිටිනු දැක එයට එරෙහි වූ විට එම වජ්ජි භික්ෂූන් විසින් යස හිමිට උක්ඛේපනීය කර්මයෙන් දඬුවම් පැනවූ බව සඳහන් වෙයි.
- ආපසු වැඩම කළ යස හිමියන් සියලු පුවත් සබ්බකාමී හිමියන්ට දැන්වීමෙන් පසු රේවතාදී පිරිවරුන් සමඟද සාකච්ඡා කොට දෙවන ධර්ම සංගීතිය පැවැත්වීමට පියවර ගන්නා ලදී.
- සම්බුද්ධ පරිනිර්වාණයෙන් සියක් වසරකට පසු වජ්ජි භික්ෂූන් විසූ විශාලා මහනුවර වාලුකාරාමයේදී මෙම සංගීතිය පවත්වා ඇත.
- මෙම සංගීතිය සඳහා කාලාශෝක රජතුමාගේ අනුග්‍රහය ලැබිණ.
- සබ්බකාමී, යස, රේවතාදී මාහිමිවරුන් ප්‍රධාන සත්සියයක් මහරහත් මා හිමිවරුන් සහභාගි වූ දෙවන ධර්ම සංගායනාව "සත්ත සතිකා" නම් වේ. එයට සත් මසක් ගතවිය.
- සංගායනාවට පළමුව පත්කළ කමිටුවක් විසින් දස වස්තුව විනය විරෝධී බව තීරණය කරන ලද අතර සංගායනාවේදී එය සැලකිල්ලට ගැනින.
- සංගායනාවේ ප්‍රතිඵල වශයෙන් දස වස්තු ප්‍රතිග්‍රාහික දස දහසක් භික්ෂූන් අලජ්ජි පාපී භික්ෂූන් බව නිගමනය කොට සසුනෙන් නෙරපා හරින ලදී.
- විනය විරෝධීන් සසුනින් නෙරපා, ජ්‍යෙෂ්ඨ භික්ෂූන්ගේ මූලිකත්වයෙන් ශාසන සංශෝධනයන් කිරීම මෙම සංගීතියෙන් සිදු විය.
- දස වස්තුව පිළිබඳ සංගීතිකාරක භික්ෂූන්ගේ තීරණය නොපිළිගත් වජ්ජි පුත්තක භික්ෂූන් සංගීති කාරක භික්ෂූන්ගෙන් වෙන්ව යාමෙන් මෙතෙක් නොබෙදී පැවති භික්ෂු සංවිධානය බෙදී ගොස් නිකාය භේදයකට මුල පිරින.

- වෙන්ව ගිය භික්ෂූහු මහාසාංඝික නම් නව නිකායක් පිහිටුවා ගත්හ. එතැන් පටන් මුල් භික්ෂූන් ථේරීය නමින් පෙනී සිටි බව සඳහන් වේ.
- නැවත මහා සාංඝික නිකාය තුළද මතභේද ඇතිවිය. ක්‍රමයෙන් ඔවුහු නිකාය හයකට බෙදී ගියෝය. ථේරීය භික්ෂූන් අතර ද මතභේද ඇතිවිය. ක්‍රමයෙන් ඔවුහු නිකාය 12 කට බෙදී ගියෝය. මෙසේ දෙවන සංගායනාවේ ප්‍රතිඵල වශයෙන් නිකාය 18 ක් ඇති විය.
- සාම්ප්‍රදායික පාලි මූලාශ්‍රයවල එන මෙම කරුණුවලට අමතරව සංස්කෘත මූලාශ්‍රය දක්වන පඤ්ච වස්තුවක් ද ඇත. මහාදේව හිමියන් ඉදිරිපත් කළ බව දැක්වෙන එයද නිකාය භේදයට මුල්වීයැයි සැලකෙයි.
- පඤ්ච වස්තුව මගින් රහතුන් වහන්සේ සහ විමුක්තිය පිළිබඳ නව මත පහක් දක්වා තිබේ. එමගින් රහතුන්ගේ තත්ත්වය පහත් තන්හි ලා සලකා ඇති බවද එය ශාසන භාරධාර භික්ෂූන් වෙත එල්ල කරන ලද විරෝධයක ස්වභාවය පෙන්වන බවද විද්වත්හු කල්පනා කරති.
- දෙවන ධර්ම සංගීතියෙනේ පසුව උපන් ශාසනික වාතාවරණය පසුකාලීන ශාසන ඉතිහාසය කෙරෙහි ඉමහත් බලපෑමක් ඇති කළේය. මහායාන බුදු දහම ඇතිවීමේ පසුබිම සකස් විය. බුද්ධ වචනය පිළිබඳ නිකායාන්තර අර්ථකථනද අනුක්‍රමයෙන් බිහි විය.

7.1.2.3 **තෙවන ධර්ම සංගායනාව**

- සාම්ප්‍රදායික පාලි මූලාශ්‍රය අනුව තෙවන ධර්ම සංගායනාවට හේතු වූයේ ධර්මාශෝක මහාධිරාජයා දවස උපන් අර්බුද සහිත ශාසනික වාතාවරණයයි. එය අනුක්‍රමයෙන් සාසනය තුළ වර්ධනය වූ අසතුටුදායක තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් බව පිළිගත හැකිය.
- මූලාශ්‍රය අනුව අශෝක රජතුමන් සසුනට කළ අනුග්‍රහ නිසා ඒ ලාබ සත්කාරයෙහි ගිජුවූ තීර්ථකයෝ භික්ෂු වෙස් ගත්හ. ශික්ෂාකාමී භික්ෂූහු ඔවුන් සමග විනය කර්ම නොකළහ. සත් වසරක් එසේ විනයකර්ම නොකළ බව දැනගත් පසු ඒ ගැන සොයා බැලීමට ඇමතිවරයෙක් පත් කළ අතර ඔහු විනයකර්ම කරන ලෙස බලකොට භික්ෂූන්ට දරුණු දඬුවම් දීමෙන් විශාල විනාශයක්ද සිදු කළේය. එය සැලවීමෙන් පසු මොග්ගලීපුත්ත තිස්ස හිමියන් සංගායනාවක් පැවැත්විය යුතුයැයි පෙන්වා දෙන ලදී. ඒ අනුව තෙවන ධර්ම සංගායනාව සිදු විය.
- තෙවන ධර්ම සංගායනාව සිදුකරන ලද්දේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 කට පසු ක්‍රි.පූ. තුන්වන සියවසේ දී බව සඳහන් වෙයි. මේ ගැන විවිධ මත භේද විද්වතුන් අතර ඇත.
- මෙම සංගායනාවේ මූලිකත්වය දරන ලද්දේ එවකට වැඩ සිටි ජ්‍යෙෂ්ඨතම මහතෙරුන්වහන්සේ වූ මොග්ගලි පුත්ත තිස්ස මාහිමියන් විසිනි. ධර්ම විනයධර ථෙරවාදී භික්ෂූන් වහන්සේලා 1000 සහභාගි වූ එය "සාහස්සිකා" නම් වේ. සංගීතියට මාස 9 ක් ගත විය.
- මෙම සංගායනාවේ කටයුතු සඳහා මූලික අනුග්‍රහය දක්වන ලද්දේ බෞද්ධ මහාධිරාජ ධර්මාශෝකයන් විසිනි.

- මෙම සංගායනාව පවත්වන ලද්දේ ථෙරවාදී භික්ෂු මූලස්ථානයක් ලෙස සැලකෙන පැලලුප් නුවර අශෝකාරාම විහාරයේදීය.
- ථෙරවාද සම්ප්‍රදායට අයත් මූලාශ්‍රය විසින් හෙළිකරන තෙවන සංගීතියේ මුල්වීයැයි සැලකෙන පූර්වෝක්ත පසුබිම පිළිබඳව විද්වතුන් අතර විවිධ මත පවතියි. මෙම සංගීතිය ධර්මාශෝකයන්ගේ අනුග්‍රහ මත ථෙරවාදි භික්ෂූන්ගේ මූලිකත්වයෙන් ඒ වන විට වර්ධනය වූ නිකායන්ගේ මතවාද යටපත් කිරීමේ අරමුණින් සිදුකරන ලද්දකැයි සැලකෙයි.
- සංගීතිය අවසානයේදී භික්ෂු වෙස්ගත් අය සමයවාදීන් ලෙස සැලකෙන දුසිල් භික්ෂූන් 60,000 ක් සසුනින් නෙරපන ලදි. ථෙරවාද ධර්ම විනය රැකගැනීමත් ශාසන පාරිශුද්ධියත් ඇති කිරීමත් එමගින් සිදුවිය.

- සංගායනාවෙන් පසු ථෙරවාදී භික්ෂූන් පොහොයකර්ම කළ බවද එමගින් නැවත විනයගරුකත්වය ඇතිවූ බවද පිළිගැනේ.
- ථෙරවාදි අභිධර්ම පිටකය සම්පූර්ණත්වයට පත්වූයේ මෙම සංගායනාවේ ප්‍රතිඵල වශයෙනි. මොග්ගලිපුත්ත තිස්ස මාහිමියන් විසින් පරවාද ( අන්‍ය නිකායික මත) 500 ක් හා සකවාද (ථෙරවාදි මත) 500 ක් ද ඇතුලත් කොට සැකසූ "කථාවත්ථුප්‍රකරණය " ථෙරවාදීන්ගේ පාලි අභිධර්ම පිටකයට එක්කරන ලදී. පළමුව පරවාද ඉදිරිපත් කර ඒවා බණ්ඩනය කරමින් සකවාද දැක්වීම එම අභිධර්ම ප්‍රකරණයෙහි දැකගත හැකිය.
- ජාත්‍යන්තර වශයෙන් ඉතිහාසය තුළ ථෙරවාදි ධර්ම විනය වඩාත් පුළුල්ව පැතිරවීමටද ධර්මාශෝකයන්ගේ අනුග්‍රහය මත මෙම සංගීතියෙන් පියවර ගැණුනි. එම රජතුමාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය අනුව එය සිදුවිය. මොග්ගලිපුත්ත තිස්ස හිමියෝ එහිලා මග පෙන්වූහ.
- ථේරවාද ධර්ම විනය දේශාන්තර නමයක ව්‍යාප්ත කරන ලදී. මෙසේ අලුතින් ධර්මය හඳුන්වා දුන් ඇතැම් ප්‍රදේශ භාරතය තුළම පිහිටි ප්‍රාන්ත රාජ්‍ය වූ අතර, ඇතැම් ප්‍රදේශ භාරතයෙන් පිටත පිහිටි රාජ්‍යයන් වූයේය. ඒ ඒ දේශවලට ධර්ම විනයධර මහ තෙරවරුන් වහන්සේලාගේ නායකත්වයෙන් ධර්ම දූත භික්ෂු කණ්ඩායම් පිටත්කර හරින ලදී.

### 7.1.3 භාරතීය බෞද්ධ විශ්ව විද්‍යාල

#### 7.1.3.1 තක්ෂිලා විශ්ව විද්‍යාලය

- ආරාමය පදනම් කරගත් බෞද්ධ අධ්‍යාපනයේ ස්වර්ණමය යුගය සනිටුහන් වන්නේ සුප්‍රකට බෞද්ධ විශ්ව විද්‍යාල බිහිවීමත් සමගයි. අතීතයේදී ලොව පුරා පහල වූ බෞද්ධ විශ්ව විද්‍යාල කිහිපයක්ම භාරතයේ පැවතුනි. නාලන්දා, වලභී, වික්‍රමශීලා, ඕදන්තපුර්, ජගද්දලා යනුවෙන් හැඳින්වෙන්නේ එම සුප්‍රකට විශ්ව විද්‍යාලයන්ය. දැනට පකිස්ථානයට අයත්ව පවතින තක්ෂිලා (තක්කසිලා) විශ්ව විද්‍යාලය භාරතයේ පිහිටි පුරාණතම විශ්ව විද්‍යාලය ලෙසින් සැලකෙන අතර, මෑතක් වනතුරුම එය බෞද්ධ විශ්ව විද්‍යාලයක් ලෙස නොපිළිගැණුනි. එහෙත් තක්ෂිලා විශ්ව විද්‍යාලය භූමියෙන්

සොයාගන්නා ලද සුවිශාල බෞද්ධ නටඹුන් සහ පුරා විද්‍යාත්මක සාධක මගින් තක්ෂිලාව බෞද්ධ විශ්ව විද්‍යාලයන්ව පැවති බව තහවුරු වී ඇත.

7.1.3. 2 නාලන්දා විශ්ව විද්‍යාලය

- භාරතීය බෞද්ධ විශ්ව විද්‍යාල අතුරින් විශාලතම හා කීර්තිමත්ම විද්‍යායතනය නාලන්දා විශ්ව විද්‍යාලයයි.
- පුරාණ මගධ රාජ්‍යයට අයත් රජගහනුවර (වර්තමාන රාජගිර්) සිට සැතපුම් අටක් පමණ උතුරින් නාලන්දා ග්‍රාමයේ විශ්ව විද්‍යාලය පිහිටා ඇත.
- විශ්ව විද්‍යාල භූමියෙන් ලැබුණු පුරා විද්‍යාත්මක සාධක හැරුණු කොට නාලන්දාව පිළිබඳ කරුණු සොයා ගැනීමට වර්තමානයේ ඇති ප්‍රධාන මූලාශ්‍රය වන්නේ නාලන්දාවේ වසර 15 ක් පමණ ශිෂ්‍යයකු හා ආචාර්යවරයකු , ලෙස කටයුතු කළ හියුං සියැං නම් චීන ජාතික හිමිනමගේ වාර්තා සහ නාලන්දාවේම අධ්‍යාපනය ලැබූ තවත් චීන ජාතික හිමිනමක් වූ ඉත් සිංගේ වාර්තාය. තවද හුයිලි විසින් ලියන ලද හියුං සියැං හිමිගේ චරිත කථාවේද නාලන්දා විශ්ව විද්‍යාලය ගැන තොරතුරු ඇතුළත් වේ. තවද නාලන්දාවේ විසූ සුප්‍රකට පඬිවරුන් කිහිපනමක් අවස්ථා කිහිපයකදී ටිබෙටයේ සංචාරය කොට ඇති හෙයින් ටිබෙට් වාර්තා හා සෙල්ලිපි වලද නාලන්දාව පිළිබඳ ඇතැම් විස්තර ඇතුළත් වේ. 15 වන සියවසේ දී තාරානාථ විසින් ලියන ලද "බෞද්ධ ඉතිහාසය" නම් ග්‍රන්ථයේ නාලන්දාවේ ආරම්භය සංවර්ධනය හා පරිහානිය පිළිබඳ විස්තර ඇතුළත් වේ.
- නාලන්දාව විශ්ව විද්‍යාලයක් බවට පත්වීමට පෙර පැවති තත්ත්වය පිළිබඳ විවිධ මතවාද පවතියි. බුදුරදුන් කිහිපවිටක්ම සංචාරය කළ, නිකායාගත සූත්‍ර කිහිපයක්ම දේශනා කළ ස්ථානයක් වූ නාලන්දාව සැරියුත් හිමිගේ ජන්ම භූමිය ලෙසද සැලකේ. තවද සැරියුත් හිමිගේ දේශය පිළිබඳ ආදාහනය හා ඉන් අනතුරුව එම ධාතු තැන්පත් කොට වෙහෙරක් ඉදි කිරීමද එහිදී සිදුවී ඇත.
- කෙසේ වුවද ඓතිහාසික තොරතුරු අනුව නාලන්දාව විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීමට අවශ්‍යකරන ගොඩනැගිලි ඉදිකර උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත් කරන්නේ ක්‍රි.ව. 415 - 455 රජකළ සක්‍රාදිත්‍ය හෙවත් පළමුවන කුමාරගුප්ත රජු බව සනාථ වී ඇත.
- සක්‍රාදිත්‍ය රජු විසින් ඉදිකරන ලද නාලන්දා මහා විහාරයයි. ( මහා විහාරය යන්න එකල විශ්ව විද්‍යාල හැඳින්වීම සඳහා භාවිත වචනයයි. ) ඔහුගේ පුත් බුද්ධගුප්ත රජු විසින් දියුණු කරන ලදී. ඉන් පසු තථාගත ගුප්ත (වික්‍රමාදිත්‍ය) බාලාදිත්‍ය ( නරසිංහ ගුප්ත) වජ්‍ර (කුමාර ගුප්ත 11) ආදී පසුකාලීන රජවරුන් විසින් නාලන්දාවේ දියුණුවට බොහෝ සේවාවන් සිදුකොට ඇත.
- තාරානාථට අනුව නාලන්දාවේ මූලාරම්භය නාගාර්ජුන - ආර්යදේව යුගය දක්වා ඇතට යයි. ඔහු සඳහන් කරන පරිදි ක්‍රි.ව. 2 වන 3 වන සියවස්වල විසූ නාගර්ජුන හා ආර්යදේව යන මහා දාර්ශනිකයන්

දෙදෙනා විසුවේ නාලන්දාවේ බවයි.

- ක්‍රි.ව. 7 වන සියවස වන විට නාලන්දා විශ්ව විද්‍යාලය දස දහසකට නේවාසික පහසුකම් සැපයිය හැකි සුවිශාල අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත්ව ඇත.
- හියුං සියැං හා හුයි ලී වාර්තාවලට අනුව විශ්ව විද්‍යාලයේ සංඝාරාම හයකි. මුලු විශ්ව විද්‍යාල භූමියට උස් තාප්පයකින් වටකොට තිබිණ. සෑම සංඝාවාසයක් මහල් කිහිපයකින් යුක්ත විය. විවිධ කැටයමින්, කොත් කැරලි වලින් , මකර තොරණ ආදියෙන් අලංකාර කරන ලද ගොඩනැගිලි විශාල ප්‍රමාණයකින් යුක්ත විය. පළතුරු මල් පොකුණු වලින් යුතු උයන් වතු ආදියෙන් භූමිය අලංකාර කොට පැවතිණි.
- තට්ටු 9 කින් හා මන්දිර තුනකින් යුතු නාලන්දා පුස්තකාලය රත්න සාගර, රත්නෝදය, රත්නරඤ්ජන යන නම් වලින් හඳුන්වා ඇති අතර , දැනට සොයා ගෙන ඇති නටඹුන් අතර සුවිශාල සංඝාර එකොලහක පාදම් මතුවී ඇත. ඒවා තට්ටු 5 සිට 9 දක්වා වූ උසට ගොඩනගා තිබෙන්නට ඇතැයි සැලකේ.
- උස් ගොඩනැගිල්ලක් මුදුනේ ආකාශ වස්තු පර්යේෂණාගාරයක් ද තවත් ගොඩනැගිල්ලක රසායනාගාරයක්, වෛද්‍ය විද්‍යාලයක්, රෝගී නේවාසිකාගාරයක් ද විය.
- මෙම භූමියේ තවම කැණීම් සිදුකොට ඇත්තේ ඉතා සුලු ප්‍රමාණයක පමණි. එම කැණීම් වලින් සොයා ගෙන ඇති විශාල ප්‍රමාණයක් වූ පුරාවස්තු අතර බුද්ධ ප්‍රතිමා බෝධිසත්ව ප්‍රතිමා, දේව ප්‍රතිමා , ශිලා ලේඛන රාජ මුද්‍රා, විශ්ව විද්‍යාලයීය මුද්‍රා ආදිය අන්තර්ගතය.
- මුළුමණින්ම නේවාසික විශ්ව විද්‍යාලයක් වූ මෙහි හියුං සියැං පැමිණෙන විට ආචාර්ය, ශිෂ්‍ය, සේවක යන හා නේවාසික සංඛ්‍යාව දස දහසකි. මෙයින් 1510 දෙනෙක් පමණ සේවක පිරිසටද අයත් වූ අතර ඉතිරි අය එනම් හත් දහසක් පමණ ශිෂ්‍යයින් සේ සැලකිය හැකිය. වෙනත් වාර්තා වල මෙම ආචාර්ය, ශිෂ්‍ය, සේවක සංඛ්‍යාව පිළිබඳ වෙනස් වූ මතද පවතියි.
- සිසුන්ගෙන් වැඩි පිරිස භික්ෂූන් වූහ. බ්‍රහ්මචාරි නමින් හැඳින්වූ විශාල ගිහි ශිෂ්‍ය පිරිසක්ද වූහ.
- අධ්‍යාපනය අංශ තුනක් යටතේ සිදුවිය. වෙනත් ආයතනවල විශ්ව විද්‍යාල අධ්‍යාපනය හමාර කොට පශ්චාත් උපාධි ලැබීමට පැමිණි සිසුන් එක් ගණයකි. මෙම ගණය යටතේ පශ්චාත් උපාධි ලැබීමට දේශීය සිසුන් මෙන්ම විවිධ විදේශ රටවලින් ද විශාල වශයෙන් සිසුන් පැමිණි බව පෙනේ. හියුං සියැං වැන්නවුන් උදාහරණ ලෙස දැක්විය හැකිය. භාරතය තුළම පැවති විවිධ රාජ්‍යවලට අයත් සිසුන් මෙන්ම මොන්ගෝලියාව, ටිබෙටය, චීනය, කොරියාව , ජපානය, සුමාත්‍රා, ජාවා ආදී විවිධ රටවලින් මෙසේ පශ්චාත් උපාධි සඳහා විශාල වශයෙන් සිසුන් පැමිණ ඇත. ද්විතීයික අධ්‍යාපනය අවසන් දෙවන ගණයට අයත් වන්නේ නාලන්දාවෙන් ප්‍රථම උපාධිය ලැබීමට පැමිණි වයස 20 පමණ වූ ශිෂ්‍යයෝය. යටත් පිරිසෙයින් වර්ෂ 3ක් වත් මෙම සිසුන් අධ්‍යාපනය ලැබිය යුතු විය. තෙවන ගණයට අයත් වූයේ ද්වීතියික අධ්‍යාපනය සඳහා නාලන්දාවට ඇතුළත් වූ ශිෂ්‍යයෝය. වයස 15 පිරුණු ශිෂ්‍යයන් මේ සඳහා ඇතුළත් කරගන්නා ලදී. වර්ෂ 8 ක් පමණ මොවුහු එහිදී අධ්‍යාපනය ලැබූහ.
- නාලන්දා විශ්ව විද්‍යාලයට ප්‍රවේශවීම ඉතා තියුණු පරීක්ෂණයකින් පසුව සිදුවිය. විශ්ව විද්‍යාල ප්‍රවේශය සිදුකළේ "ද්වාරපණ්ඩිත්නම්" විශේෂ ආචාර්ය මණ්ඩලයක් මගිනි. නාලන්දා විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට

සංස්කෘත භාෂාව සංස්කෘත ධර්ම ග්‍රන්ථ හා බුද්ධ ධර්මය ගැන මනා අවබෝධයක් තිබීම අවශ්‍යය.

- මෙහි ඉගැන්වූ විෂයයන් භාෂාව, බුද්ධ ධර්මය වෙනත් දර්ශන ශාස්ත්‍ර , ලෞකික විද්‍යා , ලලිත කලා වශයෙන් ප්‍රධාන විෂයධාරා පහකට බෙදා තිබුණි.
- සංස්කෘත භාෂාව අනිවාර්ය වූ අතර ශික්ෂා, ඡන්දස්, ව්‍යාකරණ, නිරුක්ති ආදියද ඊට ඇතුළත් වූහ. බුද්ධ ධර්මයද අනිවාර්ය වූ අතර මේ යටතේ මහායාන ධර්ම ග්‍රන්ථ සහ සෙසු නිකායානුගත ඉගැන්වීම් පිළිබඳ පුළුල් දැනුමක් ලබාදෙන ලදී. බුද්ධ ධර්මය විෂය යටතේ අභිධර්මය හා හේතු විද්‍යාව උගන්වන ලදී. තන්ත්‍රයානයට අයත් පොත පතද මෙම විෂය යටතේම උගන්වන ලදී.
- තවද වේදය , බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් ග්‍රන්ථද නාලන්දා විෂය නිර්දේශය ඇතුළත් විය. මීට අමතරව සාංඛ්‍ය, යෝග, න්‍යාය, වෛශෙසික, පූර්ව මීමංසා, උත්තර මීමංසා යන ෂඩ්විධ හින්දු දර්ශනද මෙහිදී උගන්වා ඇත. තවද ජෛන දර්ශනයද , යෝග ශාස්ත්‍රයද මෙහි විෂය නිර්දේශයට ඇතුළත් විය.
- නාලන්දාවේ විෂය නිර්දේශයට ලෞකික ධර්ම ශාස්ත්‍රද ඇතුළත් විය. තාරකා විද්‍යාව එහි වූ ප්‍රධාන විෂයයක් බව විශ්ව විද්‍යාලයේ ඉතාම උස් ගොඩනැගිල්ලේ ආකාශවස්තු පර්යේෂණාගාරයක් තිබීමෙන්ම පැහැදිලි වේ. නාලන්දාවේ වූ ඉතා නිවැරදිව වේලාව මනින පැතැටිය මගින් මුළු මගධයටම නිවැරදිව වේලාව දන්වන ලදී.
- ආයුර්වේද විෂය යටතේ රෝග හඳුනා ගැනීම, ඖෂධ නියම කිරීම, රසායනික බෙහෙත් වර්ග පිළියෙල කිරීම පමණක් නොව ශල්‍යකර්මද විෂය නිර්දේශයට ඇතුළත් විය. තවද වේද මන්ත්‍ර මෙන්ම ජ්‍යොතිෂය, ධනුර්වේදය, සර්ප විද්‍යාව, ආදී විෂයයන්ද නාලන්දා විෂය නිර්දේශයට ඇතුළත්ව පැවතිනි.
- ඉගැන්වීම දේශන, සාකච්ඡා, විවාද, පෞද්ගලිකව කරන කරුණු පැහැදිලි කිරීම් මගින් සිදුවිය. ප්‍රශ්න ඇසීමට සහ ගැටලු සාකච්ඡා කිරීමට ශිෂ්‍යයින්ට සම්පූර්ණ නිදහස තිබිණි.
- සෑම ශිෂ්‍යයෙකුට පෞද්ගලික ගුරුවරයෙක් සිටියේය. ශිෂ්‍යයා පිළිබඳ වගකීම ඔහුට පැවරුණ අතර ඔහුගේ විනය හා හැසිරීම පිළිබඳ භාරකාරත්වය දරන ලද්දේ එම පෞද්ගලික ගුරුවරයා විසිනි.
- විශ්ව විද්‍යාලයේ ප්‍රධානියා වූයේ කුලපති හිමියන්ය. හියුං සියැං හිමි පැමිණෙන විට කුලපති තනතුර දැරුවේ ශීලභද්‍ර හිමියන්ය. ශීලයෙන්, ගුණයෙන්, දැනුමෙන් පිරිපුන් භික්ෂුවක් හැමවිටම කුලපති තනතුර සඳහා තෝරා ගැණුනි. උන්වහන්සේ යටතේ ප්‍රධාන කෘත්‍යාධිකාරී මණ්ඩල දෙකක් පැවති අතර විශ්ව විද්‍යාලයේ සමස්ත කටයුතු පාලනය කරන ලද්දේ එමගිනි. විශ්ව විද්‍යාලයට සිසුන් ඇතුළත් කිරීම පාඨමාලා පිළියෙල කිරීම, ආචාර්යවරුන්ට වැඩ බෙදා දීම, විභාග පැවැත්වීම, පොත් පිටපත් කිරීම, පොත් සම්පාදනය ආදී ශාස්ත්‍රීය කටයුතු එක් මණ්ඩලයකට පැවරිණි. ගොඩනැගිලි ඉදිකිරීම, ප්‍රතිසංස්කරණ කටයුතු, නේවාසිකයනට ආහාර, ගිලන්පස, වස්ත්‍ර සැපයීම, නේවාසික පහසුකම් වෙන් කිරීම, සේවකයන් පාලනය කිරීම,ගම්වර පාලනය, ධාන්‍ය රැස් කිරීම ආදී පරිපාලන කටයුතු අනෙක් මණ්ඩලයට පැවරිණි.
- විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම නිදහස් වූ අතර ආහාර හා නේවාසික පහසුකම් ද නොමිළයේ ලැබිණි.

- නාලන්දාවේ ප්‍රථම ප්‍රධානාචාර්ය හෙවත් පළමු කුලපති තනතුරු දැරුවේ කවුරුන්ද යන්න පැහැදිලි නැත. එහෙත් නාගර්ජුන හිමි විසුයේ නාලන්දාවේ බවත්, එවකටත් නාලන්දාව අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස පැවති බවත් සැලකේ. ඒ අනුව නාගර්ජුන, ආර්ය දේව මෙහි මුල්ම ප්‍රධානාචාර්යවරුන් ලෙස සැලකිය හැකිය. අනතුරුව රාහුල භද්‍ර, අසංග, වසු බන්ධු දින්නාග, ගුණමති, ස්ථිරමති, ජයදේව, චන්ද්‍ර කීර්ති , ප්‍රභා මිත්‍ර, චන්ද්‍රගොමින්, ජිනමිත්‍ර ධර්මපාල ශීලභද්‍ර ධර්ම කීර්ති, ශාන්තරක්ෂිත, කමලශීල , බුද්ධ කීර්ති යන හිමිවරුන් නාලන්දාවේ කීර්තිමත් කුලපතිවරුන් වූහ.
- මෙසේ ලොව සුපතල කීර්තිමත් විද්‍යායතනයක් වූ ලෙස වර්ෂ දහසක් පමණ විරාජමාන වූ නාලන්දා විශ්ව විද්‍යාලය 13 වන සියවස මුලදී මුස්ලිම් ආක්‍රමණිකයකු වූ භක්තියාර් බිල්ජ් විසින් භික්ෂූන් සමූල ඝාතනය කොට වටිනා ධර්ම ග්‍රන්ථ හා සියලු සම්පත් සහිත ගොඩනැගිලි ගිනිබත් කොට විනාශ කරන ලදී.
- මේ අවස්ථාවේදී ඇතැම් භික්ෂූන් ඇතැම් පොත්පත් ද රැගෙන ටිබෙටය වැනි රටවලට පලා ගිය බවටද විශ්වාස කෙරේ.

### 7.1.3.3 **වලභී විශ්ව විද්‍යාලය**

- බටහිර ඉන්දියාවේ කතියවාර් අර්ධද්වීපයේ භවනගර් අසල පිහිටි වලභී විශ්ව විද්‍යාලය ක්‍රි.ව. 7 වන සියවස වන විට නාලන්දා විශ්ව විද්‍යාලය තරමටම දියුණු තත්ත්වයක පැවතිනි. නාලන්දාව ප්‍රධානතම මහායාන මධ්‍යස්ථානය වූ අතර "වලභී" හීනයාන ප්‍රධාන හීනයාන අධ්‍යාපන මධ්‍යස්ථානය ලෙස සැලකේ.
- වලභී යනු වෙරළ බඩ පිහිටි ප්‍රකට වරායකි. එසේ ක්‍රි.ව. 475 සිට 775 දක්වා රජකළ මෛත්‍රක පරපුරේ රජවරුන්ගේ අගනුවර වූයේද වලභී නුවරයි. මෙම විශ්ව විද්‍යාලය මෛත්‍රක රජවරුන් විසින්ම ගොඩනගා සංවර්ධනය කොට පවත්වාගෙන යන ලද්දකි.
- මෙම විද්‍යායතනය සඳහා පළමුවෙන්ම ගොඩනැගිලි ඉදිකරන ලද්දේ පස්වන සියවසේ දී යයි සැලකේ. එවකට මෙහි අධිපතිත්වය දරන ලද්දේ සථිරමනි හිමියන්ය. ගුණමති හිමියන්ද තත්කාලීනව මෙහි විසූ තවත් පඬිවරයෙක් වන අතර මේ දෙදෙනාම නාලන්දා විශ්ව විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ සේවය කළ අය වූහ. එහෙයින් වලභී විශ්ව විද්‍යාලය ආරම්භ කරන ලද්දේද මෙම දෙපළ විසින් යයි සලකනු ලැබේ.
- ක්‍රි.ව. 7 වන සියවසේ භාරතයට පැමිණි හියුං සියැං හිමිගේ වාර්තාවට අනුව විහාර මන්දිර 100 කින් සැදි මහා විද්‍යාස්ථානයක් වූ මෙහි හයදහසකට අධික ශිෂ්‍ය පිරිසක් නේවාසිකව ඉගෙනීම සිදු කළහ. මොවුන්ගෙන් වැඩි පිරිස හීනයාන සම්මිතිය නිකායට අයත් යයි සැලකේ.
- නාලන්දාව මෙන්ම ජාත්‍යන්තර කීර්තියට පත් විද්‍යාස්ථානයක් වූ වලභී විශ්ව විද්‍යාලයේ ශිල්ප හැදෑරීමට ලෝකයේ විවිධ රටවලින් ශිෂ්‍යයෝ පැමිණියහ. මේ බව චීන සංචාරක ඉත්සිංගේ වාර්තාවල සඳහන් වේ.
- නාලන්දාවේ මෙන්ම මෙහිද විශාල පුස්තකාලයක් පැවති අතර, එහි පැවැත්ම සඳහා ආධාර කළ බව පළමුවන ගුහසේන රජුගේ ශිලා ලිපියක සඳහන් වේ.

- මෙහි විෂය ධාරාව හීනයාන ධර්ම ග්‍රන්ථ හා බුද්ධ ධර්මයට සීමා නොවීය. ඒවා අනිවාර්ය විෂයයන් වූ අතර, වේද, වේදාංග , හින්දු ධර්මය ශාස්ත්‍ර නීති ( දේශපාලන විද්‍යාව)වාර්තා නමින් හැඳින්වූ වාණිජ, කෘෂිකර්මාන්තය යන විෂයයන්ද අර්ථ ශාස්ත්‍රය චිකිත්සා විද්‍යාව ආදී ලෞකික විෂයයන්ද මෙහි විෂය නිර්දේශයට ඇතුළත්ව පැවතිනි.
- ඉහත සඳහන් කළ ස්ථිරමති හා ගුණමති යන ආචාර්යවරුන් දෙපළ නාලන්දාවේ සේවය කොට මෙම විශ්ව විද්‍යාලය ආරම්භ කරන ලද හෙයින් මෙහි කටයුතු ද නාලන්දාවේ පිළිවෙලටම සිදුවූ බව සිතිය හැකිය. මෙහි සේවය කළ කුලපතිවරුන් හෝ ආචාර්යවරුන් පිළිබඳ වාර්තා ලැබී නැත.
- හියුං සියැං වාර්තා හා ඉත්සිංගේ වාර්තා වලට අමතරව වලභී විශ්ව විද්‍යාලය ගැන වාර්තා නැති තරම්ය.
- කෙසේ වුවද ක්‍රි.ව. 475 සිට 1200 දක්වා අඛණ්ඩව කීර්තිමත් හීනයාන විද්‍යායතනයක් ලෙස පැවති වලභී විශ්ව විද්‍යාලයද 13 වන සියවසේ සිදුවූ මුස්ලිම් ආක්‍රමණ නිසා විනාශ විය.

7.1.3.4 වික්‍රමශීලා විශ්ව විද්‍යාලය

- වික්‍රමශීලා විශ්ව විද්‍යාලය නාලන්දා විශ්ව විද්‍යාලයේ අනුග්‍රහය ඇතිව ගොඩනැගුණු නාලන්දාවේම සහෝදර විශ්ව විද්‍යාලයක් ලෙස සැලකේ. මගධයේ නාලන්දාවට සමීපව නැගෙනහිරින් පිහිටි මෙය කොල්ගොං නගරයෙන් සැතපුම් හයක් පමණ උතුරින් පිහිටා ඇත.
- නාලන්දාවේ තාන්ත්‍රික ආචාර්යවරයකු වූ "කාම්පාල" නම් හිමිනමකගේ අදහස් හා උපදෙස් අනුව මෙහි පළමු ඉදිකිරීම් කරන ලද්දේ මගධයේ පාල රජ පරපුරේ ධර්මපාල නම් රජු (770 - 810) විසිනි. තවද මෙම විද්‍යායතනයේ නඩත්තුව පිණිස මෙම රජතුමා විසින් ගම්වර පූජාකොට ඇත. අනතුරුව මෙම ආයතනයේ දියුණුවට බොහෝ උනන්දු වූ රජ කෙනෙකි නයපාල රජු.
- නාලන්දා, වලභී මෙන් ඉතා දියුණු හා සැලසුම් සහගතව සංවර්ධනය කරන ලද වික්‍රමශීලා විද්‍යාලය මහායාන ඉගැන්වීම් පදනම් කරගත් විද්‍යායතනයක් විය.
- විශ්ව විද්‍යාලයේ මැද විද්‍යාගෘහ නමින් හැඳින්වූ දේශන ශාලාවක් විය. ශාලාවට ඇතුලුවීම සඳහා දොරටු හයක් පැවති අතර එම දොරටු වලින් ඔබ්බෙහි සංඝාරාම හයක් විය. එක් සංඝාරාමයක ආචාර්යවරු 180කට නේවාසික පහසුකම් තිබිණ.
- විශ්ව විද්‍යාල භූමිය වටකොට මහා ප්‍රාකාරයක්ද විය.
- වික්‍රමශීලා විශ්ව විද්‍යාලයේ නාලන්දා විෂය මාලාවට බෙහෙවින් සමාන විය. එහෙත් තාන්ත්‍රික ග්‍රන්ථ සහ තාන්ත්‍රික ඉගැන්වීම් වලට මෙම ආයතනය වඩාත් ප්‍රසිද්ධියක් ඉසිලුවේය. ඊට හේතුවන්නට ඇත්තේ වික්‍රමශීලා විශ්ව විද්‍යාලය ආරම්භ කිරීමට මුල් වූයේ නාලන්දාවේ විසූ තාන්ත්‍රික ඉගැන්වීම් පිළිබඳ මහාචාර්ය හිමිනමක් වීමයි.
- මෙහි අභිධර්ම, ව්‍යාකරණ, තන්ත්‍ර යන විෂයයන් සඳහා වෙන් වෙන්වූ

ගොඩනැගිලි ඉදිකර තිබුණි.

- වික්‍රමශීලා විශ්ව විද්‍යාලය සිසුන් ඇතුළත් කරගන්නා ලද්දේ ද්වාර පණ්ඩිත නම් ආචාර්ය මණ්ඩලය මගිනි. මෙම විශ්ව විද්‍යාල ප්‍රවේශයද නාලන්දාවේ සේම ඉතා තියුණු පරීක්ෂණයකින් අනතුරුව සිදුවූ අතර එම ප්‍රවේශ පරීක්ෂණයෙන් සාමාර්ථ වූයේ ඉතා සුළු පිරිසකි.
- වික්‍රමශීලා විශ්ව විද්‍යාලයේ ප්‍රධානාචාර්යවරයා "කුලපති" නමින් හැඳින්වූ අතර දීපංකර ශ්‍රී ඥාන නොහොත් අතිශ (980 - 1053) නම් කුලපති හිමියන් මෙම ආයතනයේ දියුණුවට සුවිශාල සේවයක් සිදුකළ සුපතල කීර්තියක් අත්කරගෙන සිටි විද්වතෙකි.
- නාලන්දාව මෙන්ම ජගත් කීර්තියට පත් මෙම විද්‍යායතනයේත් උපාධි හා පශ්චාත් උපාධි ලැබීම දේශීය සිසුන් මෙන්ම නේපාල, ටිබෙට් ආදී විවිධ රටවලින් ශිෂ්‍යයෝ පැමිණියහ.
- මෙම විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන කටයුතුවල නියැලුණු ශිෂ්‍ය සංඛ්‍යාව හා ඉගැන්වීම් සිදුකළ ආචාර්ය මණ්ඩලය පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු නිවැරදිව සොයාගත නොහැකිය. කෙසේ වුවද ආචාර්ය මණ්ඩලය ආචාර්යවරු 114 දෙනෙකු පමණ ඇතුළත්ව සිටි බවත්, විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රීය කටයුතු හා පරිපාලන කටයුතු මෙම ආචාර්ය මණ්ඩලය මගින් සිදුකොට ඇති බව වික්‍රමශීලා විශ්ව විද්‍යාලය පිළිබඳ ඇති වාර්තාවන්ගෙන් පැහැදිලි වේ.
- අටදහසක් පමණ රැස්වන ශාලාවක් පැවති බවත්, එම ශාලාව පිරී ඉතිරී යන්නට සිසුන් හා ආචාර්යවරුන් රැස්වී උපාධි ප්‍රධානය කළ බවත් සඳහන් වීමෙන්, මෙහි විශාල සිසුන් සංඛ්‍යාවක් අධ්‍යාපන කටයුතුවල නියැලුන බව නිගමනය කළ හැකිය.
- ක්‍රි.ව. 800 පමණ සිට කීර්තිමත් විද්‍යායතනයක් ලෙස ප්‍රසිද්ධියට පත් වික්‍රමශීලා විශ්ව විද්‍යාලයද මුස්ලිම් ආක්‍රමණිකයන් විසින් විනාශ කරන ලදී. 12 වන සියවසේ නාලන්දා විශ්ව විද්‍යාලය විනාශ කරන විට එම ආක්‍රමණිකයන්ම මෙම විද්‍යායතනයද විනාශ කරන ලදී.

### 7.1.3.5 ඕදන්ත පූර් විශ්ව විද්‍යාලය

- නාලන්දාවට සැතපුම් අටක් පමණ උතුරු දිගට වන්නට ඕදන්ත පූර් විශ්ව විද්‍යාලය පිහිටා තිබුණි.
- මෙය ගොඩනගන ලද්දේ ක්‍රි.ව. 750 දී පමණ ගෝපාල රජතුමා විසිනි. මෙයද නාලන්දාව මෙන්ම මහායානික ධර්ම ශාස්ත්‍ර පදනම් කරගත් විද්‍යායතනයක් ලෙස සැලකේ.
- වික්‍රමශීලා විශ්ව විද්‍යාලයේ අධිපති ධූරය දැරූ කීර්තිමත් පඬිවරයෙක් වූ දීපංකර ශ්‍රී ඥාන හිමියන් මහායාන ධර්මය හදාරන ලද්දේ මෙම විශ්ව විද්‍යාලයෙන් යයි පිළිගැනේ.
- ටිබෙට් වාර්තාවලට අනුව දොළොස් දහසක් පමණ ගුරු ශිෂ්‍ය

සේවක පිරිසක් මෙහි වාසය කොට ඇත.

- මෙම විද්‍යායතනය පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු මෙතෙක් ප්‍රකාශයට පත්වී නැත.
- කෙසේ වුවද මෙම ආයතනයද මුස්ලිම් ආක්‍රමණ වලට ලක්ව විනාශ වී ඇත.

7.1.3.6 ජගද්දලා විශ්ව විද්‍යාලය

- උතුරු බෙංගාලයේ වරේන්ද්‍ර දේශයේ අගනුවර වූ රාමාවතී නුවර අසල පිහිටි විශ්ව විද්‍යාලයකි ජගද්දලාව.
- 11 වන සියවසේ පාල රාජ පරම්පරාවට අයත් රම්පාල රජු විසින් මෙම විශ්ව විද්‍යාලය පිහිටුවන ලදී.
- නාලන්දාව වැනි විශ්ව විද්‍යාල තරම් දියුණු තත්ත්වයක නොපැවති මෙය තාන්ත්‍රික බුදු සමය කේන්ද්‍ර කරගත් ආයතනයක් ලෙස සැලකේ.
- තාන්ත්‍රික මධ්‍යස්ථානයක් වුවද නාලන්දාවේ ක්‍රියාත්මක වූ ආකාරයේ අධ්‍යාපන හා පරිපාලන පටිපාටියක් ජගද්දලාවේද ක්‍රියාත්මක වූ බව සැලකිය හැකිය.
- ටිබෙට් බෞද්ධ පොත්පත්වල මෙම විද්‍යායතනය ගැන සඳහන් වේ. ඒ අනුව මෙම ස්ථානයේදී බොහෝ පොත් පත් ටිබෙට් බසට පරිවර්තනය කොට ඇතැයි සැලකිය හැකිය.
- නාලන්දා, හා වික්‍රමශීලා වැනි විශ්ව විද්‍යාල විනාශ වීමෙන් පසුවද ටික කලක් මෙම ආයතනය ක්‍රියාත්මක තත්ත්වයේ පැවත ඇත. ඒ බව පැහැදිලි වන්නේ මුලින් ටිබෙට් දේශයේ බුදුසමය ව්‍යාප්ත කළ දීපංකර ශ්‍රී ඥාන හිමිගෙන් පසු නැවත ටිබෙටයේ බුදුසමයේ සංවර්ධනය උනන්දු වූ ශ්‍රී භද්‍ර තෙරුන් නාලන්දා, වික්‍රමශීලා , ඕදන්ත පුර යන විශ්ව විද්‍යාල විනාශ වී තිබෙනු දැක ජගද්දලාවේදී ශිල්ප හදාරා ඇති බව සඳහන් වීමෙනි.
- ශ්‍රී භද්‍ර තෙරුන්ගේ ශිෂ්‍යයෙක් වූ දාන ශීල තෙරුන්ද ජගද්දලාවේදී ශිල්ප හදාරා ඇති අතර හෙතෙම මහායාන ධර්ම ග්‍රන්ථ 60 ක් පමණ එම විද්‍යායතනයේදී ටිබෙට් බසට පරිවර්තනය කොට ඇත.
- මෙම විශ්ව විද්‍යාලය පිළිබඳවද තොරතුරු ඉතා විරල අතර ක්‍රි.ව. 1207 දී මුස්ලිම් ආක්‍රමණ වලින් මෙම ආයතනයද විනාශ විය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

| | |
|---|---|
| පියවර 1 | 6 - 11 ශ්‍රේණිවලදී සංගායනා පිළිබඳව උගත් දෑ සිසුන්ට සිහිපත් කරවා, එම විෂය කරුණු වඩාත් ගවේෂණාත්මකව හා විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙහිදී සිදුවන බව පැහැදිලි කරන්න. |
| පියවර 2 | සිසුන් කණ්ඩායම් තුනකට යොමුකර ථේරීය සංගායනා තුන පිළිබඳ කරුණු සොයන්නට අවස්ථාව ලබා දෙන්න. පුස්තකාල භාවිතයට යොමු කරන්න. |
| පියවර 3 | සිසුන් එක් රැස් කළ කරුණු පන්ති කාමරයේ සාකච්ඡා කරමින් අලුතින් ඇතුළත් විය යුතු දේ පෙන්වා දෙන්න. |
| පැවරුම | සංගායනා පිළිබඳව සංක්ෂිප්ත වගු සටහන බැගින් සකසා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න. |

මූලාශ්‍රය :

විනය පිටකය ( මහාවග්ගපාලි - මහාක්ඛන්ධකය)
සච්ච විභංග සූත්‍රය - මජ්ඣිම නිකාය
බෞද්ධ ශිෂ්ටාචාරයේ මූලධර්ම හා වංශ කථාව - චන්ද්‍රිම විජේබණ්ඩාර
දෙදහස් පන්සිය වසරක බොදු සමය - වී.ජ්. බාපත් (පරිවර්තනය)

**නිපුණතා මට්ටම 7.2** : අශෝක රජතුමාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය හා එහි ජයග්‍රහණ අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20

**ඉගෙනුම් ඵල** :

- ශාසනික ව්‍යාප්තියට දායක වෙයි.
- ජීවිතය ජය ගැනීමට ධර්මානුකූල පිළිවෙත් ක්‍රියාවට නගයි.
- පරිසරය පිළිබඳ මිත්‍රශීලී ආකල්ප වර්ධනය කර ගනියි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

7.2.1 : අශෝක අධිරාජයා බෞද්ධ රාෂ්ට්‍ර පාලකයකු වශයෙන්

- උපතින් ජෛනයකු වූ අශෝක බුදුසමය වැළඳ ගැනීමෙන් අනතුරුව උදාර ශාසනික මෙහෙවරක යෙදුණේය.
- මෙතෙම චන්ද්‍රගුප්ත හා බින්දුසාර රාජ පරම්පරාව දායාද කළ ජ්‍යේෂ්ඨතම පාලකයකු බව විද්වතුන්ගේ පිළිගැනීමයි.
- ඔහු රණකාමියෙකි. අචංක එඩිතර අයෙකි. මොහු සම්බන්ධව දිව්‍යාවදානයේ සඳහන් තොරතුරුත්, වංශ කථාවල ඇති තොරතුරුත් සම නොවන අවස්ථාද වේ.
- අශෝක පර්යාය නාම රාශියකින් හඳුන්වා ඇත. ඒවා අතර, පියදාස, චණ්ඩාශෝක, පියදසී ලාජා, අශෝක දේවානං ප්‍රිය ප්‍රියදශි , ධර්මාශෝක යන නම් ප්‍රසිද්ධය.
- කාලිංග යුද්ධයෙන් සිදුවූ මිනිස් ඝාතන නිසා කම්පාවට පත්ව සිටී. අශෝක සත් හැවිරිදි නිග්‍රෝධ සාමණේර හිමියන්ගේ ඉරියව් ගති පැවතුම් නිරීක්ෂණය කිරීමෙන් පැහැදී මොග්ගලී පුත්ත තිස්ස හිමියන්ගේ මග පෙන්වීම මත බෞද්ධයකු බවට පත්විය.
- දඹදිව මධ්‍ය දේශය මූලික කොටගෙන දේශාන්තර කරා බුදු දහම ව්‍යාප්ත කිරීමේ මෙහෙවරක නිරත වූ අශෝක රජතුමා බුදු දහමට රජතුමා බුදු දහමට ප්‍රමුඛස්ථානය පිරිනැමූ අතර තමාද බෞද්ධයකු ලෙස කටයුතු කළේය.
- සාංචි, සාරානාත්, යන ස්ථානයන් හි පිහිටුවා ඇති සෙල්ලිපිවල සඳහන්වන අන්දමට භේද භින්න වී සිටි භික්ෂූන් සමගි කළ ශාසන සංශෝධනයක අවශ්‍යතාව පෙන්වා දී එය ක්‍රියාවට නංවා ඇත.
- ලෝකයේ ප්‍රථම බෞද්ධ අධිරාජයා බවටද එතුමා පත්වූ බව මූලාශ්‍රය වලින් පෙනේ.

### 7.2.2 එතුමාගේ ශාසනික මෙහෙය

- බුදු සසුනේ චිරස්ථිතිය පැතූ ධර්මාශෝක රජතුමා බෞද්ධ වෙහෙර විහාර රාශියක් කරවූ බව මහාවංශයේ සහ සමන්තපාසාදිකාවේ ද සඳහන් වේ.
- සාංචි ස්ථූපය එතුමා විසින් ගොඩ නංවන ලද ස්ථූප අතුරෙන් ප්‍රධාන තැනක් ගනී.
- සෙල්ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි ආදිය මගින් මෙන්ම ධර්ම මහා මාත්‍රාවරුන් මගින් ද බුදු දහමේ එන ඉගැන්වීම් ප්‍රචාරය කරන්නට අශෝක රජු කටයුතු කර ඇත.

- අශෝක විසින් පිහිටුවනු ලැබූ 13 වන ගිරි ලිපියෙන් ඔහු ධර්ම මහා මාත්‍යවරුන් පිටත් කර හරිනු ලැබූ ප්‍රදේශ පිළිබඳව සඳහන් කර තිබේ.
- මිනිස් ඝාතන නිසා දැඩි කම්පාවට කලකිරීමට පත් අශෝක දිග් විජය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කරන්නට පෙළඹුන බව ඔහුගේ කාල්සි ගිරි ලිපියෙන් (13) දක්වා ඇත.

- රටවැසියා අතර සදාචාරය වර්ධනය කරනු සඳහා නිලධාරීන් යෙදවූ ඔහු ඔවුන්ට ඒ සඳහා උපදෙස් සපයා ඇත. ඒ බව ගිර්නාර් (3) ගිරි ලිපිය සාක්ෂි දරයි.
- අශෝක බෞද්ධයකු වුවද බෞද්ධාගමිකයන්ට පමණක් නොව අනෙකුත් ආගමිකයන්ටද අවශ්‍ය පහසුකම් සලසා දී ඇත. බරාබර් ගුහා ලිපි තුනකින් ආජිවකයන්ට ආරාම (ලෙන්) පිදූ බව කියැවෙයි. ගිර්නාර් (07) ගිරි ලිපියෙන් දක්වා ඇත්තේ සෑම ආගමිකයකු කෙරෙහිම සමානාත්මතාවය ඇති කරගත යුතු බවය.
- අශෝකගේ රාජ්‍ය කරණයේදී ධාර්මිකත්වය, ශ්‍රද්ධාව , බුද්ධිය මැනවින් ප්‍රකට වේ.
- සංඝ සමගිය ඇතිකොට භික්ෂු සංඝයා ප්‍රතිසංවිධානය කිරීමෙන් අනතුරුව පැවැත්වූ තුන්වන ධර්ම සංගායනාව ද ධර්මාශෝක රජතුමාගේ ශාසනික සේවය විදහා පාන විශේෂ සිදුවීමකි.
- සංගීතිය අවසානයේ මොග්ගලී පුත්ත තිස්ස මහ තෙරණුවන්ගේ උපදෙස් ඇතිව ප්‍රධාන වශයෙන් රටවල් නවයකට ධර්ම දූතයන් පිටත්කර යැවීමට ද අශෝක දායකත්වය සපයා ඇත.
- සිය දරු දෙපළ සසුන් ගත කිරීමටද අශෝක රජු පියවර ගත්තේය. ලක්දිවට බුදු දහමේ උතුම් දායාදය හඳුන්වාදුන් මිහිඳු මහ රහතන් වහන්සේ සහ ජයසිරිමහා බෝධිය වැඩමවා භික්ෂුණී ශාසනය ඇති කළ සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ එම දරු දෙපළ ලෙස මූලාශ්‍රයවල පෙන්වා දී ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

පියවර 1 : අප්පමාදො අමතපදං
පමාදො මච්චුනෝ පදං
අප්ප මත්තා න මීයන්ති
යේප මත්තා යථා මතා යන ගාථාව ගයමින් පාඩමට ප්‍රවිශ්ට වී , මේ ගාථාව ශ්‍රවණය කිරීමෙන් බෞද්ධ වූ අධිරාජ්‍යයකු දන්නේ දැයි සිසුන් විමසා ලැබෙන පිළිතුර ඔස්සේ සාකච්ඡාව ආරම්භ කරන්න.

පියවර 2 : අශෝක අධිරාජ්‍යයාගේ මුල් වකවානුව, රාජ්‍ය පාලනය හා බෞද්ධයකු වූ පසු සිදු කළ සේවාව පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 3 : ඉහත අවස්ථාවන්හි සිදුවීම් ලේඛනගත කරන්නට සිසුන් යොමු කරන්න.

පියවර 4 : සිසුන් සැකසූ ලේඛන සංවාදයට ගෙන තවත් කරුණු එක් කරමින් ශිෂ්‍ය දැනුම පෝෂණය කරන්න.

පැවරුම : අශෝක රජු බුදු සමය වැළඳ ගැනීම පිළිබඳ කථා පුවත විස්තර කර , අශෝක ධර්මයෙහි අන්තර්ගත බෞද්ධ ඉගැන්වීම් ලේඛනගත කරන්න.

මූලාශ්‍රය :
දීඝ වංශය
මහා වංශය ( 13 පරිච්ජේදය)
සමන්ත පාසාදිකාව
ශාසන ඉතිහාසය (දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව)
අශෝක සිරිත -

**නිපුණතා මට්ටම 7.3** : කණිෂ්ක රජතුමාගේ ශාසනික මෙහෙය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 12

**ඉගෙනුම් ඵල** :
- ශාසන චිරස්ථිතියට දායක වෙයි.
- ආගමික ඉගැන්වීම් අධ්‍යයනය කරයි.
- ධර්මය ව්‍යාප්ත කිරීම කෙරෙහි යොමු වෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

7.4.1 : කණිෂ්ක රජතුමාගේ ශාසනික සේවය

- ධර්මාශෝක රජතුමාගෙන් පසුව බුදු සසුනේ දීප්තිමත් යුගයක් ලෙස සැලකෙන්නේ කණිෂ්ක රජතුමාගේ රාජ්‍ය කාලය වේ.
- කුෂාණ රාජවංශයේ ශ්‍රේෂ්ඨතමයා ලෙස සැලකෙන මෙතුමා දෙවන අශෝක හැටියට ද ඇතැම් විචාරකයින් විසින් හඳුන්වා දී ඇත.
- ශිව භක්තිකයකු වූ කඩ්ෆිෂස් (කඩ්ෆිසිස්) රජුගේ රාජ්‍ය යුගය අවසානයේ කණිෂ්ක රජවී ඇත. ඉන්පසු ඔහු විසින් පුරුෂ පුරය රාජධානිය කර ගන්නා ලදී.
- කණිෂ්කගේ රාජ පරම්පරාවේ අය හින්දු භක්තිකයන් වූවද ඔහු රජ වීමත් සමඟම ඔවුහු බෞද්ධයන් වූහ. ඒ බව හියුං සාං ද වාර්තා කර ඇත. අවුරුදු 42ක් කණිෂ්ක රාජ්‍ය කාලය වේ.
- කණිෂ්ක රජතුමන් විසින් අඩි 500 උසට විශාල චෛත්‍යයක් ගොඩ නගා සර්වඥ ධාතු නිදන් කළ අතර එහි අටනැලියක ප්‍රමාණ ධාතු ඇතුළත් යයි සැලකේ. ඔහුගේ යුගයේ භාවිත කාසිවල බුද්ධ රූපය දැකිය හැකිය.
- රජතුමා විසින් පුරුෂ පුරයේ සුවිශාල බෞද්ධ ආරාමයක් කරවූ බවත්, එය එතුමාගේ මරණින් පසුවද බොහෝ කලක් ගතවනතුරු පැවති බවත් වාර්තා වී ඇත.
- කණිෂ්ක රජතුමාගේ රාජ්‍ය සභාව වසුමිත්‍ර, පාර්ශ්ව, නාගාර්ජුන. අශ්වඝෝෂ වැනි ශ්‍රේෂ්ඨ බෞද්ධ පඬිවරුන්ගෙන් දීප්තිමත් විය.
- කාශ්මීරයේ කුණ්ඩල වන විහාරයේදී පාර්ශ්ව තෙරණුවන්ගේ ප්‍රධානත්වයෙන් සිව්වන ධර්ම සංගායනාව පැවැත්වීමට කණිෂ්ක රජු අනුග්‍රහ දැක්වීය.
- එම සංගායනාවේදී සාකච්ඡා කරන ලද සූත්‍ර හා විනය ඇතුළත් කර උපදේශ ශාස්ත්‍ර, විනය විභාෂා ශාස්ත්‍ර නමින් ග්‍රන්ථ දෙකක් සම්පාදනය වූ අතර කණිෂ්ක රජතුමන් විසින් එම කෘති තඹපත් වල ලියවා ගල්පෙට්ටියක බහා නිදන් කොට මහ සෑයක් කළ බව වාර්තා වේ.
- එම චෛත්‍යය අදත් කාශ්මීරයේ පවතී.
- කණිෂ්ක රජතුමාගේ අනුග්‍රහය ඇතිව පවත්වන ලද සිව්වන සංගීතියෙන් පසුව මධ්‍යම ආසියාවේ ධර්ම ප්‍රචාරක සේවාවක් ආරම්භ කරන ලදී.
- සිවුවන සංගීතිය සර්වාස්තිවාදී සංගීතිය ලෙස හැඳින්වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

පියවර 1 අශෝක අධිරාජ්‍යයා ගැන කරුණු සිහිකර එවැනි වූ රාජ්‍ය පාලකයකු පිළිබඳව දන්නේදැයි විමසමින් පාඩමට ප්‍රවේශ වන්න.

පියවර 2 කණිෂ්ක නම් වූ මේ රජතුමාගේ පෞද්ගලික ජීවන තොරතුරු සාකච්ඡා කරන්න.

පියවර 3 සාකච්ඡාවට ලක්වූ කරුණු ලේඛන ගත කරන්නට සිසුන් යොමු කරන්න.

පියවර 4 ලේඛන ගත කරන ලද කරුණු පෝෂණය වන පරිදි සිසුන් සමඟ නැවත සාකච්ඡා කරන්න.

පැවරුම අශෝක හා කණිෂ්කගේ තොරතුරු සංසන්දනය කරන වගුවක් සකස් කරන්න.

**මූලාශ්‍රය** :

මධ්‍ය ආසියාවේ බුදු සමය - මංගල ඉලංගසිංහ
ශාසන ඉතිහාසය - දහම් පාසල් අවසාන විභාගය බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
බෞද්ධ ලෝකය - බඹරැන්දේ සිරි සීවලී හිමි
ලෝක බෞද්ධ සංස්කෘතිය - වැල්ලවත්තේ ආනන්ද හිමි

**නිපුණතාව 8.0** : බෞද්ධ ශිෂ්ටාචාරය ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයට පදනම් වූ ආකාරය විමසා බලමින් එහිලා ලාංකේය රජවරුන්ගේ දායකත්වය ආදර්ශයට ගනී.

**නිපුණතා මට්ටම 8.1** : මහින්දාගමනය සහ ප්‍රාග් මහින්ද යුගයේ පැවති විශ්වාස අධ්‍යයනය කර බුදු සමය නිසා හැඩගැසුණු ලාංකේය සමාජයේ සාරධර්ම, වත් පිළිවෙත් හා සිරිත් විරිත් විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 26

**ඉගෙනුම් ඵල** :

- සාරධර්ම , වත් පිළිවෙත් , සුරකින අගය කරන පුද්ගලයෙක් බවට පත්වෙයි.
- සංස්කෘතික දායාද සුරකියි.
- නිර්මාණශීලී පුද්ගලයකු වෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

8.1.1 : ප්‍රාග් මහින්ද යුගයේ පැවති ඇදහිලි විශ්වාස සහ බුදු සමය ඒ කෙරෙහි දැක්වූ ආකල්ප

- ප්‍රාග් බෞද්ධ යුගයේ ලංකාවේ තොරතුරු සපයා ගැනීම උගහට වුවත්, පුරාවස්තු, චිත්‍ර නිර්මාණ, වංශ කථා, ජනකථා ආදී වූ මූලාශ්‍රය අධ්‍යයනයෙන් කරුණු සපයා ගත හැකිවේ.

- මහින්දාගමනයට පෙර ලක්දිව දෙවියන් ඇදහීම, ප්‍රචලිතව පැවති බව දැක්වීමට අවස්ථා රාශියක් මුල්කොට ගත හැකිය. ධෘතරාෂ්ට, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ නම් වූ සතර වරම් දෙවිවරුන්ගෙන් බලවත්ම දෙවියා හැටියට වෛශ්‍රවණ පිළිගෙන ඇත. යකුන්ගේ අධිපතිත්වය හිමි වූ මොහු ධනයට ද මූලික වේ. මෙම දෙවියා සඳහා නගරයේ බස්නාහිර දොරටුව සමීපයේ පැවති නුග ගසක් වෙන් කොට තිබිණ. මහායාන ඉගැන්වීම අනුවද මොහු දේවත්වයෙන් පිදේ.
- ශ්‍රී පාද ස්ථානයට අධිපති වූ සුමන සමන් දෙවියන් ගැනද පුරාවෘත්තයන්හි සඳහන් වේ. මෙතෙම බෝධිසත්වවරයකු හැටියට ද පිළිගැනේ. වර්තමාන යුගයේ පවා සමන් දෙවියන්ට ලැබෙන්නේ වැදගත් ස්ථානයකි.
- යකුන් හා යකිනියන් පිළිබඳව විවිධ විශ්වාස පැවති බව පහත සිදුවීම් විමසීමේදී පෙනී යයි. පණ්ඩුකාභය රජු විසින් කාලවේල, චිත්තරාජ යන යකුන් දෙදෙනාටත්, වලවාමුඛී යක්ෂණියටත් දෙවොල් කරවා දී ඇති බව වංශකථා සඳහන් කරයි.
- නුවරට නැගෙනහිර දිශාවෙන් කාලවේල යකාටද, අභය වැවේ පහළ ප්‍රදේශයෙන් චිතතරාජ යකාටද දේවාල කරදී රජගෙය තුළම වළවා මුඛී සඳහා දෙවොලක් කරවා ඇත.

- ප්‍රාග් මහින්ද යුගයේ වෘක්ෂ වන්දනාව ද පැවති බව පැහැදිලිය. පණ්ඩුකාභය රජු කුවේණියට නුග ගසකුත් , ව්‍යාධ දේවයාට තල් ගසකුත් වෙන් කොට ඒවාට පුද පූජා පැවැත්වූ බව සඳහන් වේ. නා, බෝ, නුග වන්දනීය වෘක්ෂ ගණයට අද සමාජයේ පවා පිළිගනී. වර්තමානයේ පවා වෘක්ෂයන් වෙත කෙරෙන වන්දනාවන් පවතී.
- ජෛන ආගමික ඉගැන්වීම් මෙන්ම බමුණු ඉගැන්වීම් ද මෙකල ව්‍යාප්තව පැවතිණ. බමුණන් උගතුන් ලෙස පිළිගැනුන අතර විජය රජු ඔහුගේ පුරෝහිත ලෙස පත්කර ගැනුණේද උපතිස්ස නම්වූ බ්‍රාහ්මණයෙකි. බමුණු දහම තුළ පිළිගැනෙන ත්‍රිත්ව සංකල්පය ඇදහීමට යොමුවී ඇත. ත්‍රිත්වය නම් බ්‍රහ්ම, විෂ්ණු, ඊශ්වර නම් දේව සංකල්ප තුනයි.
- සිවිකාශාලා, සොත්ථි ශාලා නම් වූ ස්ථානවල ශිව ලිංගය පිහිටුවා වන්දනීය ස්ථාන ලෙස නම් කර තිබීමෙන් පෙනී යන්නේ ශිව ලිංගය පිදීම ද එකල වූ බවයි.
- නාග වන්දනය පැවති බවට චූලෝදර - මහෝදර අතීත පුරා වෘතය දැක්විය හැකිය. හමුව ඇති නාග කැටයම් අනුව ද එකල නාග වන්දනය පැවති බවට පිළිගත හැකිය.

8.1.1.2 දේශීය සංස්කෘතිය බුදුසමයේ ආභාෂයෙන් ගොඩනැගුණු අයුරු

- මහින්දාගමනයෙන් පසු දෙවියන් හා මළවුන් පිදීම ඔවුනට පිංදීම බවට පරිවර්තනය වු අතර වෘක්ෂ වන්දනාව බෝධි වන්දනාව බවට පත්විය.
- මෛත්‍රී කරුණා ගුණ පෙරදැරිව - සමානාත්මතාවයෙන් පිරුණු සමාජයක් බිහි කිරීමට මහින්දාගමනය උපකාර විය. ඒ අනුව ශ්‍රී ලාංකිකයෝ සැහැල්ලු දිවිපෙවෙතක් ගත කිරීමට පෙළඹුණහ.
- පැරණි ඇදහිලි හා විශ්වාසයන්ගේ නිස්සාරත්වය තේරුම් ගැනීමට මිනිසාට අවශ්‍ය මඟපෙන්වීම කෙරුණ අතර - සිය චින්තන ශක්තිය මත , බුද්ධි මත්ව තීරණගෙන කටයුතු කරන්නට අවශ්‍ය වටා පිටාව සැකසිණ.
- ශ්‍රී ලාංකිකයන් සත්ව ඝාතනය හා හිංසාව පිළිකුල් කොට අවිහිංසාව අගය කරන්නට පෙළඹීම - මාඝාත ආඥාව නීතිගත වීම තුළින් පෙනේ. විවේකය විධිමත්ව ගතකරන්නට පෙළඹුන අතර ධර්ම ශ්‍රවණය අගය කරන ලදි. බුදු සිරිතට සම්බන්ධ දුරුතු - බක්, වෙසක් - පොසොන් ඇසල ආදී වූ පොහොය දිනයන් ආගමික වතාවත්වල නිරතවීම සඳහා වෙන් කර ගැණුනි.
- පිරිත් සජ්ඣායනය තුළින් ආපදාපන්න අවස්ථාවල ආරක්ෂාව සලසා ගන්නට කටයුතු කෙරිණ. පන්සල ආගමික කේන්ද්‍ර ස්ථානය බවට පත්විය.
- ලක්වැසියන්ගේ සාක්ෂරතාව වර්ධනය සඳහා බ්‍රාහ්මී අක්ෂරයන්ගේ බලපෑම හා භාවිතය ලංකාවේ සිදුවූ වඩාත් වැදගත් පරිවර්තනයකි.

8.1.2 : මහා විහාරය හා අභයගිරිය කේන්ද්‍රකර බිහිවූ ආගමික සමාජීය සංස්කෘතික ලක්ෂණ

- මහා විහාරය හා අභයගිරිය බෞද්ධ මූලස්ථාන වශයෙන් මෙරට සමාජ, ආර්ථික, සංස්කෘතික පුනරුදයට පුරෝගාමී සේවාවක් සපයා ඇති බව ද කරුණු හැදෑරීමේදී ප්‍රකට වේ.

8.1.2.1 : මහා විහාරය

- දෙවන පැතිස් රජු මහ මෙවුනා උයන පූජා කිරීමෙන් පසු එම භූමිය තුළ මහා විහාරය ඉදිවිය.
- රජතුමා නගුලකින් සී සාමින් මහා විහාර සීමාව ලකුණු කළ අතර මහා විහාර භූමියේ ඉදිකළ විවිධ ආගමික ගොඩනැගිලි විශාල ප්‍රමාණයක නටඹුන් අදත් දැකගත හැකිය.
- ථෙරවාදී බෞද්ධ ලෝකයේ ආගමික හා අධ්‍යාපන කේන්ද්‍රය ලෙස ශතවර්ෂ ගණනාවක් මහා විහාරය පැවතියේය. නේවාසික හා බැහැරින් පැමිණි විශාල භික්ෂු සමූහයක් මේ මහා විහාරයේ විසූ බවද, අධ්‍යාපන කටයුතු සිදු කළ බවද වංශකථා වලින් පැහැදිලි වේ.
- ඉන්දීය ගුප්ත යුගයේ නිර්මාණවල ආභාසය මහා විහාර ගොඩනැගිලි ඉදිකිරීමට බලපා ඇති බව පෙනේ.
- මහමෙවුනාවේ ඉදිවූ ගොඩනැගිලිවල මේ ලක්ෂණ දැඩිව දක්නට ලැබේ.
- දෙවන පැතිස් රජුගේ රාජ්‍ය යුගයෙන් පසු දුටුගැමුණු රජතුමා මහා විහාරයට විශාල වශයෙන් උදව් උපකාර කර ඇත. මෙතුමා මහා විහාරය සංවර්ධනයට දැඩි කැපකිරීමක් කර තිබේ. දුටුගැමුණු රජතුමා මහා විහාර භූමියේ පිහිටවූ චෛත්‍ය, ගොඩනැගිලි එම භූමියට තේජවත් බවක් හා අලංකාරයක් සැපයීය.

- ශ්‍රී ලංකාවේ ආර්ථික, දේශපාලන, සමාජ, සංස්කෘතික හා අධ්‍යාපනික පුනරුදය සඳහා මහා විහාරය මුල් වී ඇත.

- දේශීය බසින් ධර්මය විවරණය කිරීම සඳහා මහා විහාරිකයන් හෙළ අටුවා වන්ද, පස්වැනි සියවසේ දී පාලි අටුවාවන් ද රචනා කොට තිබේ.
- ක්‍රි.ව. 411 දී බුද්ධඝෝෂ, බුද්ධදත්ත වැනි විදේශීය පඬිවරු අධ්‍යයන කටයුතු සඳහා මහා විහාරයට පැමිණි අතර ධර්මධර විනයධර උගතුන්ගෙන් මහා විහාරය පිරී පැවතින.
- පාහියන් වැනි භික්ෂූන් මහා විහාරයේ ආභාෂය ලැබූ බව සඳහන් වන අතර මහා වංශය මහා විහාර භික්ෂුවකගේ ලේඛනයක් ලෙස පිළිගැනීම සිදුවේ.
- මහා විහාර භික්ෂූන් වහන්සේලා විසින් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන තෙක්ම කට පාඩමින් පවත්වාගෙන ඒමට කටයුතු කර ඇති අතර ඒ සඳහා දරණ ලද කැපවීම ඉමහත්ය. ඞ

### 8.2.1.2 අභයගිරිය

- ක්‍රි.පූ. 89 දි පමණ වළගම්බා රජු විසින් අභයගිරිය ඉදිකරවා ඇත. මහා වංශ පුවතට අනුව සතුරන්ගෙන් මිදී පලායන වළගම්බා රජු දුටු ගිරි නම් නිගණ්ඨයා තමාට අපහාසාත්මකව කරන ලද ප්‍රකාශය රජුට තදින් කාවැදිණ. පසු කල රජතුමා නැවත ලක්දිව බලය ලබා ගැනීමෙන් පසුව නිගණ්ඨ ආශ්‍රමය බිඳ දමා එහි අභයගිරිය කරවූ බව සඳහන් වෙයි.
- පසු කාලයේදී අභයගිරිය මහායානයට අයත් වෛතුල්‍ය වාදය, වාජ්රීය වාදය, වැනි ඉගැන්වීම් පිළිගත් ස්ථානය බවට පත්විය.
- ගජබා රජතුමා (ක්‍රි.ව. 114 - 136) අභයගිරියේ ප්‍රයෝජනය සඳහා ගාමණීතිස්ස නමින් ජලාශයක් බඳවා දි ඇත.
- කණිටු තිස්ස රජු (ක්‍රි.ව. 167 - 186) අභයගිරිවාසී මහානාග තෙරුන්ට රත්න ප්‍රාසාද නම් මන්දිරයක් කරවා දී ඇත.

- මහසෙන් රජු (ක්‍රි.ව. 274 - 301) අභයගිරි පක්ෂය ගෙන මහා විහාරය විනාශ කර එහි වූ දේ අභයගිරියේ දියුණුවට යෙදවූ බව සඳහන් වේ.
- මෙහිදී ථූපාරාමයේ පිහිටුවා තිබූ මහා කාලාශිලා ප්‍රතිමාව අභයගිරියට ගෙන ගොස් ඇත. එමෙන්ම මහා විහාරයට අයත්ව තිබූ සැගිරිය හා පූර්වාරාමයේ භාරකාරත්වයද අභයගිරියටම පවරා දී ඇත.

- සිරිමෙවන් රජු දවස අභයගිරියේ භික්ෂූන් 5000ක් පමණ වාසය කොට ඇති අතර මේ කාලයේ ලංකාවට වැඩම වූ දළදා වහන්සේ වර්ෂයකට වරක් අභයගිරියට වැඩමවා පූජෝපහාර පැවැත්වූ බව සඳහන් වේ.
- විජයබා රජු (ක්‍රි.ව. 1055 - 1110) අභයගිරියට අනුබද්ධව උත්තරමූල පිරිවෙන කරවූ අතර මේ කාලය තුළ අභයගිරියේ ශ්‍රී විභූතිය වඩාත් ප්‍රකට වූ බවද පෙනේ.

- මහායාන අදහස් ඇසුරින් උපන් විවිධ බෞද්ධ ඇදහිලි සිරිත් විරිත් උත්සව ආදිය ප්‍රචලිත කළ අභයගිරිය මෙරට සංස්කෘති සංවර්ධනයට මුල් විය.
- අනුරාධපුර රාජධානියේ පරිහානියත් සමඟ අභයගිරිය ද පිරිහී ගියේය. ඒ දහතුන්වන සියවසේ දී පමණය.

8.1.3 ශ්‍රී ලාංකේය සමාජ ධර්ම වත් පිළිවෙත් සහ සිරිත් විරිත්

- සමාජ ධර්ම හා වත් පිළිවෙත් කිසියම් සංස්කෘතියක ඉතා වැදගත් හා සක්‍රීය අංග ලෙස පිළිගැනේ.
- මාපිය දූදරු, ගුරු සිසු , ස්වාමි - භාර්යා, ගිහි පැවිදි ආදී වශයෙන් සමාජ සබඳතා තහවුරුවන සමාජ ධර්ම මෙරට සමාජය තුළ වර්ධනය වීමට බෞද්ධ පසුබිම උපකාරවත් වී ඇත.
- ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට සැලකීම, දුකට පත්වූවන්ට පිහිටවීමාදි උසස් ආචාරධර්ම ද බෞද්ධ ඉගැන්වීම් මත පෝෂණය ලබා සමාජ ගත වී තිබේ.
- දන්දීම , පුද පූජා කිරීම හා බොහෝ වත් පිළිවෙත් ඉතා පුළුල් ලෙස බෞද්ධ මුහුණුවරින් ව්‍යාප්ත විය.
- එම වත් පිළිවෙත් හා සමාජ ධර්ම මානව දයාව, අන්‍යොන්‍ය සුහදත්වය, ආචාරශීලීත්වය ආදී උසස් ගුණ ධර්ම වර්ධනයට පිටුබලයක් විය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

පියවර 1: බුදුරදුන්ගේ ලංකා ගමන් සිහිපත් කර ලංකාවේ බුදු සසුන පිහිටියේ දැයි විමසමින් පාඩමට පිවිසෙන්න. මිහිදු හිමියන්ගේ ලංකා ගමනයට පෙර යුගය ප්‍රාග් මහින්ද යුගය ලෙස හඳුන්වන බව පෙන්වා දෙමින් එම යුගයේ සමාජයේ පැවැති ප්‍රාථමික ආගමික හා සාමාජික ලක්ෂණ සාකච්ඡා කරන්න.

පියවර 2 බුදු සමය ලංකාවට හඳුන්වා දීමත් සමඟ සිදුවූ ආගමික හා සමාජමය විපර්යාස පිළිබඳව සිසුන් විමසන්න.

පියවර 3 ඉහත එසේ ලබාගත් තොරතුරු සංවර්ධනාත්මකව සිසුන්ගේ දැනුමට එක් කරන්න.

පැවරුම ප්‍රාග් මහින්ද යුගයේ ඇදහිලි මහින්දාගමනය නිසා බෞද්ධ මුහුණුවරක් ගත්තේය. යන මාතෘකාවට රචනයක් ලියන්න.

(වැදගත් : ඒ ඒ විෂය උපකොටස් සඳහා සුදුසු ක්‍රමවේද අනුගමනය කිරීමට ගුරු භවතාට අවකාශ ඇත.)

මූලාශ්‍රය : මහා වංශය

බෞද්ධ ශිෂ්ටාචාරයේ මූලධර්ම හා වංශ කථාව - චන්ද්‍රිම විජේබණ්ඩාර

මිහිදු සංස්කෘතිය- බුද්ධ ශාසන අමාත්‍යාංශය

අපේ සංස්කෘතිය - බද්දේගම විමලවංස හිමි

භාරතීය ධර්ම ශාස්ත්‍ර හා සිංහල සිරිත් විරිත් - හිත්තැටියේ උදිත හිමි

ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය - වල්පොල රාහුල හිමි

පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය - ඊ.ඩබ්. අදිකාරම්

**නිපුණතා මට්ටම 8.2** : රාෂ්ට්‍ර පාලනය කෙරෙහි බෞද්ධ බලපෑම දේවානම් පියතිස්ස රාජ්‍ය සමයේ සිට මහසෙන් රාජ්‍ය සමය තෙක් විමසීමට ලක් කරයි.

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලංකාවේ ශාසනික උන්නතියට රජවරුන්ගෙන් ලැබුණු අනුග්‍රහය අගය කරයි.
- රාජ්‍ය පාලනය සඳහා වන බෞද්ධාගමික ඉගැන්වීම් අධ්‍යයනය කරයි.
- බෞද්ධාගමික දේශපාලන පිළිවෙත් රාජ්‍ය පාලනය තුළ ක්‍රියාත්මක කරවීමට උත්සුක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 18

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්:**

8.2.1 : රාෂ්ට්‍ර පාලනය කෙරෙහි බෞද්ධ බලපෑම දේවානම් පියතිස්ස රාජ්‍ය සමයේ සිට මහසෙන් රාජ්‍ය සමය තෙක් ක්‍රියාත්මක වූ බෞද්ධ දේශපාලන මූලධර්ම හා ඒවායේ භාවිතය

- දසරාජ ධර්ම, දස සක්විතිවත්, සතර සංග්‍රහ වස්තු සප්ත අපරිහානිය ධර්ම සතර අගතිවලින් ඈත්වීම ආදී රාෂ්ට්‍ර පාලන ප්‍රතිපත්ති රැසක් බුදු දහමේ උගන්වා ඇත.

- දානං, සීල පරිච්චාගං - අජ්ජවං මද්දවං තපං
  අක්කෝධං අවිහිංසඤ්ච - ඛන්තිඤ්ච අවිරෝධනං යන ජාතක පාළි 4000 ගාථාවේ සඳහන් වන දසරාජ ධර්ම රාජ්‍ය පාලනය උදෙසා භාවිතා කළ හැකිය.
- පාලකයා දස කුසලයේ යෙදෙමින් ධර්මානුකූලව ප්‍රතිපත්තිගරුකව සිට අඹුදරුවන්ද එහි පිහිටුවා, ඔවුන්ට සංග්‍රහ කරමින් රැක බලා ගැනීම.
- තම බල සේනාවට නිසි සංග්‍රහ පවත්වා රැකගැනීම.
- තමාගේ රාජතාන්ත්‍රිකයන්ට නිසි සංග්‍රහ පවත්වා රැකගැනීම.
- බ්‍රාහ්මණ ගෘහපතියන්ද නිසි පරිදි සංග්‍රහ පවත්වා රැක ගැනීම.
- විසින් ශ්‍රමණ ගහපතියන්ට නිසි සංග්‍රහ පවත්වා රැකගැනීම.
- තමාගේ ගම් දනව් වැසියන්ට නිසි සංග්‍රහ පවත්වා රැකගැනීම.

- සිව්පා, පක්ෂි ආදීන්ට අභය දානය දී ආරක්ෂා කරගැනීම.
- තමාගේ පාලන ප්‍රදේශයේ අධාර්මික ක්‍රියා සිදු නොවන අයුරින් ක්‍රියා කිරීම.
- දිළිඳු ජනයාට ධනය ලබා දෙමින් ඔවුන් රැකබලා ගැනීම.
- සිල්වත් වූ මහණ බමුණන් කරා ගොස් අවවාද අනුශාසනා ලබා ගැනීම යන මේ පිළිවෙත් දහය අනුගමනය කරන ඔහු ජනහිතකාමී

අයෙකු වෙයි. පාලකයා රටේ ජනතාවගේ පමණක් නොව මෘග පක්ෂීන්ගේද ආරක්ෂකයා බව මෙයින් අවධාරණය කෙරේ.

- මෙම සක්විති වත් දහය සමස්තයක් ලෙස ගෙන කරුණු හතරක් දක්වා සංක්ෂිප්ත කළ හැකිය. ධාර්මික රාජ්‍ය පාලනය,ජනතාවගේ හා අනෙකුත් සතුන්ගේ ජීවත්වීමේ ඇති අයිතිය සුරක්ෂිත කිරීම , ආර්ථික සමෘද්ධිය , ඇතිකිරීම , ගරුකටයුත්තන් - පිදිය යුත්තන් පිදීම අවවාද අනුශාසනා ලබා ගැනීම හා ඔවුන්ගේ සදුපදේශයන්ට ගරුකිරීම වශයෙනි.
- දැහැමි වූ බෞද්ධ රාජ්‍ය පාලනයකදී සතර සංග්‍රහ වස්තු හෙවත් සිව් සඟරාවත අත්‍යවශ්‍යම අංගයකි. දානය, ප්‍රියවචනය, අර්ථචරියාව, හා සමානාත්මතාව එම හතරයි. මේ කරුණු හතර අනුගමනය කරන රජතුමා, වෙත මෙත්තා ,කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණ වර්ධනය වේ. එමගින් රජු හා ජනතාව අතර පිය පුතු සංකල්පය වර්ධනය වෙයි.
- යහපත් වු රාජ්‍ය පාලනයක් සඳහා ලිච්ඡවී පාලකයන් සම්මත කොටගෙන පවත්වාගෙන ගිය සප්ත අපරිහානීය ධර්ම ද බෞද්ධ පාලනයක මූලධර්ම වේ. නිතර රැස්වීම, සමඟියෙන් රැස්වී සමඟියෙන් කටයුතු කර සමඟියෙන් විසිරයාම, නොපැනවූ නීති නොපැනවීම හා පැනවූ නීති කඩ නොකිරීම, වැඩිහිටියන්ට ගරු කිරීම, අවිවාහක කුල කුමරියන්ට ආරක්ෂාව සැලසීම, පාලන ප්‍රදේශය හා ඉන්පිටත ආගමික ස්ථානවලට ගරුකිරීම , තම පාලන ප්‍රදේශයට පැමිණෙන රහතන් වහන්සේට පහසුකම් හා ආරක්ෂාව ඇති කිරීම යන මේ කරුණු පාලක පක්ෂය සතුව තිබීම ජනහිතකාමී රාජ්‍ය පාලනයකට උපකාර වෙයි.
- ඡන්දය, ද්වේශය, භය, මෝහය යන සතර අගතියෙන් වැලකී, කටයුතු කිරීම පාලකයකුගෙන් අපේක්ෂා කෙරේ. සතර අගතියෙන් යුක්ත වූ පාලකයාට සතුරෝ බහුල වෙත්. ඔහු ජනහිතකාමී ද නොවේ. එකල නිසි පරිදි රාජ්‍ය තන්ත්‍රය මෙහෙය විය නොහැකිය.
- මෙම ඉගැන්වීම් හා ධර්මාශෝක අධිරාජ්‍යයාගේ සබඳතා ද, මිහිදු මාහිමියන්ගේ අනුශාසනාදිය ද ඔස්සේ ලක්දිව රාජ්‍ය පාලනයට බෞද්ධ බලපෑම ඇති විය.
- දෙවන පැතිස්, වළගම්බා, කාවන්තිස්ස, දුටුගැමුණු යනාදී රජ දරුවන් ඉහත කී බෞද්ධ දේශපාලන පිළිවෙත් පදනම් කොටගෙන රාජ්‍ය පාලනය කර ඇත.
- මෙරට රාජ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියා මාර්ග බුදු සසුනටත්, බුදු සසුන රාජ්‍ය ප්‍රතිපත්තිවලටත් විවිධාකාරයෙන් බලපා ඇති අතර එමගින් සාමකාමී පාලන තන්ත්‍රයක් ගොඩනැගුණු වකවානු හඳුනාගත් බව ඉතිහාසයෙන් පෙනේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

පියවර 1 "දේවෝ වස්සතු කාලේන - සස්ස සම්පත්ති හේතු ච
පීතෝ භවතු ලෝකෝච - රාජා භවතු ධම්මිකෝ "
යන ගාථාව පන්ති කාමරයේ ප්‍රදර්ශනය කර ඒ ගැන
සිසුන්ගෙන් අදහස් විමසමින් පාඩමට ප්‍රවේශ වන්න.

පියවර 2 රජුගේ ධාර්මිකත්වය උදෙසා බුදු දහමෙන් අනුදැන ඇති
ධර්ම කරුණු මොනවාදැයි විමසා ඒවා පැරණි රාජ්‍ය
තන්ත්‍රයන්හි මෙන්ම වර්තමාන රාජ්‍ය තන්ත්‍රයන්හි ද
ක්‍රියාත්මක වන්නේ දැයි සිසුන් විමසන්න. සිසුන්
සංවාදයකට යොමු කරන්න.

පියවර 3 සිසුන් ඉදිරිපත් කරන ලද අදහස් හා ගුරු අදහස් එක්වූ
සංවර්ධනාත්මක නිබන්ධනයක් සිසුන්ට දෙන්න.

පැවරුම : රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල දක්නට
ලැබෙන ප්‍රජාතන්ත්‍රීය ලක්ෂණ ඉදිරිපත් කෙරෙන
ගොනුවක් සකස් කරන්න.

**මූලාශ්‍රය** : මහා වංශය
ලක්දිව බුදු සමයේ ඉතිහාසය - වල්පොල රාහුල හිමි
පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය - ඊ.ඩබ්. අදිකාරම්
ලක්දිව පාලි සාහිත්‍යය - ජී.පී. මලලසේකර
බෞද්ධ ශිෂ්ටාචාරයේ මූලධර්ම හා වංශ කථාව - චන්දිම
විජේබණ්ඩාර

**නිපුණතාව 9.0** : විවිධ රටවල බෞද්ධ උරුමය ගවේෂණය කරමින් බුදු සසුනේ අනාගත විරස්ථිතිය පිළිබඳව සංවේදීව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 9.1** : බුරුමයට (මියන්මාරයට) සියමට (ථායිලන්තයට) බුදු සමය හඳුන්වාදීම සහ ඒ රටවල සංස්කෘතිය බුදු සමයෙන් ලද පෝෂණය පිළිබඳ ගවේෂණය කරයි.

**ඉගෙනුම් ඵල** :
- බුරුමයේ , ථායිලන්තයේ බෞද්ධ සංස්කෘතියෙහි ඇති විශේෂතා අගය කරයි.
- බුදුසමයේ සංවර්ධනයට බුරුම හා ථායිලන්ත රජවරුන් දැක්වූ අනුග්‍රහයන්හි වැදගත්කම පැහැදිලි කරයි.
- බුරුම හා ථායිලන්ත සංස්කෘතිකාංග ශ්‍රී ලාංකික සංස්කෘතිකාංග හා සසඳමින් දැනුවත් වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 24

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

9.1.1 : බුරුමයට (මියන්මාරයට) බුදු සමය හඳුන්වා දීම සහ එරට සංස්කෘතිය බුදු සමයෙන් ලද පෝෂණය

- පැරණි පතපොත බුරුම දේශය හඳුන්වා ඇත්තේ බ්‍රහ්ම දේශය යන නමිනි. බුරුමයේ බෞද්ධ ඉතිහාසය ගැන කරුණු සෙවීමේදී මතවාද දෙකක් ගැන අවධානය යොමු කළ යුතුවේ. එනම් ඓතිහාසික තොරතුරු හා ජනප්‍රවාද තොරතුරුය.
- බුරුම ජන ප්‍රවාද අනුව මොන් (MON) ගෝත්‍රික තපස්සු - භල්ලුක වෙළඳ දෙබෑයන් බුදුරදුන්ගෙන් ලබාගත් කේශ ධාතු තැන්පත් කර බුරුමයේ සිංගුත්තර කඳු මුදුනේ ස්තූපයක් ගොඩ නගන ලද අතර වර්තමානයේ එය ශ්වේදගොන් (Shwe Dagon ) චෛත්‍යය නමින් හැඳින්වෙයි. බුදුරදුන් ජීවමාන කාලයෙහි බුරුමයට වැඩම කළේයයි එරට බෞද්ධයෝ විශ්වාස කරති.
- ඓතිහාසික කරුණු අනුව ක්‍රි.ව. 1044 සිට 1077 දක්වා වූ කාලයේ - එනම් අනුරුද්ධ රාජ සමයේදී ථෙරවාද බුදු දහම බුරුමයේ හෙවත් මියන්මාරයේ ස්ථාවරත්වයට පත්විය.
- මියන්මාරය හෙවත් බුරුමය අතීතයේ සුවණ්ණ භූමි ලෙසින් ද හැඳින්විනැයි සැලකෙන අතර නවරට සසුන් පිහිටුවීමේදී ක්‍රි.පූ. 350 දී පමණ සෝණ උත්තර හිමිවරුන් විසින් සුවණ්ණ භූමියට බුදුසමය හඳුන්වාදෙන ලදැයි දීප වංසාදී ශ්‍රී ලංකා වාර්තාවන්හි සඳහන් වේ.
- ක්‍රි.ව. 250 දී පමණ ශ්‍රී ලංකාවෙන් ගිය භික්ෂු කණ්ඩායමක් විසින් බුරුමයේ බුදුදහම සංස්ථාපිත කළේයයි ද මතයකි.
- ක්‍රි.ව. 5 වන සියවසේ සිට ශතවර්ෂ ගණනක් බුරුමයේ ප්‍රෝම් (Prome ) සහ හිමව්ෂා ( Hmawza ) ආදී නගරවල බුදු සමය සමෘද්ධිමත්ව පැවති බවට පුරා විද්‍යාත්මක සාධක ඇත. එකොළොස්වන සියවසට පෙර පේග ( Pega) - හංසවතී, ථඨෝන් ( Thaton - සුධම්මවතී) යන රාජ්‍ය දෙකෙහි ථෙරවාද බුදු සමය ව්‍යාප්තව පැවතියේය.

- බුරුමයේ බෞද්ධ ඉතිහාසය පිළිබඳ විවිධ මතභේද පවතී. කෙසේ වුවද ක්‍රි.ව. 11 වන සියවසේදී ස්ථිර වශයෙන් ම බුදු සමය බුරුමයේ ස්ථාපිත වූයේ යැයි පිළිගැනේ. පගාන් නුවර බෞද්ධ සංස්කෘතියේ කේන්ද්‍රස්ථානය ලෙස එම යුගයේ ක්‍රියාත්මක විය.
- බුරුමයෙහි විහාරස්ථානය අධ්‍යාපන මධ්‍යස්ථානය වූ අතර එරට කලාශිල්ප, උත්සව ආදී සංස්කෘතික ක්ෂේත්‍රයන් බුදු දහමින් පෝෂණය විය.
- භූගෝලීය වශයෙන් විශාල භූමි ප්‍රදේශයක විසිරගිය විවිධ කුල ගෝත්‍රවලට අයත් සියලු දෙනා බුදු සමයේ ආලෝකයෙන් කුල ගෝත්‍ර අතහැර මිත්‍රශීලීව වාසය කරති.

9.1.2 බුදුසමයේ සංවර්ධනයට බුරුම රජවරුන්ගෙන් ලැබුණු අනුග්‍රහය

- ක්‍රි.ව. එකොළොස්වන සියවසේ අනව්රථ (Anawratha) හෙවත් අනුරුද්ධ රජතුමා එරට බුදු සමයේ පෝෂණයට හා සංවර්ධනයට සුවිශාල මෙහෙයක් කළ බව සහ එය බුරුම බුදුසමයේ ස්වර්ණමය යුගය පිළිගැනේ.
- අනවරත රජතුමා උත්තරාජීව හා ජප්පට භික්ෂූන් වහන්සේලා ලංකාවට එවා විනය හා බෞද්ධ සංස්කෘතිය හැදෑරීමට අවස්ථාව සලස්වා ඇත. එහි ප්‍රතිඵලය වූයේ ජප්පට හිමි වසර දහයක් පමණ ලංකාවේ වාසය කොට , ධර්ම විනය උගෙන බුරුමයට ගොස් "සීහල සංඝ" නම් නිකායක් බිහි කිරීමයි. එතෙක් බුරුමයේ පැවතුනේ මරම්ම නිකාය පමණකි.
- අනවරත රජුගෙන් පසු රජ පැමිණි ඔහු පුත් කෙයාංසිත්ට ක්‍රි.ව. 1084 සිට 1113 දක්වා පාලනය ගෙන ගියේය. මෙතෙම ඉන්දියාවේ බුද්ධගයා විහාරයේ සංවර්ධන කටයුතු සඳහා දූත පිරිසක් යවා ඇත. මේ වකවානුවේ බුරුමයේ සෑම කඳු මුදුනකම පාහේ විහාර ඉදිවී ඇත.
- ක්‍රි.ව. 15 සියවසේ රජවූ ධම්මචේතිය රජතුමාගේ රාජ්‍ය කාලය වසර 30කි. ඔහු කුඩා කල පැවිදි වී සිටි අයෙකි. බුරුමයේ ඒ කාලයේ සිට සියලුම නිකායයන් රැස් කර ඒවායේ සියලුම භික්ෂූන් නැවත මහණ කර ඇත. කල්‍යාණි ශිලා ලිපිවල නිර්මාතෘවරයා වන්නේද මේ රජතුමාය.
- බුරුමයේ බෝදෝපයා (Bodawpaya) රජතුමා බෞද්ධ පොත් පත් ඉන්දියාවෙන් ගෙන්වා ගෙන බුරුම භාෂාවට පරිවර්තනය කරවා රාජ්‍ය පුස්තකාලයේ තැන්පත් කරවීය.
- බුරුමයේ මින්ඩොන් මින් රජු ක්‍රි.ව. 1871 දී මණ්ඩලේ නුවරදී ධර්ම සංගායනාවක් කරවා ඇත. භික්ෂූන් වහන්සේලා 2200ක් සහභාගි වී ඇත. පස්වන සංගායනාව ලෙස හැඳින්වෙන මෙම සංගායනාවෙන් පසු කිරිගරුඬ ලෑලි 729ක ත්‍රිපිටකය ලියවා ලෝක මා රජින දාගැබ වටේ තැන්පත් කරන ලදී.

- ක්‍රි.ව. 1954 - 1956 කබායේ නුවර පැවැති සයවැනි සංගායනාව සඳහා ද මූලාශ්‍රය වූයේ ඉහත කිරිගරුඬ පුවරුවල ලියා තිබූ ත්‍රිපිටක ධර්මයයි.

- වර්තමානයේ රජය මගින් ව්‍යවස්ථාපිත බුද්ධ ශාසන කවුන්සලයෙන් බෞද්ධ සංස්කෘතික කටයුතු සඳහා නිසි පියවර ගනු ලැබේ.

- භූගෝලීය වශයෙන් විශාල භූමි ප්‍රදේශයක විසිරිගිය විවිධ කුල ගෝත්‍රවලට අයත් සියලු දෙනා බුදු සමයේ ආලෝකයෙන් කුල ගෝත්‍ර අතහැර මිත්‍රශීලීව වාසය කරන දේශයකි බුරුමය.

9.1.3 සියමට (ථායිලන්තයට) බුදු සමය හඳුන්වාදීම සහ බුදු සමයෙන් ලද පෝෂණය

- තෙවන ධර්ම සංගායනාවෙන් පසු නවරට සසුන් පිහිටුවීමේදී සුවණ්ණ භූමියට වැඩම කළ සෝණ උත්තර හිමිවරුන් ථායිලන්තයටද බුදු සමය හඳුන්වා දෙන ලදැයි එරට වාසීන් ගේ පිළිගැනීම වේ.

- ථායිලන්තයේ (සියම) බුදු දහම ව්‍යාප්තිය පිළිබඳ අවස්ථා 4ක් දැකගත හැකිය. එහි පළමු අවස්ථාව ක්‍රි.පූ. 329 දී නකොම් පටොම් නගරය ආශ්‍රය කර බුදු දහම පැතිරයාමය. ක්‍රි.ව. 700 දී පමණ පලම්බාන් රජුගේ අනුග්‍රහයෙන් මහායාන බුදු දහම ව්‍යාප්තවූ කාලය දෙවන වකවානුවයි. තෙවන අවස්ථාව බුරුමයේ රජුවූ අනවරත රජුගේ කාලය තුල සියමේ ඇතිවූ බුදු දහමේ ව්‍යාප්තියයි. අවසාන නැතිනම් හතරවන අවස්ථාව වන්නේ ලංකාවෙන් දහම් උගෙන නැවත ථායිලන්තයට වැඩි තායි භික්ෂූන්ගේ උද්‍යෝගී ක්‍රියාකාරකම්ය.

- චීනය සමඟ පැවති සම්බන්ධතා හේතුවෙන් ථායිලන්තයට මහායාන බුදු දහම ලැබෙන්නට ඇතැයි සිතිය හැකිය.

- ක්‍රි.ව. 1941 ඇතිවූ දේශපාලන ගැටුමෙන් පසු බෞද්ධ භික්ෂු සංස්ථාවේ ප්‍රධානියා හැටියට සඟරජ තනතුරක් ඇති කරන ලදී. භික්ෂූන් වහන්සේ පිළිබඳ සැම විනය - පාලන කටයුත්තක්ම කරනු ලබන්නේ සඟරජ හිමිගේ ප්‍රධානත්වයෙනි. සඟරජ හිමිට උපදෙස් දීම සඳහා 45 දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් (සංඝ සභාවක්) පිහිටුවා ඇත. ථායිලන්තයේ විහාර ඉදිකිරීම හා කුල දරුවන් පැවිදිකිරීම සඳහා රජයේ අවසර ලැබිය යුතුය.

- ථායිලන්තයේ ඇත්තේ සියම් නිකාය පමණකි. එම නිකායේ කොටස් දෙකක් පවතී. ඒ "ධම්ම යුත්තික නිකාය "හා "මහා නිකායයි." සියම් නිකාය දෙකඩ කරන ලද්දේ මොන්කුත් රජතුමා විසිනි. එයින් අපේක්ෂා කළේ විනය නීති දැඩි ලෙස පවත්වා ගැනීමට පෙළඹවීමයි.

- පොංටක් ( PONGTUK ) සහ ප්‍රාපධෝන් ( PHRAPATHOM) යන ථායිලන්ත ඓතිහාසික භූමිවලින් සොයාගන්නා ලද බුදු පිළිම සහ ධර්ම චක්‍ර ආදී පුරා විද්‍යාත්මක සාධක මගින් ක්‍රි.ව. 2වන සියවසේ හෝ ඊට පෙර බුදු සමය සමෘද්ධිමත්ව පැවතියේ යැයි තහවුරු වී ඇත.
- ක්‍රි.ව. 7වන සියවසේ ද්වාරවතී ( Dvaravati ) රාජ්‍යයේ බුදු සමය සමෘද්ධිමත්ව පැවතියේ යැයි හියුංසියැං වාර්තාකර ඇත. එම ද්වාරවතිය වර්තමාන සියමට අන්තර්ගත වේ.

9.1.4 : බුදුසමයෙහි සංවර්ධනයට ථායිලන්ත රජවරුන්ගෙන් ලැබුණු අනුග්‍රහය

- ථායිලන්ත ඉතිහාසයේ සඳහන් සුඛෝදය (සුඛෝථායි) අයෝධ්‍යා (අයුථියා) සහ බැංකොක් යන රාජධානිවල ආරම්භයේ පටන්ම බුදු සමය රාජ්‍ය ආගම බවට පත්වූ අතර සියලු රජවරුන් බුදු සසුනේ ආරක්ෂකයන් ලෙස ක්‍රියා කොට ඇත.

- මොන්කුත් රජතුමා ධම්මයුක්තික නිකාය හා මහා නිකාය වශයෙන් සියම් නිකාය කොටස් දෙකකට බෙදා දැඩි විනය ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නට භික්ෂූන් පොළඹවා ඇත.
- අතිශය සැදැහැවතුන් වන තායි ජනතාව, විහාරස්ථාන සිත් සතන් සනහාලන පරම පූජනීය ක්ෂේමභූමි සේ සලකන අතර රජු ඇතුලු සියලු පිරිමින් ටික දිනක් හෝ පැවිදිව සිටිය යුතු යැයි පිළිගැනීමක් පවතී.
- බෞද්ධ ආභාසය නිසා ථායි ජනතාව තුළ ආගන්තුක සත්කාරයෙහි ලැදි, ඉවසන සුළු , ආචාර සම්පන්න සංස්කෘතියක් ගොඩ නැගුණ අතර ධාර්මික විනෝදාස්වාදයක් ලබන කඨින උත්සවය ආදී බෞද්ධ උත්සව ඉතා හරසරින් පවත්වනු ලැබේ.
- එරට භාෂාව, සාහිත්‍යය, චිත්‍ර මූර්ති හා කලා මාධ්‍යයන් බුදු සමයෙන් පෝෂණය වී ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :පියවර 1

මියෙන්මාරයේ හා ථායිලන්තයේ දර්ශන ඇතුළත් පිංතූර (හැකිනම් සංයුක්ත තැටි මගින් ) කිහිපයක් සිසුන් අතර පත්කර තොරතුරු සාකච්ඡා කරන්න.

පියවර 2

මියෙන්මාරයේ හා ථායිලන්තයේ ආගමික සංස්කෘතික දියුණුව පිළිබඳව - බෞද්ධාගමික බලපෑමත්, ඒ සඳහා එරට රජවරුන්ගෙන් ලත් අනුබලයත් පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.

පියවර 3

සිසුන් ලවා අදාළ රටවල තොරතුරු රැස්කරවන්න.

පියවර 4

සිසු තොරතුරු හා ගුරු තොරතුරු සමඟ සිසුන්ගේ විෂය දැනුම තහවුරු වන පරිදි අභ්‍යාසයක යෙදෙන්න.

පැවරුම : මියන්මාරයේ හෝ තායිලන්තයේ බෞද්ධ සංස්කෘතිය තේමා කොට පන්තිය ඉදිරියේ දේශනයක් පවත්වන්න.

**ඉගෙනුම් සම්පත්** :

සංක්ෂිප්ත ලෝක බෞද්ධ සංස්කෘතිය - වැල්ලවත්තේ ආනන්ද හිමි
ටී.බී. කාන්ගහ ආරච්චි

තායිලන්ත බෞද්ධ සංස්කෘතිය - බෝයගම විමලසිරි හිමි

සියම් ශ්‍රී ලංකා ආගමික සම්බන්ධතා- ජ. හේමපාල විජයවර්ධන
පී.බී. මීගස්කුඹුර

දෙදහස් පන්සිය වසරක බොදු සමය - වී.පී. බාපත්
(පරිවර්තනය - පද්මා ගුණසේකර)

**නිපුණතා මට්ටම 9.2** : ශ්‍රී ලාංකික බෞද්ධ සම්බන්ධතා බුරුමය (මියන්මාරය) සියම (ථායිලන්තය ) සමඟ ගොඩ නැංවූ අයුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : 10

**ඉගෙනුම් ඵල** :

- මියෙන්මාරය හා ථායිලන්තය නිසා ලංකාවට උරුම වූ ශාසනික දායාද අගය කරයි.
- විදේශයන්ගෙන් උරුම වූ ශාසනික උරුම රැකගැනීමට දායක වෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

9.2.1 : බුරුමය (මියෙන්මාරය) හා සියම (ථායිලන්තය) සමඟ පැවති ශ්‍රී ලාංකීය බෞද්ධ සබඳතා

- අනව්රථ ( Anawratha ) රජතුමා දවස ශ්‍රී ලංකාවේ පළමුවන විජයබාහු රජු බුරුමයෙන් භික්ෂූන් ගෙන්වා ලංකාවේ ශාසන සංශෝධනයක් කිරීම, අනවරථ රජු ත්‍රිපිටකය සහ දළදා ආකෘතියක් ගෙන්වා ගැනීම, ලක්දිව මහා පරාක්‍රමබාහු රජු දවස බුරුමයේ උත්තරා ජීව හා ජප්පට හිමිවරුන් ලංකාවට පැමිණීම සහ බුරුමයේ සීහළ සංඝ නිකාය ආරම්භ කර ඇත.
- 15 වන සියවසේ බුරුමයේ ධම්මචේතිය රජු දවස උපසම්පදාව ලබා ගැනීම පිණිස භික්ෂු පිරිසක් ලංකාවට පැමිණීම, ශ්‍රී ලංකා අමරපුර නිකායට අයත් විවිධ ශාඛාවන් හා රාමඤ්ඤ නිකාය පිහිටුවීම සඳහා මෙරට භික්ෂූන්ට බුරුමයේ දී උපසම්පදාව ලබාදීම, ශ්වේජින් නිකාය ආරම්භ කිරීම, ජට්ඨ සංගායනාව පැවැත්වීම ආදී සිද්ධීන් බුරුම - ශ්‍රී ලංකා බෞද්ධ සම්බන්ධතා පිළිබඳව වැදගත් වන කරුණු වේ.
- 13 වන සියවසේ I පරාක්‍රමබාහු රජු දවස අද්භූත බලැති බුද්ධ ප්‍රතිමාවක් ථායිලන්තයට යැවී යැයි ජිනකාලමාලිනියේ සඳහන්වීම, 18 වන සියවසට පෙර කිහිපවිටක් උපසම්පදා ආදී කටයුතු සඳහා භික්ෂු පිරිස් යාම ඒම සහ 18 වන සියවසේ දි වැලිවිට සරණංකර මාහිමියන්ගේ මෙහෙයවීමෙන් සියම් උපාලි හිමි ප්‍රධාන භික්ෂු පිරිස මෙහි පැමිණ ශ්‍යාමෝපාලි නිකාය ඇති කිරීම ආදී ඓතිහාසික සිද්ධීන් රැසක් ථායිලන්තය හා ශ්‍රී ලංකාව අතර සිදුවිය. ඒවා දෙරටේම බුදු දහමේ හා සංස්කෘතියේ පෝෂණයට ඉවහල් විය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය** :

පියවර 1 බුරුමයේ (මියන්මාරයේ ) සියම (ථායිලන්තයේ) මෙතෙක් උගත් කරුණු පිළිබඳව සමාලෝචනයක යෙදෙමින් පාඩමට පිවිසෙන්න.

පියවර 2 වර්තමාන ආගමික ප්‍රබෝධය සඳහා නිර්දිෂ්ට රටවලින් ලැබුණ සහාය කෙබඳු දැයි සිසුන් විමසන්න.

පියවර 3 මූලාශ්‍රය ආධාර කොට කරුණු රැස්කරන්නට හා වාර්තා කරන්නට සිසුන් යොමු කරන්න.

පියවර 4 සිසුන් රැස්කළ කරුණු සංවර්ධනාත්මකව සාකච්ඡා කරමින් අදාළ පරිදි සටහනක් සිසුන්ට ලබා දෙන්න.

පැවරුම : බුරුමයෙන් හා තායිලන්තයෙන් ශ්‍රී ලංකාවට ලැබුණු සංස්කෘතික දායාද ලැයිස්තු ගත කර දක්වන්න.

**මූලාශ්‍රය** :ආසියාවේ බෞද්ධ ඉතිහාසය - මංගල ඉලංගසිංහ
සංක්ෂිප්ත ලෝක බෞද්ධ සංස්කෘතිය - වැල්ලවත්තේ ආනන්ද හිමි
ටී.බී. කාන්ගහ ආරච්චි
ථායිලන්ත බෞද්ධ සංස්කෘතිය - බෝයගම විමලසිරි හිමි
සියම් ශ්‍රී ලංකා ආගමික සම්බන්ධතා - ජ්.හේ මානල විජයවර්ධන
පී.බි. මීගස්කුඹුර
දෙදහස් පන්සියවසරක බොදු සමය - වී.පී. බාපත්
(පරිවර්තනය - පද්මා ගුණසේකර)
බුරුම බෞද්ධ සංස්කෘතිය - වැලිමඩගම කුසලධම්ම හිමි
බෞද්ධ ශිෂ්ටාචාරයේ ව්‍යාප්තිය - උඩුගම සුමංගල හිමි
යටියන විමලබුද්ධි හිමි

**නිපුණතා මට්ටම 9.3** : ජපානයට, චීනයට බුදු සමය හඳුන්වාදීම සහ එම රටවල සංස්කෘතිය බුදු සමයෙන් ලද පෝෂණය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද** : 24

**ඉගෙනුම්ඵල** :

- චීන බෞද්ධ සංස්කෘතියේ විශේෂතා අගය කරයි.
- ජපාන බෞද්ධ සංස්කෘතියේ විශේෂතා අගය කරයි.
- චීන සහ ජපන් සාරධර්මයන්හි ආදර්ශ ලබා ගනියි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

9.3.1 : ජපානයට බුදු සමය හඳුන්වාදීම සහ ජපාන සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ අයුරු

- ජපානයේ ප්‍රාග් බෞද්ධ ඇදහිලි අතර ෂින්ටෝ ආගම ප්‍රධාන වූ අතර මළවුන් ඇදහීම හා භූත විශ්වාස වැනි නොදියුණු ගෝත්‍රික පිළිගැනීම් ද විය. මෙහිදී මළවුන් දේවත්වයෙන් සලකා ඇත. මේ පිළිගැනීම් වලට අමතරව කොන්ෆියුසියස්ගේ ඉගැන්වීම් ද භාවිත විය.
- ක්‍රි.ව. හයවෙනි සියවසේ ජපානයේ කිම්මෙයි ( Kimmei) අධිරාජ්‍යයාගේ සමයේ දී ශාක්‍යමුනි බුද්ධ ප්‍රතිමාවක් සහ ඇතැම් මහායාන සූත්‍රවල පිටපත් රැගෙන කොරියන් අර්ධද්වීපයට අයත් කුදර (Kudara ) රාජ්‍යයේ පාලකයා විසින් පිටත් කරන ලද දූත පිරිස මගින් නිල වශයෙන් ජපානයට බුදු සමය හඳුන්වා දුන් බව පිළිගැනේ.
- ජපන් අධිරාජයා යටතේ එරට පාලන කටයුතු සිදුකළේ මොනොනොබේ, නකතොමි සහ සොග යන වංශ තුනට අයත් අමාත්‍යවරුන් ය. මෙයින් මොනොනොබේ හා නකතොමි යන වංශිකයෝ රාජ්‍ය පාලකයන් හා බැඳුන ෂින්ටෝ ආගමට පක්ෂපාත වූහ. සොගවරු එක්වූයේ බෞද්ධ ධර්මයටය. මේ නිසා ඔවුනොවුන් අතර ආගමික මත මුල් කරගත් ගැටුම්ද ඇති විය. මෙකල ජපානයේ දරුණුතම නියං සායක් ඇතිවිය. බුදු දහම නිසා එය හටගත් බව මොනොනොබේ හා නකතෝමි භක්තිකයන්ගේ විශ්වාසය වූයෙන් ඔවුන් විසින් බුදු පිළිම ගඟට දමා විරෝධය පළ කරන ලදී. එම අවස්ථාව ආගමික ගැටුම්වල සුවිශේෂී අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. එහෙත් සාගතයේ අවසානයත් සමග නැවත බුදු පිළිම සඳහා වන්දනා මාන කිරීම ආරම්භ විය. ස්වභාවික ව්‍යසන පහව ගොස් රටේ සමෘද්ධිමත් කාලයක් උදාවිය. ඉන්පසු කරුණු වටහාගත් ජපන් ජනතාව බුදු දහමට අනුව කටයුතු කරන්නට පටන් ගත්හ.

- සොග (Soga) වංශය සහ බුදු දහම නොපිළිගත් මොනොනොබෙ ( Mononobe ) වංශය අතර දශක හතරක පමණ කාලයක් බුදු සමය ජනතාව අතර ව්‍යාප්ත කිරීම සම්බන්ධව යුද්ධයක් පැවති අතර අවසානයේ සෝගා වංශය ජයගැනීමත් සමඟ බුදු දහම ව්‍යාප්ත වීම සිදුවිය.

- ජපන් බෞද්ධ ඉතිහාසය මූලික වශයෙන් නර (Nara ) හෙයියන් ( Heian ) සහ කමකුරා (Kamakura ) යනුවෙන් යුග තුනකට බෙදා දැක්විය හැකි අතර මෙම කාලය තුළ මහායාන ඉගැන්වීම් මත පදනම් වූ නිකාය රාශියක් හා ඇතැම් හීනයාන නිකායයන් ද ජපානය තුළ ව්‍යාප්ත විය.

- ක්‍රි.ව. 592 දී අධිරාජ්‍ය ධූරයට පත් සුයිකො අධිරාජිනියගේ ( Suiko) යුවරජු වූයේ ෂොතොකු තයිෂි (592 - 622) කුමරුය. ඔහුගේ කැපවීම මත ජාතික සමගිය ඇතිකර ලීම සඳහා බෞද්ධාගම කෙරෙහි ගරු සැලකිලි දැක්වීමේ වැදගත්කම පෙන්වා දුන්නේය. මේ අනුව සීඝ්‍ර දියුණුවක් සඳහා ජපානය යොමුවූයේ නාරා ප්‍රදේශය මුල් කොටගෙන නිසා නාරා යුගයක් ලෙසින් නම් කර ඇත. ෂොතොකු තයිෂි දෙවැනි අශෝක ලෙස ජපානයේ පිළිගනී.

- හෙයියන් යුගය ආරම්භවන්නේ 8 සියවසේ අවසාන භාගයේය. එසේ වන්නේ නාරා නගරය වෙනුවට කියෝතෝ නගරය අගනුවර වීමෙනි එකල අධිරාජයා වූ කම්මු (Kammu) අනුග්‍රහය භික්ෂූන්ට ලැබිණ. තරුණ භික්ෂු දෙනමක් වූ සයිචෝ (Saicho) සහ කුකයි (Kukai) හිමිවරුන් චීනයට ගොස් නැවත පැමිණ තෙන්දයි නිකාය සහ ෂින්ගොන් නිකාය යන නම්වලින් බෞද්ධ සම්ප්‍රදායයන් දෙකක් ආරම්භ කරන ලදී. එතැන් පටන් නාරා යුගයට වඩා වැඩි දියුණුවක් ජපානයේ ඇතිවිය. එහිදී චීන සංස්කෘතිය හා ජපාන සංස්කෘතිය මිශ්‍ර විය. ෂින්ටෝ දෙවිවරුන් හා බෞද්ධ බෝධිසත්ව සංකලනයක් සිදුවී ආගමික සහනශීලීතාවක් ඇතිවිය. මේ සඳහා මූලිකත්වය ගත්තේ කොරියානු ජාතික භික්ෂූන්ය. මේ වකවානුවේ ජපානයේ පැතුරුණු වසංගත රෝගයෙන් ජනතාව බේරාගැනීම සඳහා වෛරෝචන බුදුන්ගේ ප්‍රතිමාවක් නිර්මාණය කරන්නට අධිරාජයාට යෝජනා ඉදිරිපත් විය. මේ නිසා දර්ශනීය ප්‍රතිමා ආදියෙන් සම්පූර්ණ වූ සංස්කෘතික කලාගාරයක් කියෝතෝ නගරය කේන්ද්‍ර කොටගෙන බිහිවිය.

- කමකුරා (Kamakura) යුගයේ ප්‍රචලිත වූ නිකායයන් කිහිපයකි. ඒවා කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. හෝනෙන් ෂෝනින් විසින් හඳුන්වාදෙන ලද ජෝදෝ නිකාය හා ඔහුගේ ශිෂ්‍ය ෂින්රන් විසින් හඳුන්වාදෙන ලද ජෝදෝ ෂින් නිකාය එක් කොටසකටත් , රින්සයි හා සෝතෝ යන Zen නිකාය දෙක දෙවන කාණ්ඩයටත්, නිචිරෙන් විසින් හඳුන්වාදෙන ලද නිචිරෙන් නිකාය හෙවත් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර නිකාය තෙවන කාණ්ඩයටත් ඇතුළත් කළ හැකිය.

- ජෝදෝ සහ ජෝදෝ ෂින් දෙනිකාය සඳහා පදනම් වූයේ සුඛාවතී ව්‍යුහ සූත්‍රයයි. නෙම්බුත්සු හෙවත් අමිතාභ බුදුන්ට නමස්කාර කරමින් කරනු ලබන සජ්ඣායන පාඨය (නමු/අමිද/බුත්සු) නිරන්තරයෙන් භාවනාවක් ලෙසින් මැතිරීම සුඛාවතියේ උප්පත්තියට මග ලෙස මොවුන් විසින් සලකන ලදී.
- Zen නිකායයන්ගේ ප්‍රමුඛ ඉගැන්වීම Zazen යනුවෙන් හඳුන්වන භාවනාවයි. භාවනා කිරීමෙන් ක්‍රමිකව හෝ ක්ෂණිකව බුද්ධත්වයට පත්විය හැකි බව මොවුන්ගේ ඉගැන්වීම විය. එම බුද්ධත්වය සතොරි නමින් හැඳින්වේ.
- නිචිරෙන් නිකායේ ඉගැන්වීම වූයේ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය බුදුරදුන්ගේ වැදගත්ම දේශනාව බවයි. ඒ අනුව " නම්යෝ ,හෝරෙන්,ගෙක්යෝ" යනුවෙන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට නමස්කාර කරන පාඨය නිරතුරුව භාවනාවක් ලෙසින් සජ්ඣායනා කිරීම සියලු ආකාරයේ ලෞකික ලෝකෝත්තර අභිවෘද්ධිය සඳහා මාර්ගය ලෙස අවධාරණය කරන ලදී.
- ජපානයේ මෙයිජි නම් යුගයක් ද වේ. එහි ආරම්භය ක්‍රි.ව. 1868 දීය. මෙකලද සාසන පරිහානිය පෙර පරිදිම විය. දෙවන ලෝක යුද්ධය හේතුවෙන් ජපානයේ පදනම දෙදරා ගියේය. එහෙත් 1952 දී ලෝක බෞද්ධ සම්මේලන සභාව ජපානයේ පැවැත්වීමෙන් පසු මෙම තත්ත්වය වෙනස්වීමට හේතුවිය.
- ජපානය තුළ විවිධ ක්ෂේත්‍රයන්හි සංවර්ධනය කෙරෙහි බුදු දහම බෙහෙවින් බලපෑවේය. කලාශිල්ප වඩ වඩාත් දියුණුවට පත්විය. ගෘහ නිර්මාණ ශිල්පය ඉතා පහළ මට්ටමක පැවති ජපානයේ චීන ගෘහ නිර්මාණ ශිල්පයේ බලපෑම මත වඩාත් දියුණුවට පත්විය.
- ලෝකයේ විශාලතම බුද්ධ ප්‍රතිමාව වූ නරා දයිබුත්සු ( Nara Daibutsu ) වැනි ප්‍රතිමාවන්ද සුවිශාල ගොඩනැගිලි සහ ආරාමයන් ද ඉදිවූ අතර එරට කලාව සහ භාෂා සාහිත්‍යය ද බුදු සමය නිසා පෝෂණය විය.
- හනමත්සුරි ( Hanamatsuri ) නම් වූ ශාක්‍යමුනි, බුදුන්ගේ උපන්දින උත්සවය, මළවුන් පිදීමට බෞද්ධ අර්ථ කථන සපයමින් ඇති වූ බොන් ( B O N ) උත්සවය තේපාන උත්සවය වැනි උත්සව බෞද්ධ උත්සව අති උත්කර්ෂවත් ලෙස පැවැත්වේ.

- ජපාන කලා ශිල්ප බුදු සමය නිසා නව මුහුණුවරක් ගැනුණි. එරට ඉකෙබනා (Ikebana) මල් කලාව ඉතාමත් ප්‍රසිද්ධය.
- නෝ කබුකි නාට්‍ය සුමියෙ චිත්‍ර හයිකු කාව්‍ය උද්‍යාන ශිල්පය ජපානයේ විශේෂිත කලා අතරට ගැනේ. මේවා බෞද්ධ ආභාෂයෙන් ගොඩනැගුණු කලා නිර්මාණ ලෙස සැලකේ.
- බෝධිසත්ව සාරධර්ම ජපන් ජන ජීවිතයට සෘජුලෙස සම්බන්ධව එරට ජනතාව අතර ධෛර්ය සම්පන්න, ආචාරශීලී ප්‍රබෝධවත් සංස්කෘතියක් ඇති කරන්නට සමත්වී ඇත.
- මහායාන බුද්ධ ධර්මය භාවිත රාජ්‍යයක් වූ ජපානයේ බෞද්ධ ආරාම විවිධ කාර්යයන් සඳහා යොදාගනු ලැබිණ. සංඝාරාම වශයෙන් ද අධ්‍යාපන මධ්‍යස්ථාන වශයෙන් ද පමණක් නොව

සෞඛ්‍ය මධ්‍යස්ථාන වශයෙන් ද භාවිතයට ගැණින. මහළු නිවාස (වැඩිහිටි නිවහන්) ලෙස වශයෙන් ද යොදාගත් අවස්ථා ද තිබේ.

- ජපාන පොදු ජන ජීවිතය ගොඩනගා ගැනීමේදී විවිධ වූ සංස්කෘතිකාංග එකතු වී ඇත. රුකඩ කලාව, නාට්‍ය කලාව, ඉකෙබනා මල් කලාව, සංගීතය, තේපාන උත්සවය, උද්‍යාන සැකසීම ඒ අතර විය.

9.3.2 බුදු සමය සංවර්ධනයට ජපාන අධිරාජ්‍යවරුන්ගෙන් ලැබුණ අනුග්‍රහය

- ෂෝතොකු තයිෂි හෙවත් උමයාදෝ ( Shotoku Taishi Umayado) කුමරු විසින් රචනා කරන ලද වගන්ති 17 කින් සමන්විත ව්‍යවස්ථාව මගින් බුදු සමය රාජ්‍ය ආගම ලෙස පත් කළේය. දේශීය ෂින්තො ( Shinto) දහම සමඟ සංකලනය වී මහායාන ඉගැන්වීම් මත පදනම් වූ ජපන් බුදු සමය ජපන් ජනතාව අතර සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූයේය.

- ෂෝතොකු (Shotoku) කුමරු විසින් විශාල වශයෙන් බෞද්ධ භික්ෂූන් චීනයට යවා චීනයේ ප්‍රචලිත මහායාන හා හීනයාන ධර්ම ග්‍රන්ථ ආදියත්, සිරිත් විරිත් හා සංස්කෘතිකාංගත් ආනයනය කළ අතර හා බුදු සමය සම්බන්ධයෙන් ප්‍රමාණික බුද්ධිමතෙකු වූ හෙතෙම මහායාන සූත්‍ර ජපන් බසට නගා ව්‍යාප්ත කරමින් ද, සුවිශාල වෙහෙර විහාර ගොඩනගමින් ද ජපන් බුදු සමයේ ස්වර්ණමය යුගය බිහි කරන ලදී.
- ඒ ඒ යුගවලදී ජපන් අධිරාජවරු වෙහෙර විහාර ගොඩනගමින්ද, විහාරස්ථාන නඩත්තුව හා පවත්වාගෙන යාම පිණිස විවිධ පරිපාලන ක්‍රම හඳුන්වා දෙමින් , භික්ෂු භික්ෂුණීන්ගේ විනය හා ශික්ෂණය පිණිස විවිධ උපදේශකවරුන් පත්කරමින් ද, මෙසේ විවිධ නයින් ජපන් ශාසනයේ උන්නතියට ක්‍රියා කළහ.

9.3.3 චීනයට බුදු සමය හඳුන්වාදීම සහ චීන සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ අයුරු.

- චීනයට බුදු දහම හඳුන්වාදීම පිළිබඳ විවිධ අදහස් පැවතියද හැන්මින්දි ( Han Ming Di) අධිරාජ්‍යයාගේ යුගයේ භාරත ධර්ම දූතයන් වූ කාශ්‍යප මාතඞ්ග සහ ධර්මරක්ෂ යන හිමිවරුන් දෙනම විසින් එරටට බුදු සමය හඳුන්වා දෙන ලදැයි යන්න පොදු පිළිගැනීම වේ.
- චීන ජනකතාවකට අනුව අශෝක රජු දවස භාරතයෙන් භික්ෂූන් 18ක් දහම් පොත් රැගෙන චීනයට පැමිණි බවත්, එකල පාලකයන් ඒ හිමිවරු සිරකර තැබූ බවත්, හදිසියේම පැමිණි රන්වන් පැහැගත් පුරුෂයකු පැමිණ සිරකොට තිබූ භික්ෂූන් මුදාගත් බව සඳහන් වේ.

- මුල් වකවානුවේ චීනයේ ප්‍රධාන ආගම් තුනක් විය. බුදු සමය හඳුන්වා දෙන අවස්ථාව වන විට චීනය තුළ තාඕ ආගම සහ කොන්ෆියුසියස් විසින් ප්‍රකාශ කරන ලද සමාජ දර්ශනයට අදාළ ඉගැන්වීම් පැවතුනි.

- මධ්‍ය ආසියාවේ සිට කුමාරජීව හිමියන් චීනයට පැමිණ බෞද්ධ සංස්කෘත ග්‍රන්ථ චීන බසට නගමින් එරට බුදු සමයේ ව්‍යාප්තියට ක්‍රියා කළ අතර පසු කාලයේ තවත් භාරතීය භික්ෂූන් කිහිපනමක් ද හියුං සියැං වැනි චීන භික්ෂූන් දපරිවර්තන කටයුතුවල නියැලුණහ.

- ක්‍රි.ව. 429 හා 433 වර්ෂවල ශ්‍රී ලංකාවෙන් ගිය භික්ෂුණීන් නිසා චීනයේ භික්ෂුණී ශාසනය ආරම්භ විය.

- ෆාහියන් භික්ෂුව ඉන්දියාව හා ශ්‍රී ලංකාවේ සංචාරය කොට ධර්ම විනය ග්‍රන්ථ එක්රැස් කොට චීනයට ගෙන ගිය බව සහ හියුං සියැං නාලන්දා විශ්ව විද්‍යාලයේ ශිල්ප හදාරා විශාල ග්‍රන්ථ ප්‍රමාණයක් රැගෙන චීනයට ගොස් පරිවර්තන කාර්යයෙහි නියැලුනේය.
- ක්‍රි.ව. 6 වන සියවසේදී භාරතයේ සිට බෝධි ධර්ම හිමියන් පැමිණ චාන්ෂෙන් ( Chan Zen) හෙවත් ධ්‍යාන සම්ප්‍රදාය මගින් චීන ජනයාගේ ආධ්‍යාත්මික ශක්තිය අවධිකළ අතර චීනය පුරා සෙන් (Zen) තියෙන්ටයි ( Tien Tai) හෙවත් සද්ධර්ම පුණ්ඩරීක සම්ප්‍රදාය, සුඛාවතී ව්‍යුහ සම්ප්‍රදාය, විනය සම්ප්‍රදාය ආදී බෞද්ධ නිකායන් බොහෝ ගණනක් ව්‍යාප්ත විය.

- භාරතය තුළ බෞද්ධ ග්‍රන්ථ විනාශ වෙද්දී ඒවායේ චීන පරිවර්තන විශාල ප්‍රමාණයක් එරටෙහි සංරක්ෂණය විය.

- තාඕ සහ කොන්ෆියුසියස් දහම මත පදනම් වූ දේශීය ආචාර ධර්ම බෞද්ධ ජන ජීවිතය හා ආචාර ධර්ම සමග සංකලනය වූ බව පෙනේ.

- චිත්‍ර, මූර්ති,කැටයම්, ගෘහ නිර්මාණ ශිල්පය වැනි කලාශිල්පවල වස්තු විෂය බෞද්ධ මුහුණුවරක් ගෙන ඒවා බෞද්ධ ආභාෂයෙන් සංවර්ධනය වූ අතර භාෂාව සහ සාහිත්‍යය බුදු දහමින් පෝෂණය විය.
- මලවුන් පිදීම බුදු දහමින් ශක්ති සම්පන්න වී බොන් (Bon) උත්සවය උත්කර්ෂවත්ව පැවැත්වූ අතර විවිධ බෞද්ධ උත්සව සංවිධානය කරන ලදී.

- ආගමික සිද්ධාන්ත පදනම් කරගනිමින් චීනයේ විවිධ බෞද්ධ නිකාය පහළ විය.

9.3.4 බුදුසමය සංවර්ධනයට චීන අධිරාජ්‍යවරුන්ගෙන් ලැබුණු අනුග්‍රහය

- සුං මිං සහ චිං යන රාජ වංශයන්හි රාජ්‍ය පාලන කාලයන්හි ෂු යුවාන් නමින් බෞද්ධ දේශනා ක්‍රමය ව්‍යාප්ත කරන ලදී.
- හැං හා ටැං රාජ වංශ පාලන කාලයන්හිදී බෞද්ධ භික්ෂූන්

වහන්සේලා හා එක්ව බෞද්ධ වචන 35000 පමණ භාෂාවට එක් කරන්නට කටයුතු කර ඇත.

- ටැං වංශ යුගයේ දී ධර්ම දේශනා ක්‍රමය ජනප්‍රිය කරවීමට කටයුතු කර ඇත.
- ටැං, සුං, යුවා සහ මිං යන යුගවල සාහිත්‍යය සඳහා විශාල මෙහෙයක් සිදුකොට ඇත.
- සුයි සහ ටැං රාජවංශ මූර්ති කලාවට උදව් ලබා දුන්නේය.
- වෙයි රාජවංශයේ අධිරාජිනියක් අමරණීය සාමයේ ආරාමය ඉදිකරවා බුදු සසුනට පූජාකර ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 ථායිලන්ත දේශය පිළිබඳ වාර්තාමය වැඩ සටහනක් ශිෂ්‍යයන්ට ඉදිරිපත් කරන්නට පහසුකම් සලසන්න.

පියවර 2 අදාළ තොරතුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න. ඓතිහාසික තොරතුරු මත ඒ ඒ දේශයන්හි බුදු සමය ව්‍යාප්ත වූ අයුරු තොරතුරු සොයන්නට සිසුන් මෙහෙයවන්න.

පියවර 3 සිසුන් රැස්කළ කරුණු සංවර්ධනය කරමින් අදාළ පරිදි නිබන්ධනයක් සිසුන්ට ලබාදෙන්න.

පැවරුම චීනයේ හා ජපානයේ බෞද්ධ සංස්කෘතික විශේෂතා වෙන් වෙන්ව වගුගත කොට පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

(නියමිත විෂය සන්ධාරය කොටස් වලට ගැලපෙන පරිදි ඉගෙනුම් ක්‍රමවේදය සකසා ගන්නට ගුරු භවතාට අවසර ඇත).

මූලාශ්‍රය


: ජපන් බුදු දහම - සනත් නානායක්කාර
ජපන් බුදු දහම හා සංස්කෘතිය - වල්පොල විමලඥාන හිමි
සංක්ෂිප්ත ලෝක බෞද්ධ සංස්කෘතිය - වැල්ලවත්තේ ආනන්ද හිමි
ටී.බී. කාන්ගහ ආරච්චි
ජපන් සංස්කෘතික ඉතිහාසය - මංගල ඉලංගසිංහ
දෙදහස් පන්සිය වසරක බොදු සමය - වී.පී. බාපත්
පරිවර්තනය පද්මා ගුණසේකර

**නිපුණතාව 10.0** : භාරතයේ හා ශ්‍රී ලංකාවේ බෞද්ධ කලාශිල්ප ඇගයීමට ලක් කරමින් ඒවා සංරක්ෂණයට හා සංවර්ධනයට දායකවේ.

**නිපුණතා මට්ටම 10.1** : භාරතයේ බුද්ධ ප්‍රතිමා හා ස්තූප නිර්මාණයට අදාළ කලා සම්ප්‍රදාය හඳුනා ගනියි.

**කාලච්ඡේද** : 12

**ඉගෙනුම් ඵල** :

- බෞද්ධ කලා කෘති සුරක්ෂිත කිරමට දායක වෙයි.
- කලා නිර්මාණ අගය කරයි, රස විඳියි.
- ඉන්දීය කලා නිර්මාණ හා බෞද්ධ කලා නිර්මාණ සසඳයි.
- කලාකෘතිවල ශ්‍රේෂ්ඨත්වය දැක්වෙන ප්‍රදර්ශන සංවිධානය කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

10.1.1 : භාරතයේ බුද්ධ ප්‍රතිමා හා ස්තූප සම්ප්‍රදාය

- භාරතයේ පැරණි කලාත්මක නිර්මාණ සියල්ලක්ම පාහේ ආගමික ස්වරූපයෙන් යුක්ත බව බෂාම් කියයි. මොහෙන්ජෝදාරා හා හරප්පා සංස්කෘතිය පරීක්ෂා කරන විට භාරතයේ දියුණු චිත්‍ර කලා හා මූර්ති තිබූ බව පැහැදිලි වේ. එසේ වුවත් භාරතීය බෞද්ධ කලා නිර්මාණ පිළිබඳව වැඩිපුර සාකච්ජා වන්නේ මෞර්ය යුගයේදීය.

- බුදුරදුන් කෙරෙහි පැවතියා වූ අතිශය ගෞරවය නිසා බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කරන්නට පසුබිම සැකසී ඇත. කෙසේ වුවත් කෝසල බිම්බ වර්ණනාවේ සඳහන් වන පරිදි කොසොල් රජු සඳුන් අරටුවකින් බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කර ඇත.
- මේ අනුව බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය බුද්ධකාලයේ දීම සිදුවු බවට සාහිත්‍යමය සාධක ඇති අතර මේ පිළිබඳව මැක්ස්මුලර්, මැක්ඩොනල්ඩ්, ජේ.එන්. බැනර්ජි, ඩබ්. එම්. විල්සන්, බොලන්සෙන් වැනි උගතුන්ගේ මත පළකර ඇත.
- බුදුරදුන්ගේ රුව මානවාකාරයෙන් නිමවීමට නොහැකි යැයි මුල් අවධියේදී පිළිගත් අතර මේ පිළිබඳ විවිධ මත පළ වී ඇත.
- ක්‍රි.පූ. 2වන සියවසේදී පමණ භාරුත්, සාංචි බුද්ධ ගයා වැනි ස්ථානවල බුදුරුව දැක්වීමට සංකේත භාවිතා කොට ඇත.
- ක්‍රි.පූ. 1 වන සියවසේදී හෝ ක්‍රි.ව. 1 වන සියවසේදී පමණ බුදුරදුන්ගේ රූපය මානවාකාරයෙන් නිර්මාණය වූ බවට පුරා විද්‍යාත්මක සාක්ෂි හමුවී ඇත.
- ක්‍රි.පූ. 1 වන සියවසේදී ගන්ධාරයේ හා මධුරාවේ මානවාකාරයෙන් බුදු පිළිමය නිමවා තිබේ.
- ගන්ධාර බුදු පිළිමය නිර්මාණය කිරමට පූර්වාදර්ශය ලෙස ග්‍රීක ඇපලෝ දෙවියාගේ රුවත්, මධුරා කලා කරුවා ඉන්දියාවේ වන්දනීයත්වයට පත් යක්ෂ රූපත් ආදර්ශයට ගෙන ඇත.

- ගන්ධාර හා මධුරා බුදුපිළිමවල එකී සම්ප්‍රදායන්ට අයත් සුවිශේෂී වෙනස්කම් රාශියක් දක්නට ලැබේ.

| ගන්ධාර පිළිමය | මථුරා පිළිමය |
|---|---|
| 1. මහා කරුණා ලීලාව දක්වයි. | ශාක්‍ය සිංහ ලීලාව නිරූපනය කරයි. |
| 2. ස්වාභාවික හිසකෙස් | හිසකෙස් කැරලි ගැසී ඇත. |
| 3. ඇස් අඩවන්ය. | නෙත් විවෘතය |
| 4. මන්දස්මිතයෙන් යුතුයි. | තොල් මහතය. කම්මුල් පිරී ඇත. |
| 5. පද්මාසනයක මදක් නැමුණු විලාශයට උෂ්රාෂයක් සහිතව නිර්මාණය කර ඇත. | පද්මාසනය මත ඍජු සිරුරකින් යුතුව උෂ්රාෂය සහිතව නිර්මාණය කර ඇත. |

- ගන්ධාර හා මධුරා බුද්ධ ප්‍රතිමා ලක්ෂණ උපයෝගී කොටගෙන දකුණු ඉන්දියාවේ අමරාවතී ප්‍රදේශයේ ක්‍රි.ව. 2,3 සියවස්වල පමණ බුද්ධ ප්‍රතිමා නිර්මාණය කර ඇත.
- අමරාවතී කලාකරුවා ගන්ධාර මධුරා කලා සම්ප්‍රදායේ ආභාෂය ලද නමුදු ඔහුටම ආවේණික ලක්ෂණද දක්නට ලැබේ.
- ගුප්ත යුගයේදී බුද්ධ ප්‍රතිමාව බුදුගුණ කැටිකොටගත් නිර්මාණයක් ලෙස පරිපූර්ණත්වයට පත්වී ඇත.
- බුද්ධ ප්‍රතිමා ආවරණය සඳහා පටිමාඝර නමින් විශේෂ කලාත්මක ගොඩනැගිල්ලක් නිර්මාණය කරන ලදී. වර්තමානයේ විහාරගෙය ලෙස හැඳින්වෙන මේ නිර්මාණය ක්‍රමයෙන් විශිෂ්ට කලාගාරයක් බවට පත්විය.
- ස්තූපය බෞද්ධයන්ගේ ප්‍රමුඛ පූජනීය සංකේතයක් වන අතර එම නිර්මාණයේ ආරම්භයද බුද්ධ කාලය තරම් ඈතට යොමුවේ. උදේනි, සාරන්දද, චාපාල, ආදී වූ චේතිය රාශියක් ගැන සඳහන් වතුදු ඒවා ස්තූප යැයි පිළිගැනීම එක එල්ලේම කළ නොහැකිය. ථූපාර්හ පුද්ගලයන් පිළිබඳව පරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් වන අතර, අගසව් දෙනම වහන්සේගේ ශාරීරික ධාතු නිධන් කර බුද්ධ කාලයේදීම චෛත්‍යය ඉදිකරන ලදැයි සඳහන් වේ.
- බෞද්ධයන් අතර ස්තූප වන්දනාව ආරම්භ වීමෙන් පසු එය මුල්කොටගත් සංස්කෘතියක් ගොඩ නැගිණ.
- සෑම බෞද්ධ රටකම විවිධ ආකාරයෙන් දක්නට ලැබෙන ස්තූපය බෞද්ධ සංස්කෘතිය බිහිකළ උසස් කලා නිර්මාණයකි.
- ස්තූපයේ ආරම්භය ප්‍රාග් බෞද්ධ යුගයේ පටන්ම පැවති බවට හා මෙය ඉන්දියාවට පමණක් සීමාවූ සංකල්පයක් නොවන බවට තොරතුරු දක්නට ලැබේ.
- ස්තූපයේ ආරම්භය පිළිබඳ පර්ගසන් , වී.ඇස්. අග්‍රමාල් ශ්මාශාන වැනි උගතුන්ගේ විවිධ මත පවතී.
- බෞද්ධ ස්තූපය පිළිබඳ සංකල්පය බුදුන් ධරමාන කාලයේ දීම පැවති බව හා එය බුදුන් වහන්සේ විසින් ද පිළිගන්නා ලද බවට බෞද්ධ මූලාශ්‍රවල තොරතුරු වලින් අනාවරණය වේ.

- පුරා විද්‍යාත්මක නටඹුන් හා වෙනත් සාධක අනුව බෞද්ධ ස්තූපයේ ආරම්භය ක්‍රි.පූ. 2 ව සියවසෙන් ඔබ්බට නොයන අතර සුංග, සාතවාහන, අශෝක, කණිෂ්ක වැනි රාජ්‍ය කාලවල විවිධ ස්ථානයන්හි ස්තූප ගොඩනගා ඇත. සාංචි, භාරහුත්, අමරාවතී, ස්තූප ඉන්දියානු කලා ක්ෂේත්‍රයේ අග්‍රගණ්‍ය නිර්මාණ ලෙස දැක්විය හැකිවේ.
- දකුණු ඉන්දියාවේ අමරාවතී, භට්ටිපොලු, ජග්ගයපේට, ඝණ්ඨශාල, නාගර්ජුනි, කොණ්ඩ වැනි ස්ථානවල දක්නට ලැබෙන ස්තූප විශේෂ ශෛලියක් අනුගමනය කරමින් නිමවා ඇති බව හා එය ආන්ද්‍රා ස්තූප ශෛලිය වශයෙන් හඳුනාගෙන ඇත.

- අමරාවතී හැර ඉන්දියාවේ අනෙක් ස්ථානවල ඇති ආන්ද්‍රා ස්තූප ශෛලියේ විශේෂතා ඇත.
- ස්තූපයෙහි සුරක්ෂිත බව සඳහා ස්තූපඝර නමින් කලා අංගයක් බිහිවූ අතර එය චෛතිය ඝරය ලෙසද හඳුන්වනු ලැබේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : පියවර 1. භාරතීය සංස්කෘතිකාංග ඇතුළත් පත්‍රිකා/සංයුක්ත තැටි වෙත සිසුන්ගේ අවධානය යොමු කරන්න.

පියවර 2 බුද්ධ ප්‍රතිමාව හා ස්තූප නිර්මාණය පිළිබඳව සිසුන්ගේ අදහස් විමසන්න.

පියවර 3 භාරතීය ප්‍රතිමා සහ ස්තූප නිර්මාණය පිළිබඳව කරුණු රැස්කරන්නට සිසුන් යොමුකොට , අනතුරුව ඒවා සංවිධානාත්මකව ගොනු කරන්නට සිසුන්ට උදව් කරන්න.

පියවර 4 විධිමත්ව සකස් කරන ලද නිබන්ධනයක් සපයන්න.

පැවරුම පන්තිය කණ්ඩායම් දෙකකට බෙදා ප්‍රතිමා කලාව හා ස්තූප නිර්මාණය පිළිබඳව කරුණු පෙළ ගස්වා බිත්ති පුවත්පතට ලිපි 2 ක් සකස් කරන්න.

මූලාශ්‍රය : නිපුණතා මට්ටම 10.2 සඳහා වන මූලාශ්‍රය භාවිතා කරන්න.

**නිපුණතා මට්ටම 10.2** : බුදුසමයේ ආභාෂයෙන් අනුරාධපුර, පොලොන්නරු යුගවල ගොඩනැගුණු බෞද්ධ නිර්මාණ සංරක්ෂණයට දායක වෙයි.

**කාලච්ඡේද** : 14

**ඉගෙනුම් ඵල** :

- ඉපැරණි සංස්කෘතික දායාද සුරකියි.
- බුද්ධ ප්‍රතිමා නිර්මාණයට යොමුවේ.
- ප්‍රතිමා කලාව පිළිබඳ ඓතිහාසික ලේඛන අධ්‍යයනය කරයි.
- වන්දනා ගමන් සංවිධානය කරයි.
- බෞද්ධ කලා ශිල්ප අගය කරමින් රැක ගැනීමට පෙළඹෙයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

10.2.1 : ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමාව හා ස්තූප

10.2.1.1 ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමාව

- බුදු පිළිමය මුලින්ම නිර්මාණය වූයේ ඉන්දියාවේ නොව ශ්‍රී ලංකාවේ බවට මත පළවී ඇති අතර වංශ කථා ගත තොරතුරු වලට අනුව ලාංකික බුද්ධ ප්‍රතිමාවේ ඉතිහාසය දෙවන පැතිස් යුගය තෙක් දිවයයි. මෙකල නිමවූ බුදු පිළිමය පිළිබඳව විවිධ විචාරක මත පවතී.
- ලංකාවේ බුද්ධ ප්‍රතිමා කලාව විෂයෙහි විවිධ සම්ප්‍රදායන් බලපා ඇති අතර එය ලාංකික කලාකරුවාගේ ස්වාධීන නිර්මාණයක් ද යන්න පිළිබඳව විවිධ මත පළවී ඇත.
- ලංකාවේ බුදු පිළිම ක්‍රම තුනකට නිර්මාණය කර ඇත. ඒවා හිඳි පිළිම, හිටි පිළිම , ඕත් පිළිම හෙවත් සැතපෙන පිළිම වේ. සමාධි පිළිමය, තොළුවිල පිළිමය හිඳි පිළිම ගණයට උදාහරණ වේ. අනුරාධපුර යුගයේ උරුසිලා කාලසිලා පටිමා ලෙස හඳුන්වා ඇත්තේ සමාධි ප්‍රතිමාව වියහැකි බවට සැක කෙරේ. ආරම්භක යුගයේ ප්‍රතිමා ගලෙන් නිමකර ඇත. බුදු සිරිතේ මහා කරුණාව අනුරපුර සමාධි පිළිමයෙන් මනාව ඔප් නැංවෙන පරිදි නිර්මාණය කර ඇත. මේවාට අමතර සැසිසේරුව, පත්කුලිය, බුදුරුවගල මාලිගාවිල ප්‍රතිමා ප්‍රතිමා කලාවේ සුවිශේෂී නිර්මාණ වේ.
- හිටි පිළිම අතර අවුකන පිළිමය ප්‍රධානවේ. මේ ප්‍රතිමාව පෙන්නුම් කරන්නේ ආශිර්වාද මුද්‍රාව බවට පිළිගැනේ. පොලොන්නරුව උත්තරාරාමයේ (ගල් විහාරය) ඇති ආනන්ද හිමියන්ගේ යයි සැලකෙන ප්‍රතිමාවද විශේෂ නිර්මාණයකි.
- ලංකාවේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය කරුවා මුද්‍රා හයක් යටතේ සිය නිර්මාණ ඉදිරිපත් කර ඇත. ඒවානම් සමාධි මුද්‍රාව (ධ්‍යාන මුද්‍රාව) අභය මුද්‍රාව , වරද මුද්‍රාව, භූමිස්පර්ශ මුද්‍රාව, විතර්ක මුද්‍රාව, ධර්ම චක්‍ර මුද්‍රාව වශයෙනි. ලංකාවේ පොලොන්නරුව පරාක්‍රම සමුද්‍රය ආසන්නයේ ඇති පරාක්‍රමබාහු ප්‍රතිමාව, ඉසුරුමුණියේ ඇති ඉසුරු මුණි පෙම් යුවළ ප්‍රතිමා නිර්මාණයේ විශිෂ්ට අවස්ථා වෙති.

- ඉන්දියාවේ සහ ලංකාවේ බුද්ධ ප්‍රතිමාවල සමානතා හා අසමානතා දක්නට ලැබෙන අතර ක්‍රි.ව. 4,5 සියවස්වල මහායාන බලපෑම් මත ප්‍රතිමා කලාවේ වෙනස්කම් ඇති විය.
- පොලොන්නරු යුගයට අයත් බුද්ධ ප්‍රතිමා අනුරපුර නිර්මාණ හා සැසඳීමේදී සුවිශේෂී බවක් ප්‍රකට කෙරේ.
- භාරතයේ මෙන්ම ශ්‍රී ලංකාවේද ප්‍රතිමාඝර බිහිවිය. ඒ මගින් ප්‍රතිමා බාහිර උපද්‍රව වලින් ආරක්ෂා කර ගැනීම අපේක්ෂා කළ අතර ඒ නිසාම අලංකාරයක් ද එක්විය.

10.2.1.2 ලංකාවේ ස්තූප

- ස්තූපය ඉදි කිරීම පිළිබඳ විවිධ මතාන්තර මුල් යුගයේ තිබිණ. සොහොන් බිම් මුල් කොටගෙන ස්තූපයේ මුල් විකාශය ඇති වූයේ යැයි මතවාද පවතී.

- මහා පරිනිබ්බාණ සූත්‍රයේ දැක්වෙන ථූපාරහ පුද්ගලයන් සිව්දෙනා මුල් කොටගෙන ස්තූප ඉදි කරවීම මුල් කාලයේ ව්‍යාප්ත විය. ලංකාවේ ස්තූප නිර්මාණයට සාංචියේ ස්තූප, තොරණ ආදියේ ආභාෂය ලැබෙන්නට ඇත. මිහිඳු හිමි ලක්දිව වැඩමවා ප්‍රථම විනය සංගායනාව කළ ස්ථානය වූ ථූපාරාමය ලංකාවේ ප්‍රථම ස්තූපයයි. මේ සඳහා දෙවන පැතිස් රජු මිහිඳු හිමියන්ගේ උපදෙස් ලබා ඇත.

- මහියංගනය, නාගදීපය, කැලණිය ආදි ස්ථානවල බුදු පාපහසින් පිරිසිදුව ස්තූප ඉදිකෙරුණ බව සඳහන් වුවද මහින්දාගමනයෙන් පසු ස්තූප නිර්මාණය වීම පිළිබඳ තොරතුරු බහුලය.

- ස්තූප ගොඩනැංවීමේදී ආකෘති 6ක් අනුගමනය කර ඇත. 1. පද්මාකාර 2. ඝන්ධාකාර 3. ධාන්‍යාකාර 4 බුබ්බුලාකාර 5. ආමලකාකාර 6. ඝටාකාර වශයෙන් හැඩතල 6ක් දක්නට ලැබේ.

- පද්මාකාර චෛත්‍ය ලංකාවේ දැනට විද්‍යාමාන නොවේ. ඝණ්ඨාකාර චෛත්‍ය ලංකාවේ වැඩිපුරම දක්නට ලැබේ. කැලණිය චෛත්‍ය ධාන්‍යාකාර චෛත්‍යයකට උදාහරණ වේ. ලංකාවේ වඩාත් ජනප්‍රිය වන්නේ බුබ්බුලාකාර හැඩගත් ස්තූපයන්ය. රුවන්මැලිසැය, මේවා අතර ප්‍රධාන වේ. ආමලකාකාර ස්තූප දැනට දක්නට නැතත් මිහින්තලේ බණ්ඨක චෛත්‍යය මේ ආකාරය ගන්නට ඇතැයි විශ්වාස කෙරේ. ඝඨාකාර චෛත්‍යයකට උදාහරණයක් ලෙස කතරගම කිරි වෙහෙර දැක්විය හැකිය.
- උත්තිය රජු ඇතුලු පශ්චාත් කාලීන රජවරුන් විසින් ස්තූප නිර්මාණය ජනප්‍රිය කරන ලදී.
- මිරිසවැටිය, රත්නමාලි, සෝමාවතී, අභයගිරි, ජේතවන ආදි සුවිශාල ස්තූප නිර්මාණය වූ අතර ස්තූපය හා බැඳුණු සාහිත්‍යයක් ද බිහි විය.
- ඉන්දීය ස්තූපය හා සැසඳීමේදී ශ්‍රී ලාංකික ස්තූපයේ සුවිශේෂතා රැසක් ප්‍රකට වේ.

- ලාංකේය ස්තූපයේ ඒ ඒ අංශවලට අදාල විවිධ අර්ථ නිරූපණ කර ඇත.බුද්ධ ධර්මයේ ස්ථිර සාර බව සිවුපසකින් දක්වන්නට මේ මගින් ක්‍රියා කොට ඇත. ඒ අනුව සුවාසූ දහසක් ධර්මස්කන්ධය අත්තිවාරම හැටියටත් , සත්තිස් බෝධිපාක්ෂික ධර්ම ගර්භය හැටියටත් , චතුරාර්ය සත්‍ය හතරැස් කොටුවෙනුත්, නවාංග සත්ථු ශාසනය කොත් කැරැල්ලෙනුත් , කොත නිවණත්, පෙන්නුම් කරන බව පිළිගැනේ.

10.2.2 චෛතියඝර, පටිමාඝර

10.2.2.1 චෛතියඝර

- ස්තූපයේ ආරක්ෂාව සඳහා ගල්කණු වලින් වටකොට ඒ මත පියස්සක් තනා ඉදිකල ගෘහය වටදාගෙය හෙවත් චෛතියඝර ලෙස හැඳින්වේ.

- මැදිරිගිරිය, තිරියාය, පොළොන්නරුව යන ස්ථානවල වටදාගෙවල් නිර්මාණය වී තිබුණ බව.
- ථූපාරාමයේ ලංකාවේ මුල්ම චෛතියඝරය ඉදිවූ අතර එය ඉදි කිරීමට දෙවන පැතිස් රජු විසින් මිහිඳු හිමියන්ගෙන් උපදෙස් ලබා ගන්නා ලදී.
- මිහින්තලේ අම්බස්ථල සෑය, ලංකාරාමය ආදී ස්ථානවලද චෛතියඝර පැවති බවට සාක්ෂි මගින් තහවුරු වී ඇත.

10.2.2.2 පටිමාඝර

- ඉදිරිපස වේදිකාවක් සහිත වූ එක් කාමරයකින් යුතුවූ ගොඩනැගිල්ලක් පටිමාඝර ලෙස හැඳින්වේ.
- ශ්‍රී ලංකාවේ පැරණි, ඉතාමත් චාම් ප්‍රතිමාඝරයකට නිදසුන් ලෙස අනුරපුර කිරිබත් වෙහෙරෙහි දක්නට ලැබෙන ප්‍රතිමාඝරය සැලකිය හැකිය.
- 4 වන සියවසට අයත් යයි සැලකෙන තරමක් වෙනස් වූ පිළිම ගෙයක් මැදිරිගිරියෙහි දක්නට ලැබේ.
- ශ්‍රී ලංකාවේ ප්‍රතිමාගෘහ , ගර්භගෘහය, අන්තරාලය, මණ්ඩපය යනාදී අංගවලින් සමන්විත ව සකසා ඇත.
- ලක්දිව ප්‍රතිමා ගෘහය ක්‍රමානුකූලව සංවර්ධනයට ද පත්ව ඇත.

- එක් කුටියකින් සමන්විත වූ ප්‍රතිමාගෘහය පියගැට පෙළ, කොරවක්ගල්, ද්වාර රූප, ඇතුන් වැනි කලාත්මක අංග එකතු කොට අලංකාර කොට ඇති බව.

- ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ කුශලතාව ප්‍රදර්ශනය කෙරෙන මෙම ගොඩනැගිලි විශේෂය පොලොන්නරුවේ ඉතා සුලභව දක්නට ලැබේ.

- පොලොන්නරු ප්‍රතිමා ගෘහ බොහොමයක් ගඩොලින් නිර්මාණය කර ඇත. තිවංක පිළිම ගෙය එවැනි නිර්මාණයකි. ප්‍රතිමාඝර ආශ්‍රිතව මුරගල්, කොරවක්ගල්, සඳකඩ පහණ ආදිය දක්නට ලැබේ. ඒ මගින් ප්‍රතිමා ගෘහයට අලංකාරයක් ලබා දී ඇත. ලංකාතිලකය, ගඩලාදෙනිය, පිළිමගෙවල් ඉතා දියුණු වාස්තු විද්‍යා ලක්ෂණ පෙන්නුම් කරයි. ඇතැම් විට ගෙඩිගේ නමින් හැඳින්වෙන නිර්මාණද ප්‍රතිමාඝර ලෙසට ඉදිකරන ලද්දක් හැටියට සැලකිය හැකි වේ.

10.2.3 සඳකඩ පහණ

- ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල සඳකඩ පහණ ගැන සඳහන් වුවත් එය ශ්‍රී ලංකාවට සුවිශේෂී වූ කලා නිර්මාණයක් ලෙස පිළිගත යුතුවේ.
- ඉන්දියාවේ පාටිකා නමින් හැඳින්වුණු සඳකඩ පහණ ලාංකිකයන් අඩ්ඩචන්ද පාසාණ, අඩ සඳ පහණ, අඩ්ඩ චන්දක පදගණ්ඨිකා යනාදී නම්වලින් හඳුන්වා ඇත.
- ඉන්දියානු සඳකඩ පහණ ශ්‍රී ලංකාවේදී සංවර්ධනයට පත්ව ඇත. ලංකාවේ ආගමික පූජනීය ස්ථානයකට ප්‍රවිශ්ට වන ස්ථානයේ මේ අද්විතීය කලා නිර්මාණය පිහිටුවා ඇත. සෞන්දර්යාත්මක හැඟීම් දැනවීමට වඩා ආගමික දාර්ශනික අරුතක් උද්දීපනය කිරීම සඳහා මේ කලාකෘතිය නිර්මාණය කර ඇති බව බොහෝ විද්වතුන්ගේ පිළිගැනීමයි.

- සඳකඩ පහණේ නිරූපිත කැටයම් තුළින් විවිධ සංකේතාර්ථ ධ්වනිත වන බවට එස්. පරණවිතාන, ඩී.ටී. දේවේන්ද්‍ර, විනී විතාරණ වැනි වියතුන් විවිධ මත පළ කොට ඇත.
- මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන් ප්‍රකාශ කරන පරිදි සඳකඩ පහණේ පිටතින්ම දැක්වෙන කැටයම ගිනි දැල්ලකි.එයින් ගම්‍ය වන්නේ ලෝකය තණ්හාව හා වෛරය නිසා නිරන්තරව ඇවිලෙන - දැල්වෙන බවයි. සංසාරයේ සත්වයා ගත කරන ගමන් කරන ජාති - ජරා - ව්‍යාධි - මරණ යන අවස්ථා සත්ව රූප මගින් පෙන්නුම් කරයි. කාම භව විභව තෘෂ්ණාත්‍රයෙන් බැඳී සසර ගතව සිටිනා සත්වයා ලියවැලින් නිරූපනය වේ. හංසයා පාරිශුද්ධ බව කරා ගමන් කරන බවකි. එනම් ගිහිගෙය හැරයාම නිරූපනය කරයි. අඩකවය මැද ඇති අඩනෙලුම කෙලෙසුන් නසා ලබන නිවණ සංකේතවත් කරයි.
- ශ්‍රී ලාංකික සඳකඩ පහණේ ඉතිහාසය මහනුවර යුගය අවසානය තෙක් ව්‍යාප්ත විය.

- අනුරපුර, පොලොන්නරු, මහනුවර යනාදී යුගයන්හි සඳකඩ පහණෙහි සුවිශේෂී වෙනස්කම් ප්‍රකට වේ. පොලොන්නරු සඳකඩ පහණේ ගවරූපය ඉවත් කෙරුනේ හින්දූන්ගේ බලපෑම යටතේය. හින්දුන්ගේ ශුද්ධ වස්තුවක් වු ගවයාගේ රූපය පෑගෙන තැනක තිබීම ඔවුන් අපහසුතාවයට පත් කරන්නක් විය. මහනුවර යුගය වන විට සඳකඩ පහණ ත්‍රිකෝණාකාර වී නිර්මාණය විය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය : පියවර 1 දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස් කන්ධා නූර්තිය සිසුන්ට අසන්නට සලස්වන්න. එහි කියැවෙන අර්ථය විමසමින් පාඩමට පිවිසෙන්න. (මේ සඳහා සුදුසු ප්‍රවේශයක් ගුරු භවතාටම තෝරා ගත හැකිවේ.).

පියවර 2

අනුරාධපුර - පොළොන්නරු - මහනුවර යුග ආශ්‍රිත බෞද්ධ සංස්කෘතික ලක්ෂණ ගැන සිසුන් විමසන්න.

පියවර 3

ඒ ඒ විෂය සන්ධාරයන්ට අවශ්‍ය විෂය තොරතුරු මූලාශ්‍රය ග්‍රන්ථ ඇසුරු කොට රැස් කරන්නට සිසුන් යොමු කරන්න.

පියවර 4

සිසුන් රැස්කළ කරුණු සාකච්ඡා කරමින් නියමිත ගොනුවකට අනුව සැකසූ දත්ත සිසුන්ට ලබා දෙන්න.

පැවරුම

අනුරාධපුර - පොලොන්නරු බෞද්ධ නටඹුන් නැරඹීමට යෑමේ චාරිකාවක් සඳහා සැලැස්මක් සකස් කරන්න.

මූලාශ්‍රය :

බුදු පිළිම - තීරණගම රතනසාර හිමි
සම්මුති 1 - උණු වතුර බුබුලේ මහින්ද හිමි
මීමුරේ ගුණානන්ද හිමි
ඒ.ඒ.ඩී. අමරසේකර
ගාමිණී විජේසිංහ
බුදු පිළිමය , මුද්‍රා සහ ආසන
බෙල්ලන්විල විමලරතන හිමි
ලක්දිව බුදු පිළිමය - කඹුරුපිටියේ වනරතන නාහිමි
ලක්දිව බුදු පිළිම - නන්දදේව විජේසේකර
ලංකාවේ ස්තූප - එස් පරණවිතාන
ස්තූප - චන්ද්‍රා වික්‍රම ගමගේ
ලංකාවේ අධ්‍යාපනය සියවස ප්‍රකාශනය - 1 කාණ්ඩය
අනුරාධපුර යුගය - අමරදාස ලියනගමගේ
රණවීර ගුණවර්ධන
ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු - චන්ද්‍රා වික්‍රම ගමගේ
නිවන්මග 18 කලාපය

**නිපුණතා මට්ටම 10.3** : ශ්‍රී ලංකාවේ භාෂා, සාහිත්‍ය, කලා ශිල්පයන්හි පෝෂණය සඳහා ලැබුණ බෞද්ධ ආභාෂය අගය කරයි.

**කාලච්ඡේද** : 16

**ඉගෙනුම් ඵල** :

- ඉපැරණි සංස්කෘතික දායාද සුරකියි.
- කාව්‍යකරණයේ යෙදෙයි, රසවිඳියි.
- බෞද්ධ හැඟීම් උද්දීපනය කරන ලිපි ලියයි.
- බෞද්ධ චිත්‍ර කලාව අගය කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

10.3.1 : සිංහල සාහිත්‍යය

- පෙළ දහමට අරුත් ඉදිරිපත් කිරීම සඳහා ගැටපද, සන්න වැනි ග්‍රන්ථ බිහි විය.

- මහා අට්ඨකථාව , මහා පච්චරිය අට්ඨ කථාව, කුරුන්දි අට්ඨ කථාව, අන්ධක අට්ඨ කථාව, සංඛේප අට්ඨ කථාව, යන මේවා සිංහලයෙන් ලියවුණ ඒවාය. බුද්ධ ඝෝෂ හිමියන් විසින් හෙළ අටුවා හදාරා විශුද්ධි මාර්ගය ලියන ලද බව සැලකෙයි.

- පාලි භාෂාව ද සිංහල භාෂාවේ හා සාහිත්‍යයේ උද්දීපනයට හේතු විය. ඒ අනුව අලංකාර , ව්‍යාකරණ, ග්‍රන්ථ බිහිවිය. සිදත් සඟරාව එහි ප්‍රතිඵලයකි. එසේම ජාතකට්ඨ කථාව, ධම්ම පදට්ඨකථාව වැනි පාලි අට්ඨකථා ඇසුරින් සිංහල සාහිත්‍යය පෝෂණය වූයේය.

- සිංහල සාහිත්‍ය පෝෂණය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය බුදු දහම සපයා ඇත. එමගින් පෝෂිත සාහිත්‍යයක් අපට ලැබිණ.
- බෞද්ධ කථා වස්තු සාහිත්‍යයක් බිහිවූ බව හා ජාතකට්ඨ කථාව මුල්කොට ජාතක පොත ද, ධම්මපදට්ඨ කථාව මුල්කොට සද්ධර්මරත්නාවලිය ලියැවීමෙන් පැහැදිලි වෙයි.

- ජාතක කථා මුල් කරගෙන පද්‍ය සාහිත්‍යයක් බිහිවිය. ඒ අතරට මුවදෙව්දාවත, සසදාවත ගී කාව්‍ය ගණයටත් කව් සිළුමිණ, කාව්‍ය ශේඛරය මහා කාව්‍ය ගණයටත්, ගුත්තිලය ඛණ්ඩ කාව්‍ය ගණයටත් ඇතුලත් වේ.
- චෛත්‍යය , දළදා වහන්සේ , මහා බෝධිය ආදී පූජනීය වස්තූන් ගේ ඉතිහාසගත තොරතුරු මත වංශ කථා සාහිත්‍යයක් බිහිවිය.
- බුදු ගුණ මුල්කොට රචනා කරන ලද ග්‍රන්ථ බිහිවූ අතර අමාවතුර, බුත්සරණ, ධර්ම ප්‍රදීපිකාව, පූජාවලිය, සද්ධර්ම රත්නාවලිය, බුදුගුණ අලංකාරය, ලෝවැඩ සඟරාව, ජාතක පොත ආදී වූ ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය කෘති නිර්මාණය වන්නේ බෞද්ධ කථා වස්තු ද තේමා කොටගෙනය. ලාංකික වංශ කතා ලියවීම ද බුදු සමයේ ආභාෂය නිසාම සිදුවූවකි. ජාතක කතා මූලාශ්‍රය කොට ගැටපද

ග්‍රන්ථ රාශියක්ම ලියවී ඇත. දම්පියා අටුවා ගැටපදය, ජාතක අටුවා ගැටපදය, බෝධිවංශ ගැටපදය ඒ අතර වෙයි. බෝධි වංශය ලියවී ඇත්තේ ශ්‍රී මහා බෝධි සංස්කෘතිය මුල්කොටගෙනය. ධාතු වංශය , දළදා වංශය, ආදිය වංශ කථා අතරට ගැනෙන අතර මහා වංශය , දීප වංශය ප්‍රධාන වංශ කතාවන් වේ.

- ජාතක කථා මෙරට ජන ජිවිතයට කර ඇති බලපෑම ඉතා විශාලය. රසෝත්පාදනය ජිවිතාවබෝධය මෙන්ම විවිධ සංස්කෘතික ආභාෂයන්ද ජාතක කථා මගින් සමාජගත විය.

- ජන සාහිත්‍යය එනම් පැල්කවි, ගාල් කවි, පතල් කවි, ගොයම් කවි, කරත්ත කවි සහිත ජන කවි සම්ප්‍රදාය බෞද්ධ පදනමක බිහිවී ඇත. සංදේශ කරණයේදී බුදු සිරිත, වෙහෙර විහාර වර්ණනයට ද අවස්ථාව සලසාගෙන ඇත.

10.3.2 කලා ශිල්ප (චිත්‍ර , මූර්ති කැටයම්)

- ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්පයන්හි ආරම්භය මහින්දාගමනයත් සමඟම සිදුවීයැයි සැලකේ.

- බුදු සිරිත, ජාතක කථා, දිව්‍ය ලෝක - අපාය විස්තර චිත්‍ර මගින් ඉදිරිපත් කර ඇති අතරසීගිරි චිත්‍ර හා හිඳගල චිත්‍ර සුවිශේෂී වේ.
- දිඹුලාගල, තිවංක පිළිමගේ, ලංකාතිලකය ආදී ස්ථානයන් හි චිත්‍ර පොලොන්නරු යුගයේ චිත්‍රවලට උදාහරණ වන අතර කණ්ඨක චේතියේ වාහල්කඩ කැටයම් ආදිය ද , මිරිස වැටියේ වාහල්කඩ කැටයම් ද ලක්දිව පැරණිම කැටයම් වලට සාක්ෂි දරයි.

- සඳකඩ පහණ, මුරගල්, කොරවක්ගල්, පුන්කලස්, මල්වැල්,ලියවැල්, වාමනරූප, සත්ව රූප ආදිය විහාර දාගැබ් ආදියට පිවිසෙන දොරටු ආසන්නයේ නිර්මාණය කර ඇත.
- ශෛලමය, දැවමය, ලෝහමය ප්‍රතිමා නිර්මාණය ඒ ඒ යුගවල සිදුවී ඇත.

10.3.3 : ලලිත කලා

- ජාතක කථා මුල් කරගත් නාට්‍ය කලාවක් ශ්‍රී ලංකාවේ ඇති විය.
- මෙරට ගීත සාහිත්‍යයේ ද බෞද්ධ ආභාෂය පෙනේ.
- ලක්දිව ජන නාට්‍යවල ද බෞද්ධ ආභාෂය දක්නට ලැබේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 1 මාතෘකාවට අදාළව පිටස්තර දේශකවරයකු ලවා පැයක පමණ දේශනයක් සිසුන් සඳහා සංවිධානය කරන්න.

පියවර 2 එම දේශනයට අදාළව තොරතුරු එක්රැස් කර ගැනීමට සිසුන් යොමු කරන්න.

පියවර 3 ගොනු කළ කරුණු ගුරු භවතා හා එක්ව නැවත සාකච්ඡා කර ලේඛන ගත කරන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.

පැවරුම සිංහල සාහිත්‍ය නිර්මාණවලට පාදක වූ බෞද්ධ මූලාශ්‍රය සොයා ලේඛනයක් සකස් කරන්න.

මූලාශ්‍රය : සිංහල සාහිත්‍ය වංශය - පුංචි බණ්ඩාර සන්නස්ගල
ලංකාවේ අධ්‍යාපනය - සියවස ප්‍රකාශනය 1 කාණ්ඩය
ලක්දිව බුදු සසුන හා මහ සඟ පරපුර - නිවන්දම ශ්‍රී ධර්මකීර්ති හිමි
බණකථා සාහිත්‍යය - මාර්ටින් වික්‍රමසිංහ
සාහිත්‍ය ලතා - කොත්මලේ අමරවංස හිමි

# 13.2 පාසල පදනම් කරගත් තක්සේරුකරණය

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදා ගතයුතු බවත් සෑම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යොන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරුණු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back ) හා ඉදිරි පෝෂණය ( Feed Forward ) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්නුම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත තහැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණු සහිතව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම්, ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේය :

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන/ඉදිරිපත් කිරීම

7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්ව නිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ජා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්, ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම සෑම ඒකක් ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට , විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

වාරය : 1

උපකරණ අංක : 1

නිපුණතාව : 6.0

නිපුණතා මට්ටම : 6.1

උපකරණයේ ස්වභාවය : කථනය

ක්‍රියාවලිය : 6.1 නිපුණතා මට්ටමට අදාළ විෂය සන්ධාරයට අදාළ විෂය කරුණු ඔස්සේ කථන නිපුණතාව වර්ධනය කිරීම.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1 ප්‍රවේශය, මාතෘකාව මැනවින් හැඳින්වීම හා එහි උචිත බව | 4 | 3 | 2 | 1 |
| 2. මාතෘකාවට අදාළව කරුණු ගොනුකොට සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම. | 4 | 3 | 2 | 1 |
| 3. විශේෂිත කරුණු ඉදිරිපත් කිරීම හා ඒවායේ ඇති සුවිශේෂී බව තහවුරු කිරීම. | 4 | 3 | 2 | 1 |
| 4. හඬ පාලනය ආංශික අභිනය හා කාල කළමනාකරණය | 4 | 3 | 2 | 1 |
| 5. කරුණු ගොනුකිරීම හා නිගමන ඉදිරිපත් කිරීම. | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | $\overline{20}$ |
| අවසාන ලකුණු $\frac{\text{ලැබූ ලකුණු}}{2}$ | | | | $\overline{10}$ |

වාරය : 1

උපකරණ අංක : 2

නිපුණතාව : 6.0

නිපුණතා මට්ටම : 6.2

උපකරණයේ ස්වභාවය : විවෘත ග්‍රන්ථ පරීක්ෂණ

ක්‍රියාවලිය : 6.2 නිපුණතා මට්ටමේ එන බුදුරජාණන් වහන්සේ පිළිබඳ තත්කාලීන ඇගයීම් විෂය සන්ධාරය ඔස්සේ කරුණු හැදෑරීම.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1 මාතෘකාව හැඳින්වීම හා විෂය කරුණු සමඟ ඇති සම්බන්ධතාවය. | 4 | 3 | 2 | 1 |
| 2. රැස් කරගත යුතු තොරතුරු තීරණය කිරීම. ඒ සඳහා යොදාගත් මාධ්‍ය හා පොත් පරිශීලනය කිරීම. | 4 | 3 | 2 | 1 |
| 3. තොරතුරුවල නිරවුල් බව නිරවද්‍යතාව හා ඒවායේ ඇති වැදගත්කම. | 4 | 3 | 2 | 1 |
| 4. තොරතුරු සංවිධානයට යොදාගනු ලබන උපක්‍රම තොරතුරුවල තර්කානුකූල බව, ක්‍රමානුකූලත්වය හා ප්‍රමාණික බව. | 4 | 3 | 2 | 1 |
| 5. කරුණු ඉදිරිපත් කිරීම හා ඒවාට හේතු දැක්වීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු $\frac{\text{ලැබූ ලකුණු}}{2}$ | | | | 10 |

වාරය : 1

උපකරණ අංක : 3

නිපුණතාව : 6.0

නිපුණතා මට්ටම : 6.3

උපකරණයේ ස්වභාවය : නිරීක්ෂණ ක්‍රියා

ක්‍රියාවලිය : 6.3 හි විෂය සන්ධාරයේ පැවිද්ද හා උපසම්පදාව පිළිබඳව තොරතුරු රැස් කිරීම.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1 නිරීක්ෂණය අරමුණු හා විෂය කරුණු හා ඇති සම්බන්ධතාව පැහැදිලි කිරීම. | 4 | 3 | 2 | 1 |
| 2. නිරීක්ෂණ අවස්ථා සංවිධානය කරගැනීම නිරීක්ෂණ සටහන් තබා ගැනීම. | 4 | 3 | 2 | 1 |
| 3. තොරතුරු සංශ්ලේෂණය හා ඡායාරූප රැස් කිරීම. | 4 | 3 | 2 | 1 |
| 4. තොරතුරුවල නිවැරදි බව හා ඒවා ඉදිරිපත් කිරීම. | 4 | 3 | 2 | 1 |
| 5. තොරතුරු ඉදිරිපත් කරන භාෂා කුසලතාවය හා ක්‍රම ශිල්ප | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු ලැබූ ලකුණු / 2 | | | | 10 |

වාරය : 2

උපකරණ අංක : 1

නිපුණතාව : 7.0

නිපුණතා මට්ටම : 7.1

උපකරණයේ ස්වභාවය : ගවේෂණ

ක්‍රියාවලිය : ශාසන ඉතිහාසය හැදෑරීමේදී මූලාශ්‍රය කර ගත හැකි ග්‍රන්ථ නාමාවලියක් සැකසීම.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1 විෂය මාතෘකාව අනුව අරමුණු ගොඩනගා ගැනීම | 4 | 3 | 2 | 1 |
| 2. සැලසුම් කිරීම සංවිධානය දත්ත රැස් කිරීමට ගන්නා ක්‍රියාමාර්ග | 4 | 3 | 2 | 1 |
| 3. දත්ත රැස් කිරීම හා ඒවායේ නිවැරදි බව. | 4 | 3 | 2 | 1 |
| 4. තොරතුරු විශ්ලේෂණය | 4 | 3 | 2 | 1 |
| 5. තොරතුරු වාර්තා ගත කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | $\overline{20}$ |
| අවසාන ලකුණු $\frac{\text{ලැබූ ලකුණු}}{2}$ | | | | $\overline{10}$ |

වාරය : 2

උපකරණ අංක : 2

නිපුණතාව : 7.0

නිපුණතා මට්ටම : 7.3

උපකරණයේ ස්වභාවය : රචනා පරීක්ෂණ

ක්‍රියාවලිය 7.3 : කණිෂ්ක රජතුමාගේ ශාසනික සේවය අදාල නිබන්ධනයක් කිරීම.

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1 මාතෘකාව හැඳින්වීම | 4 | 3 | 2 | 1 |
| 2. මාතෘකාවට අදාළව කරුණු ගොනු කිරීම | 4 | 3 | 2 | 1 |
| 3. කරුණු සංවිධානය පෙළගැස්ම | 4 | 3 | 2 | 1 |
| 4. ඉතිහාසගත තොරතුරු එකිනෙක ගැලපෙන අයුරින් ලේඛනගත කිරීම. | 4 | 3 | 2 | 1 |
| 5. මූලාශ්‍රයන්ට අදාළව තොරතුරු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| අවසාන ලකුණු $\frac{\text{ලැබූ ලකුණු}}{2}$ | | | | 10 |

| | | |
|---|---|---|
| වාරය | : | 2 |
| උපකරණ අංක | : | 3 |
| නිපුණතාව | : | 8.0 |
| නිපුණතා මට්ටම | : | 8.2 |
| උපකරණයේ ස්වභාවය | : | පැවරුම් |
| ක්‍රියාවලිය 8.2 | : | නිපුණතා මට්ටමට අදාළව රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රීය ලක්ෂණ අගයන්න යටතේ පැවරුමක් |

| නිර්ණායක | ලකුණු ප්‍රදානය | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටමට පැමිණ ඇත | | නිපුණතා මට්ටමට පැමිණ නැත | |
| 1 මාතෘකාව හැඳින්වීම | 4 | 3 | 2 | 1 |
| 2. මාතෘකාවට අදාළව කරුණු ගොනු කිරීම | 4 | 3 | 2 | 1 |
| 3. කරුණු සංවිධානය පෙළගැස්ම | 4 | 3 | 2 | 1 |
| 4. ඉතිහාසගත තොරතුරු එකිනෙක ගැලපෙන අයුරින් ලේඛනගත කිරීම. | 4 | 3 | 2 | 1 |
| 5. මූලාශ්‍රයන්ට අදාළව තොරතුරු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | $\overline{20}$ |
| අවසාන ලකුණු $\frac{\text{ලැබූ ලකුණු}}{2}$ | | | | $\overline{10}$ |